## මාසික මහ සභා රැස්වීම් වාර්තාව

| | | |
|---|---|---|
| ස්ථානය | :- | රඹුක්කන ප්‍රාදේශීය සභාව |
| දිනය | :- | 2025.09.02 |
| වේලාව | :- | පෙ.ව. 10.30 |

**සහභාගිත්වය**

ගරු සභාපති ,
1. ආර්.එම්.එස්.එස්.බි.රත්නායක මැතිතුමා

ගරු උපසභාපති ,
2.ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී/මන්ත්‍රිනී

3. වයි.ජී.ජයවීර මැතිතුමා
4. ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා
5. ඩබ්.එන්.සුරංජනී සෝමදාස මැතිතුමිය
6. පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා
7. එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා
8. එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා
9. එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා
10. කේ.සී.සරත් කුමාර මැතිතුමා
11. එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා
12. ජේ.පී.පද්මසිරි මැතිතුමා
13. එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා
14. පී.ජී.එස්.සමන් කුමාරි මැතිතුමිය
15. එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා
16. එස්.ඒ.එන්.ක්‍රිෂාන්ත සේනාරත්න මැතිතුමා
17. ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා
18. එච්.අයි.ඩී.හත්නාගොඩ මැතිතුමා
19. එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා
20. වී.ආර්.ඊ.නිසංසලා වීරබණ්ඩාර මැතිතුමිය
21. එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා
22. ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා
23. ඒ.කේ.මොහොම්මඩ් අනීස් මැතිතුමා
24. පී.ජී.මල්ලිකා මැතිතුමිය
25. ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා
26. එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා
27. පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා
28. එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා
29. කේ.පී.දුමින්ද ප්‍රේමසිරි මැතිතුමා
30. වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා
31. පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා
32. එච්.ආර්.ප්‍රදීපා රංජනී මැතිතුමිය
33. ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය
34. ඩී.ලක්ෂිත චානු සිසිර කුමාර මැතිතුමා
35. එම්.ආර්.එන්.එම්.ජයසුන්දර මැතිතුමිය
36. ඩබ්.ජී.ජයතිස්ස මැතිතුමා
37. ඩබ්.කරුණාවතී මැතිතුමිය

**නිලධාරී සහාභාගිත්වය**

❖ ආර්.ජී.එස්.නිරෝෂන් මයා - ලේකම්

**ආගම සිහිකිරීම**

රැස්වීමට පැමිණ සිටි සියලුදෙනා තම තමන්ගේ ආගම සිහිකිරීමෙන් අනතුරුව රැස්වීමේ කටයුතු ආරම්භ කරන ලදී.

**(අ).2025.08.05 දින පැවති මාසික මහා සභා වාර්තාව සම්මත කිරිම.**

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

2025.08.05 දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීම් වාර්තාව කියවූවා සේ සලකා විරෝධතා හෝ නිවැරදි කිරිම් තිබේ නම් ඉදිරිපත් කරන ලෙස ද එසේ නොමැති නම් 2025.08.05 දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීම් වාර්තාව ලියා ඇති පරිදි සභා සම්මත කරන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

සංශෝධන

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පිටු අංක 55 යටතේ මුද්‍රණ දෝෂයක් නිසා රඹුක්කන නගරයේ පොදු වැසිකිළිය ඉදිකිරිම සඳහා වන මුදල රු19,700.00 ක් ලෙස සටහන් වී ඇත.එය රු19,700,000.00ක් ලෙස නිවැරදි විය යුතු බව ගරු සභාපතිතුමා සංශෝධන යටතේ ඉදිරිපත් කරන ලදි.
පිටු අංක 50 යටතේ සඳහන් විජයමන්නාගේන ආදාහනාගාරයේ පෝරණුවේ අලුත්වැඩියා සඳහා දළ ඇස්තමේන්තුවේ වටිනාකම රු134,347.50 ක් ලෙස සඳහන් වුව ද එයට 18% ක වැට් බදු මුදලක්(රු24182.55) එකතු වීම නිසා එහි මුදල රු158,530.05 ක් ලෙස නිවැරදි විය යුතු බව ගරු සභාපතිතුමා සංශෝධනය යටතේ ඉදිරිපත් කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

තුන්වැනි පිටුවේ අන්තිම ඡේදයේ සිට තුන්වැනි ඡේදයේහි පිටු අංක 02 හි සභා වාර්තාව සම්මත කළ පසු සංශෝධන ඉදිරිපත් කළ හැකිය.අදහස් ප්‍රකාශ කිරිමට නොහැකිය.ඒ බව නොදන්නවා නම් විවාද නොකර උපසභාපතිතුමා වාඩි කර ගන්නා ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටිමි.මේ කාරණා කිහිපයෙහිම කවුරුන් විසින් ප්‍රකාශ කළා ද යනුවෙන් සටහන් වී නොමැත.ප්‍රකාශ කළේ මම යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් පවසන ලදි.ගිය සභාවාරයෙදීත් මෙසේ තිබුණ බවත්,එය කුමන හේතුවක් නිසා සිදු වේද යන්න මට ගැටළුවක් බව පවසන ලදි.සංශෝධන යටතේ මේ ප්‍රකාශය ඉදිරිපත් කරන්නේ කවුරුන්ද යන බව සංශෝධන ඇතුලේ නොමැත.මෙය ඔබතුමා දැනුවත්ව වෙනවද ? නොදැනුවත්ව වෙනවද? කියන එක මම නොදන්නා බවත්,මේ දේවල් ඇතුළත් නොවීම සභා වාර්තාවට එච්චර හොඳ නැති බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

පිටු අංක 17 හි සඳහන් ඔබතුමා හා අපි එක්කවත්,සභාව එක්කවත් තරහයෙන් නොවේ.යන ප්‍රකාශයේ ඔබතුමා නොව මෙතුමා ලෙස නිවැරදි විය යුතු බවට සංශෝධනය යටතේ ඉදිරිපත් කළ අතර මම තෙන්නකෝන් මන්ත්‍රීතුමා ගැන සඳහන් කළ බව ද ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

පිටු අංක 19 හි සඳහන් මෙම මාර්ගය ගම් සභා මාර්ගයක්ද යනුවෙන් කරන ප්‍රකාශයේ ගම් සභා මාර්ගය නොව ප්‍රාදේශීය සභා මාර්ගයක් ලෙස නිවැරදි විය යුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදි.

පිටු අංක 27 හි ජේ.පී.පද්මසිරි මන්ත්‍රීතුමා විසින් කළ යෝජනාවට අනුව සභාවේ සාකච්ජා කරන විට ජේ.පී.පද්මසිරි මන්ත්‍රීතුමාගේ පැහැදිලි කිරිමෙන් පසු ඔබතුමාගේ පැහැදිලි කිරිමක් සිදු කළේය.එම පැහැදිලි කිරිම මෙතන නැති බවත්,මට හමුවුයේ නැති බවත් පවසන ලදි.එතුමා එතනදී සඳහන් කළා ජලය සහ විදුලිය එකම Line එකක ගමන් කිරිමට නොහැකි බව හා තාක්ෂණික ප්‍රශ්නයක් තිබෙන බවත්,එය වාර්තාවට ඇතුළත් විය යුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ජලය සහ විදුලිය එකම Line එකක ගමන් කිරිමට නොහැකි බව හා තාක්ෂණික ප්‍රශ්නයක් තිබෙන බවත් යන ප්‍රකාශය වාර්තාවේ සඳහන් වී ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

පිටු අංක 28 හි සඳහන් ඔබතුමා කලින් ප්‍රකාශ කළ ආකාරයට ජනාධිපතිතුමා,අගමැතිතුමිය,කැබිනට් මණ්ඩලය ආණ්ඩුකාරතුමිය,2/3 බලය,මහ සභාවට තිබෙනවා.බොහෝම අපූරුවට ක්‍රියාත්මක කර ගෙන යාමට පුළුවන්.අපෙන් බධාවක් නොමැති බව පවසන ලදි.එයට යෞවන සමාජ තිබෙනවා අවශ්‍ය නම් මරණාධාර සමිතියත් ලබා ගැනිමට පුළුවන් බව ප්‍රකාශ කළත් එය සටහන් වී නොමැති බැවින් එම කොටසත් ඇතුළත් විය යුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් සංශෝධනය යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

දෙවැනි පිටුව හා තුන්වැනි පිටුව අතර සම්බන්ධතාවයක් නැති බව සංශෝධන යටතේ ඉදිරිපත් කළ අතර පනතේ තිබෙන ආකාරයට සංශෝධන ලිඛිතව භාර දීම සිදු කළ යුතු බවත් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

පිටු අංක 03 හි ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමාගේ ප්‍රකාශය වාඩි වී කළ ප්‍රකාශයක් බැවින් එම ප්‍රකාශ වාර්තාවට දැමිය නොහැකිය යන ප්‍රකාශයේ සංශෝධන කුමක් ද යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් පවසන ලදි.

පිටු අංක 04 හි සඳහන් සභාවට නොපැමිණි අය සම්බන්ධයෙන් ලිපි ලැබී නොමැති බවට පවසන අතර එම ලිපි ඔබතුමා විසින් සභාවට ඉදිරිපත් කළ යුතු බවට ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

නොපැමිණි අය ලිපි ඉදිරිපත් කර ඇති බවත්,එම ලිපි සභාවට ඉදිරිපත් කර අනුමැතිය ලබාගත් බවට ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.එම නිසා වාර්තාව විවේචනය නොකර වාර්තාවේ අඩුපාඩු පෙන්වා දෙන ලෙසට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

පිටු අංක 07 හි සඳහන් අංක 10 යටතේ පළාත් පාලන මාර්ග 2025 අත්‍යවශ්‍ය මහජන ඉල්ලීම් යටතේ ලක්ෂ 05 ට වැඩි ව්‍යාපෘති යටතේ සබරගමුව ප්‍රධාන අමාත්‍යාංශය වෙත ඇස්තමේන්තු ඉදිරිපත් කරන ලෙස දැනුම් දුන් ලෙස සටහන් කර ඇත.එසේ සිදු වුණා නම් අපිව දැනුවත් කළ යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඔබතුමන්ලා මේ සභාව නියෝජනය කරන්නේ මාස තුනකට පසුව බව ගරු සභාපතිතුමා පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

පිටු අංක 08 හි සඳහන් පළාත් පාලන මාර්ග 2025 අත්‍යවශ්‍ය මහජන ඉල්ලීම් යටතේ ඇති යෝජනා ලක්ෂයේ යෝජනා ලෙස සටහන් වුණත්,එම යෝජනා ලක්ෂයට වැඩි බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ආණ්ඩුකාරතුමිය විසින් ඉදිරිපත් කරන ලද යෝජනා වල නම තමා ලක්ෂයේ ව්‍යාපෘති.එහෙත් කාර්මික නිලධාරිට ඉදිරිපත් කළ පසු ලක්ෂයට වැඩියෙන් යන බව පැවසුවා.එම නිසා ලක්ෂයට වැඩියෙන් දැමීමට සිදු වූ බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

පිටු අංක 16 හි සඳහන් ගරු සභාපතිතුමාගේ ප්‍රකාශයේ පළාත් පාලන ප්‍රධාන ඇමතිතුමියගේ සාකච්ඡාවට මා සහභාගි විය. යනුවෙන් සටහන් වී ඇත. ප්‍රධාන ඇමතිතුමියක් නැති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මුද්‍රණ දෝෂයක් නිසා ප්‍රධාන ඇමතිතුමිය ලෙස සටහන් වී ඇති බැවින් එය ප්‍රධාන ලේකම්තුමිය ලෙස නිවැරදි විය යුතු බව ගරු සභාපතිතුමා විසින් සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

පිටු අංක 44-45 යෝජනාවේ සාකච්ඡාවට අනුව අවසානයේදී අපි ජල බවුසර් ඉල්ලීම ක්‍රියාත්මක කිරිම හා තාක්ෂණික කමිටුවට භාර දී ඇත ලෙස සටහන් කර ඇත.සභාපතිතුමනි,අදාළ යෝජනාව සම්මත වූ පසු එම යෝජනාව ක්‍රියාත්මක කළ යුතුය.මේ සභාව උත්තරීතර තැනක් එතනින් අපි ගන්න තීරණ නැවත කමිටුවකට යොමු කිරිම සැහැල්ලුවට පත් වෙනවා.ඒ නිසා ඒකේ වාර්තාව අනුමත කිරිම සිදු කළ යුතු බවත්,එම යෝජනාව සම්මත වී කමිටුවකට යොමු කරනවා නම් එම යෝජනාව ඉවත් විය යුතු බව පවසන අතර සභාවට ඉදිරිපත් වුයේ නම් විෂය භාර නිලධාරින්ට භාර දිය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මා එවැනි ප්‍රකාශයක් සිදු කලේ නැති බවත්,තාක්ෂණික කමිටුවෙන් වාර්තාවක් ලබා ගැනිමට අවශ්‍ය බව ප්‍රකාශ කළ බවට ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා**

පිටු අංක 24 හි සඳහන් අඩි 03 ක පමණ කොටස අඩි 30 ක් ලෙස නිවැරදි විය යුතු බව සංශෝධන යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එන්.කේ.සේනාරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

පිටු අංක 25-26 හි සඳහන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී **ජේ.පී.**පත්මසිරි මන්ත්‍රීතුමාගේ යෝජනාවේ ප්‍රාදේශිය සභාවේ සතිපොල භූමිය සභාවට පවරා ගෙන නැවත කටයුතු කරන්නට අදාලව අපි සභාවේ සාකච්ඡා කළා ඔබතුමාත් සාකච්ඡා කළා මේක යථාපරිදි කලින් ටෙන්ඩර් ක්‍රමයට යනවා ද කියලා ඔබතුමා සඳහන් කළා. එසේ සාකච්ඡා කර අන්තිමේදි මේ යෝජනාව ඒකමතිකව සම්මත වෙලා තිබෙනවා.එසේ සිදු වුණාද ගරු සභාපතිතුමනි,වාර්තාව විවේචනය කරන්නට එපා කිවත්, අදාල යෝජනාව ඒකමතිකව සභාව සම්මත විය යනුවෙන් සඳහන් කර ඉන්පසු තීරණය ගෙන තිබෙනවා අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කළා යනුවෙන් එහෙම වෙන්ට පුළුවන් ද මෙය සත්‍ය වාර්තාවක් ද යනුවෙන් පවසන ලදි. සත්‍ය වාර්තාවක් නම් මේ වගේ දෙවල් සිදු විය නොහැකිය.මම දැන ගැනිමට කැමතියි වාර්තාව සකස් කර අවසන් වූ පසු කවුරුවත් මේක අධ්‍යනය කරන්නේ නැද්ද යන්න.ඔබතුමා මේක ඉදිරිපත් කර ඇත්තේ අනෙක ඔබතුමා ඉදිරිපත් කරන වාර්තාවේ ඔබතුමාම සංශෝධන ඉදිරිපත් කිරිම හොඳ නැති බවත්,මේ ගැන ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙසත් සඳහන් කරන අතර සභාවේ ගරුත්වයට හානි කර තත්වයක් උදාවෙන බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ යෝජනාවේ මතු කළ කරුණ හොඳයි.මෙතුමා මතු කළේ පරිපාලනය පිළිබඳ කටයුතු සභාවට ලබා ගැනිම.ඔබතුමා යෝජනා කරන්නෙත් පරිපාලනය අපගේ පාලනයට ගැනිමටය.ඒ අනුව මේ යෝජනාව ගැටළුවක් නැති බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

යෝජනාව හරි,එදා මම සඳහන් කළේ සභාවේ සතිපොල භූමිය දැනට ටෙන්ඩර් ක්‍රමයට යන නිසා පොළ මුදල් එකතු කිරිම සිදු කරන්නේ සභවේ ටෙන්ඩර්කරුවන් විසින්ය. එම නිසා එය සභාවට පවරා ගැනිමට සභාවෙන් තීරණයක් ගනිමු. කියන එක මම ප්‍රකාශ කළ බව පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මගේ අවසන් කථාවෙදී මම මන්ත්‍රීතමන්ලාගෙන්/මන්ත්‍රීතුමියන්ලාගෙන් අසා සිටිනවා මේ යෝජනාවට විරුද්ධ ද නැද්ද යනුවෙන් එහිදී ඔබතුමන්ලාගේ විරුද්ධත්වයක් නොමැති බැවින් එම යෝජනාව සභා සම්මත වෙනවා.විරුද්ධත්වයක් ඇති වුණොත් බෙදීමකට යන්න තිබුණා.එසේ නොමැති වුවහොත් යෝජනාව සභා සම්මත වෙනවා යනුවෙන් ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

යෝජනාවට කරුණු කථා කරන එක වෙනම දෙයක් අපි මේකට විරුද්ධව කථා කළේ.එහෙම විරුද්ධව කථා කළා නම් අපි විරුද්ධයි.මෙම යෝජනාව ක්‍රියාත්මක කරන එක ගැටළු සහගතයි.සතිපොළ භූමියට අදාළ කරුණු පරිපාලන කටයුතු නොවේ.සභාපතිතුමා මෙතුමා සඳහන් කරන යෝජනාවේ සතිපොළ භූමිය නඩත්තුව හා සතිපොළ භූමියේ පරිපාලන කටයුතු ප්‍රාදේශීය සභාවට පවරා ගැනිමට සුදුසු බවට පදිමසිරි මන්ත්‍රීතුමා යෝජනා කරන අතර එම යෝජනාව සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.ඉන්පසු මෙතුමා මෙම යෝජනාව පැහැදිලි කර ගෙන යනවා.මොකක්ද මේ කථාව කරන්නේ කියන එක පොළෙහි රක්ෂණ මුදල යන කාරණා ගැන පැහැදිලි කරගෙන යනු ලබයි.ඔතුමාත් එයට පවසනවා ඉතිහාසයේ කුමක් වුණා ද යන්න නොදන්නා බවත්,මන්ත්‍රීතුමා පවසන කරුණ වාර්තාමානයේ මම එන විට තිබුණු බවත්,දැන් පරිපාලනය හා නඩත්තුව සභාව විසින් සිදු කරන බව පවසන ලදි.සතිපොල භූමිය ටෙන්ඩර් දීම සිදුකර තිබුණත්,ගිවිසුම අනුව එම පුද්ගලයා කටයුතු නොකළ බවත් ප්‍රකාශ කරන ලදි.සතිපොළ,කෙසෙල්කැන් පොළ,පින්නවල රථගාල,පොදු වැසිකිළිය ගිවිසුම් ගතව ලබා දී ඇත.මම ලේකම්තුමාගේ පරිපාලනයෙන් බැහැර නොවූ බවද පවසන ලදි.ඔබතුමා පාලනයට පැමිණ තවමත් ලේකම්තුමාගේ පාලනයේ සිටින බව මෙයින් අදහස් වේ.මේ යෝජනාවේ ඔබතුමා සඳහන් කළා සතිපොළට අදාළව උපදෙස් දුන්නා යන්න එම කරුණ ද සටහන් වී නොමැත.මේ යෝජනාව අවසානයේ ඒකමතිකව සම්මත වී ඇත.එහෙම ප්‍රශ්නයක් තිබෙන විට මේක සම්මත වුණේ කොහොමද යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ලේකම්තුමාගේ පාලනයෙන් බැහැර නොවුනා කියන්නේ ලෙක්ම්තුමාගේ පාලනය යනවා කියන එක නොවේ මින් අදහස් වන්නේ ඔහුගේ ක්‍රමයක් තිබුණා ඒ ක්‍රමය යන බව ගරු සභාපතිතුමා පවසන ලදි.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

පිටු අංක 31 හි සඳහන් මගේ ප්‍රකාශයේ තිබෙනවා සභාව ඝෝෂාකාරි වීම නිසා කරුණු පහැදිලි නැත යනුවෙන් සටහන් වී එහිදී මම සඳහන් කළේ ප්‍රියන්ත මන්ත්‍රීතුමා ප්‍රකාශ කරන යෝජනාව සභාවට නොවන ඒවා වුණත් සභාවට ඉදිරිපත් කිරිමට ලැබීම සෑම මන්ත්‍රීවරයකුටම හොඳ අවස්ථාවක් එම නිසා සභාපතිතුමනි,එම යෝජනා එම ආයතන වලට යොමු කරමු.ලෙස මම එදා ප්‍රකාශ කළ බව ගරු උපසභාපතිතුමා පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

පිටු අංක 27 හි සඳහන් කොටස පහත ආකාරයට සංශෝධන විය යුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා විසින් ලිඛිතව සභාවට ඉදිරිපත් කිරිමට සභාපතුමාගෙන් අවසර ඉල්ලා ගතිම්. ඒ වගේම කන්සලගමුව අසල සිට නුවර හංදිය දක්වා මාර්ගය ගිලා බසින බවත්, එම නිසා එම මාර්ගය පළල් කිරිම අපහසුයයි.මාර්ගයේ තැන්තැන් වල කාපට් ගැටී දමා තිබෙන බවත් ප්‍රකාශ කරන ලදි. දුම්රිය මාර්ගය සහ මාවනැල්ල ප්‍රධාන මාර්ගය අතර ඉඩ ප්‍රමාණය අඩුය.එම නිසා මෙම මාර්ගය සංවර්ධනය කිරිමට දුම්රිය දෙපාර්තමේන්තුවේ අනුමැතිය මත සිදු කළපයුතු නිසා ප්‍රමාද වූ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

පිටු අංක 30 -31 හි සඳහන් කොටසේහි මීට වසරකට කලින් මුළු ගොන්දෑවල වසම ආවරණය වන පරිදි 1.8 km ජල ව්‍යාපෘතියක් සිදු කළ නමුත් උඩුගම ප්‍රධාන මාර්ගයේ කන්ද ඉහළට අපහසු බැවින් එතැනින් නතර කර ගොන්දෑවල ගම ආවරණය වන පරිදි ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරන ලදි.පුංචි වැලිකන්ද,මහවැලි කන්ද ජනපදයේ ජලය ලබා ගැනිම සඳහා කෙටි දුරක් ලබා දුන්නත්,මහවැලි කන්ද ජන පදයේ ඉහළ මාර්ගයේ නිවාස සඳහා ජලය ලබා ගැනිමට නොහැකිය.මෙම ජල ව්‍යාපෘතිය සඳහා ජල සම්පාදන මණ්ඩලයේ ඇස්තමේන්තුව අනුව ලක්ෂ 02 ක් යන බව පවසන ලදි.මෙම ජල ව්‍යාපෘතිය කිරිම සඳහා ශ්‍රමදායකත්වය(ගල්,වැලි,කාණු කැපිම) ජල පාරිභෝගිකයන් විසින් සපයනු බලයි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

පිටු අංක 47 හි සඳහන් මීටර්100 ක පමණ ප්‍රමාණයක් සංවර්ධනය වී ඇත ලෙස සටහන් වී ඇත. එය මීටර්100 ක පමණ ප්‍රමාණයක් සංවර්ධනය කිරිමට ඇත. ලෙස නිවැරදි විය යුතු බවට සංශෝධන යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

පිටු අංක 20 හි සඳහන් මාර්ගය 1km නොව 2 km ක් ලෙස නිවැරදි විය යුතු බවත්,ඒක ලොකු සහයෝගයක් යන ප්‍රකාශය ඇතුළත් විය යුතු බවත්,ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් සංශෝධන යටතේ ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සංශෝධනයන්ට යටත්ව 2025.08.05 දින පැවති මහ සභා වාර්තාව සම්මත කරන ලෙස ගරු සභාපතිතුමා විසින් යෝජනා කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

සංශෝධනයන්ට යටත්ව එම වාර්තව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා ස්ථිර කරන ලදි.

(ආ). සභාපතිතුමා විසින් කරන ලද විශේෂ නිවේදනය

01.ප්‍රජාතන්ත්‍රවාදය සහ ආණ්ඩුකරණය පිළිබඳ ආයතනය මඟින් නවක මන්ත්‍රීවරුන්ට හා මන්ත්‍රීවරියන් සඳහා සිදු කරන ලබන හය මාසික පාඨමාලාව සඳහා මාර්ග ගත ක්‍රමයට පැවැත් වීමට සැලසුම්කර ඇති බවත් ඒ සඳහා අයදුම් කිරිමට හැකියාව ඇති බවත් දැනම් දෙන ලදි.එයින් කුසලතා හා ආකල්ප වර්ධන කිරිම අපේක්ෂා කරන බවත්, පවසන ලදි.

02. අධිවේගි මාර්ගය නිසා ප්‍රාදේශීය සභා මාර්ග භාවිතා කළා.සමහර මාර්ග අබලන් වී ඇත. එම මාර්ග සකස් කිරිම ඉල්ලීම් කළා එම ඉල්ලීමට ගරු මන්ත්‍රීතුමන්ලා/ තුමියන්ලාට මම තමන්ට අදාළ කොටස් වල තිබෙන මාර්ග අලුත් කිරිමක් සිදු කිරිමට ඉදිරිපත් කරන ලෙස ඒ අනුව මාර්ග අට නම් කරලා තිබෙනවා එම මාර්ග අට නම් හල්වත්ත,වැලිකන්ද කටාර මාර්ගය,හේවාදිවෙල කුඩාගම, ,උදන්විට සියඹලන්ගමුව මාර්ගය, හේවාදිවෙල බමුණුඋල්ල හරහා බුම්වල මාර්ගය, බමුණුඋල්ල හන්දියේ සිට පොල්අත්තාපිටය මාර්ගය සිල්ලුගල සිට වගාජේඩියාතැන්න, සිල්ලුගල සිට කහගොල්ලාවල යන මාර්ග සකස් කිරිමට පවතින්නේ. මන්ත්‍රීවරුන්ට එම නිසා තමන්ගේ ප්‍රදේශවලට ගොස් සොයා බැලිම සිදු කළ යුතුය.

03.රඹුක්කන අශෝක ක්‍රිඩාංගනය ගැන ඉල්ලිමක් සිදුකර තිබෙනවා. එම ක්‍රිඩාංගනය උදේට සහ සවසට ශරීර සුවතා සඳහා භාවිතා කරනු ලබන නිසාත්, වෙළඳ ප්‍රජාව හා රැකියා වල නියුතු අය රාත්‍රි කාලයේ 10.00 පමණ වෙනකල් ශරීර සුවතා සඳහා යොමු වෙන බැවින් ඔවුන් ඉල්ලිමක් සිදුකර තිබෙනවා රාත්‍රිකාලය සඳහා විදුලිය ලබාදෙන ලෙසට විදුලිය ලබා ගැනිමට පෞද්ගිලික අනුග්‍රහයෙක් සොයා ගෙන මෙය කරන්නම් කියලා ඔවුන් පැවසුවා.මම ඒකට කැමැත්ත පල කළාට අකමැත්තක් නැති බව සභාවෙන් පවසන ලදි.එහිදී විරුද්දත්වයක් නොමැති බව ගරු සභාපතිතුමා පවසන ලදි.ඒ වගේම ප්‍රේක්ෂකාගාරයේ තීන්ත ආලේප කිරිම සඳහාත් ඉල්ලීමක් සිදු කළා එහිදී ඔවුන් පැවසුවේ ඔවුනගේ වෙළඳ නාමය ප්‍රදර්ශනය කිරිමටය. මම එයට ද කැමැත්ත පලකර සිටියා යනුවෙන් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සභාපතිතුමා, මේක හොඳයි.මේ අය රජයේ දේපළකට අනුග්‍රහය දක්වන්නේ.පෞද්ගලික ස්ථානවල නම් කරලා දීලා නම දැම්ම ගැටළුවක් වෙන්නේ නැත.නමුත් මේක සභා දේපළකි.ඉදිරියේදී නිතීමය ගැටළු එයිද කියන එක ගැන සිතිය යුතු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් පවසන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

04.පළාත් පාලන සතිය ඔක්තොබර් 01 වනදාට යෙදී ඇති බැවින් ප්‍රවාහන හා මහාමාර්ග ගරු අමාත්‍ය රත්නායක මැතිතුමාගේ අදහසක් අනුව මාර්ග ආරක්ෂණ කමිටුවක් පිහිටු වීම සඳහා එතුමා පළාත් පාලන ප්‍රධානින් දැනුවත් කර ඇත.එදිනෙදා මාර්ග අනතුරු බහුල වීම නිසා ඒ අනුව පසුගිය සිකුරාදා මන්ත්‍රීතුමන්ලාට කෙටි දැනුම් දීමක් සිදු කර එම කමිටුව පිහිටුවන ලදි.එම කමිටුවේදී ලබාගත් තීන්දු තීරණ ලැබීමට සලස්වන බව ද පවසන ලදි.ඒ වගේම රාජ්‍ය ආයතන එකතු වී ඝණ අපද්‍රව්‍ය කළමණාකරණ කමිටුවක් පිහිටුවා ගත් බව හා එහි තොරතුරු ද ලැබීමට සලස් වන බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

ඇ).සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා

සභා රැස්වීමේ නොපැමිණ සිටීමේ අවසරය සඳහා වන යෝජනා නොමැති බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

(ඇ).සංදේශ,පෙත්සම්,පැමිණිලි ඉදිරිපත් කිරිම.
සංදේශ,පෙත්සම්,පැමිණිලි නොමැති බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

(ඉ).යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න
යථාපරිදි කල්දී ඇති ප්‍රශ්න නොමැති බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

**(ඊ). යථාපරිදි කල්දී ඇති යෝජනා**

**1. ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සභා කටයුතු සිදු කරගෙන යාම සඳහා (i) සිට (xx) දක්වා යෝජනා සභාවට ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් යෝජනා කරන අතර එම යෝජනා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

(i).රඹුක්කන ප්‍රා/ස සතු නව පළමු වෙළඳ සංකීර්ණය පළමු මහල අංක 03 ,06,07,සහ 15 යන කඩ කාමරයන්හි පෙර තක්සේරු වටිනාකම සහ සංශෝධිත තක්සේරු වටිනාකම අනුව 2023 මැයි සිට 2024 ජුලි දක්වා (මාස 15) බිල් කිරිම් වන රු72,000.00 ක මුදල 1987/15 ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්ති ප්‍රකාරව කපා හැරිමට සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

මෙම යෝජනාවෙන් අදහස් වන්නේ කඩකුලී තක්සේරු කර ඇති ආකාරය පිළිබඳය. කඩකුලී තක්සේරු කර ඇති වටිනාකම පළමු ලිපියෙන් සඳහන් වේ.ඉන්පසු කඩහිමියන්ගේ ඉල්ලීම කර තිබෙනවා කඩකුලී වැඩිය කියා එම ඉල්ලීම මත අඩුකර දෙන ලෙස තක්සේරු දෙපාර්තමේන්තුවට ඉල්ලීමක් කර ඇත.ඒ අනුව එම නිලධාරින් තක්සේරු වටිනාකම අඩුකර එවා ඇති ලිපිය දෙවැනි පිටුවෙහි ඇත. 2023 මැයි සිට 2024 ජුනි දක්වා ප්‍රාදේශීය සභාව කටයුතු කර ඇත්තේ පළමු වැනි තක්සේරු මුදලටය.එම මුදල අඩු නිසා වැඩිපුර ගෙවා ඇති මුදල කපා හැරිම සිදු කිරිම මෙයින් කියවෙන බව හා ඒ පිළිබඳ සභාවට ප්‍රශ්නයක් නැති බවද ගරු සභාපතිතුමා විසින් අසන ලදි.එහිදි විරුද්දත්වයක් නොමැති බව ප්‍රකාශ විය.

❖ ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා

කපහරිනවානම් ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යැවිමට සිදුවන බව ගරු උපසභාපතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
කපා හැරිම සඳහා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යැවිම අනුමත කිරිම තීරණය විය.

(ii). සියඹලන්ගමුව වෙලමැද මාර්ගය කැගල්ල දිසා අධිකරණයේ විභාග වන අංක 7267 දරණ බෙදුම් නඩුව අවසන් කිරීමට හෝ සමථ වීමට පැමිණිලිකාර පාර්ශවය කැමැත්ත ප්‍රකාශ කර ඇත.ඒ අනුව සභාවේ තීරණය දන්වන ලෙස නියෝග කර ඇත. ඒ අනුව අදාළ මාර්ගය සම්බන්ධව පහත කොන්දේසිවලට යටත්ව සමථ වීමට එකඟතාවය ප්‍රකාශ කළ හැකි බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහමමදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.ගැසට් පත්‍රයේ සඳහන් මාර්ගය අඩි 6 ක් පළලින් යුක්ත බැවින් එම පළලට මාර්ගය පැවතිය යුතු බව

2.ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ මංමාවත්වල බලතල හා කාර්යයන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ iii වන කොටසේ 21 වන වගන්තියේ සිට 77 වන වගන්තිය මගින් පළාත් පාලන ආයතනයට පැවරී ඇති බැවින් මතුයම් දිනක මෙම දෙවට සංවර්ධනය කර ප්‍රධාන මාර්ගය වෙත සම්බන්ධ කිරීමක් සිදු කළ හොත් ඒ සඳහා දෙවට දෙපස ඉඩම් හිමියන්ගේ මාර්ගයට අවශ්‍ය භූමි ප්‍රමාණය සමානව ලබා ගත යුතු අතර මෙම ඉඩම් හිමිකරුද ඒ සඳහා තම ඉඩමින් අවශ්‍ය ප්‍රමාණය ලබා දිය යුතුය.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සියඹලන්ගමුව වෙලමැද මාර්ගය කැගල්ල දිසා අධිකරණයේ නඩුව සම්බන්ධයෙන් යෝජනාවයි.නඩු කටයුත්තක් නිසා එම කොට්ඨාශය භාර මන්ත්‍රීතුමා සිටින බැවින් ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් සිදු කරන්නේ නම් හොඳ බව පවසන ලදි.මමත් එම ස්ථානය ගියා ගමේ එක් පුද්ගලයෙක් මෙම මාර්ගයට නඩුවක් දමා තිබෙනවා.නඩුව දමපු පුද්ගලයා එහි නොසිටි බවත්,සැඟවී සිටි බවත්, ප්‍රකාශ කරන ලදි.ඉන්පසු මෙම පුද්ගලයෙක් පැමිණ සමතයකට කැමති බව ප්‍රකාශ කර ඇත.එහෙත් නඩුව දැමූ පුද්ගලයාගේ ඇසුවිට එයට කොන්දේසි ටිකක් දමා ඇත.එම නිසා අධිකරණය මේ නඩුව සමථ කිරීමට නම් සභා අනුමැතියක් ඉල්ලා තිබෙනවා.එතුමා පවසන්නේ අඩි 6 ක් දිලා තිබෙනවා නමුත් දැන් ප්‍රාදේශිය මාර්ගයකට අඩි 10 ක් අවශ්‍යයි.අඩි 10 දෙන්නට ඒ පුද්ගලයා කොන්දේසි දෙකක් දීලා තිබෙනවා ඒ අනුව තමා කැමති වෙන්නේ ඒ පාර තවත් පාරකට සම්බන්ධ වෙන්න තිබෙනවා.එය සම්බන්ධ විය යුතු බවත්,අනෙත් ඉඩම් හිමිකාරයන් ඒ ප්‍රමාණය ලබා දීම සිදු කළ යුතුයි.එම ප්‍රමාණය ලබා දෙනවා නම් මෙම පුද්ගලයා කැමැත්ත ප්‍රකාශ කරන බව පවසා ඇත. දෙපැත්තේ ඉඩම් වලින් සමානව ලබාදිම සිදු කරන්නේ නම් සමත වෙනවා අනෙක් පාරට සම්බන්ධ වෙනවා කියන එක ප්‍රායෝගික නොවන බවත්,එම ස්ථානය කඳු සහිතය.වාහනයක් ගමන් කිරීම අමාරු බව පවසන ලදි.අපි මේක යෝජනා කරන්නේ.

01.ගැසට් පත්‍රයේ සඳහන් මාර්ගය අඩි 6 ක් පළලින් යුක්ත බැවින් එම පළලට මාර්ගය පැවතිය යුතු බවය.

02.ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ මංමාවත්වල බලතල හා කාර්යයන් 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ iii වන කොටසේ 21 වන වගන්තියේ සිට 77 වන වගන්තිය මගින් පළාත් පාලන ආයතනයට පැවරී ඇති බැවින් මතුයම් දිනක මෙම දෙවට සංවර්ධනය කර ප්‍රධාන මාර්ගය වෙත සම්බන්ධ කිරීමක් සිදු කළ හොත් ඒ සඳහා දෙවට දෙපස ඉඩම් හිමියන්ගේ මාර්ගයට අවශ්‍ය භූමි ප්‍රමාණය සමානව ලබා ගත යුතු අතර මෙම ඉඩම් හිමිකරුද ඒ සඳහා තම ඉඩමින් අවශ්‍ය ප්‍රමාණය ලබා දිය යුතුය.

ඒ ඉඩම් හිමියා ඒක දෙනවා නම් තමයි අපි සමථයකට යන්න ඕනෑ ඔය කාරණයට සභා අනුමැතියක් බලාපොරොත්තු වෙනවා අධිකරණයෙන් යනුවෙන් ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සභාපතිතුමා මෙතැන නඩුව දමා ඇත්තේ ඔහුනේ.මම හිතන්නේ පැමිණිල්ල ඔහුගේ, පැමිණිල්ලට නොහැකියි විත්තියට අභියෝග කිරීමට මෙහි අභියෝගයක් ආකාරයට ප්‍රකාශයෙහි සඳහන් වෙනවා.සභාපතිතුමා මේ කාරණය පිළිබඳ දීර්ඝව කථා කිරීමට සිදු වෙනවා නිතීය පැත්තෙන් මොකද ඔහු කොන්දේසි දමනවා.සභාවක් විදිහට අපිට ගරු සභාපතිතුමනි, මේ මාර්ගය අඩි 06 ක් ද වෙලා තිබෙන්නේ ඔහු දාල තිබෙන්නේ අඩි 10 ක් දිමට නොහැකි බවද නැත්නම් එක අඩි 06 සඳහන් වෙනවා.ඊළඟට අඩි 10 ක කතන්දරයක් තිබෙනවා.එතකොට සභාවෙන් අඩි 10 ක් ද ඉල්ලන්නේ.යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් පවසන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මාර්ගය ගැසට් වී ඇත්තේ අඩි 6 ට, අපි පවසන්නේ අඩි 6 තිබෙන්නට අවශ්‍ය බවයි.එහෙම එය ලිඛිතව ලබා දී නොමැති බව අප සමඟ පැවති සාකච්ඡාවකදී පවසා ඇති බව ගරු සභාපතිතුමා සඳහන් කරන ලදි.මෙම මාර්ගය පිළිබඳ විස්තර කිරිමට එම කොට්ඨාශය භාර මන්ත්‍රීතුමාට භාර දෙන බව ගරු සභාපතිතුමා පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා**

මෙම මාර්ගය අඩි 06 ක දෙවටක් විදිහට තමා සම්බන්ධ වෙන්නේ ඒ මාර්ගයේ හිමි පාර්ශවය ඔය මාර්ගය ප්‍රධාන මාර්ගයට සම්බන්ධ නොවීම නිසයි. ඒ සම්බන්ධයෙන් තමා නඩුව දමා ඇත්තේ.මොකද ගෙවල් කිහිපයක් තිබෙනවා.ඒ ගෙවල් වලින් මාර්ගය අවසන් කිරිමට තිබුණේ.එයාගේ ඉල්ලිම වන්නේත් ප්‍රධාන මාර්ගය මෙම මාර්ගයට සම්බන්ධ කිරිමය.එතකොට ඔහු පවසන්නේ ඒ ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වෙනවා නම් ඔහුගේ ඉඩමෙන් අවශ්‍ය ප්‍රමාණය අනෙක් අයත් දෙනවා නම් දෙනවා කියන එන තමා කියනනේ. සභාවෙන් එය සංවර්ධන විය යුතුය.මාර්ගය ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වීම අවශ්‍ය බවත් සඳහන් කරන ලදි.මේ සභාවට ඉදිරිපත් කර ඇති කොන්දේසි වලට යටත්ව යම්කිසි සමථයකට පැමිණේන්නේ නම් ප්‍රශ්නයක් නොමැති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්.කැලුම් කුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමා,අපිට ගරු මන්ත්‍රීවරයාගෙන් අදහස් කිහිපයක් ඉදිරිපත් වුණා.දැනට මෙතන ගැටළුවක් තිබෙනවා.මෙම පුද්ගලයාට එක්කරගෙන අපි මාර්ගය ඉදිරියට යන්න අවශ්‍යයි.එතකොට පැමිණිල්ල ඔහු සභාව විත්තිය ගරු සභාපතිතුමනි,අපි විත්තිය වෙනුවෙන් පෙනි සිටිමු.ඒ කියන්නේ පැමිණිල්ල නියෝග කරනවා.අර පැත්තෙන් ගන්නවා නම් මේක දෙන්නම් ඒක ද ක්‍රියාත්මක කිරිමට ඕන. අපිට සභාවක් විදිහට ඊළඟ කොටසට යනවා නම් පුද්ගලයා කැමැත්ත දෙන්න ඕනෑ.නැත්නම් සභාවට පවරා ගන්නට වෙනවා.දැනට තිබෙන නඩුකරය පැමිණිල්ල විත්තියට අභියෝග කරන විදිහට නඩුව ගැනේන්නේ.නමුත් අපි මේ වෙලාවේ නොතිසි දැම්මොත් ඒ වේලවේ ගැසට් එක අනුව අඩි 6 ක් දෙන්නම් කියලා නමුත් මේ නඩු තීන්දුවෙන් පසුව අපිට මෙම මාර්ගය සංවර්ධනයේදී තව පළල් කිරිමට අවශ්‍ය වුණොත් පළල් කිරිමට සභාපතිතුමා විදිහට ඔතුමාට බලතල නැත.මොකද මෙහෙම සීමාව දෙන්නේ අධිකරණයෙන් එහෙම වුණොත් මම හිතන්නේ සාමාන්‍ය අධිකරණයේ මෙම නඩුව විභාග වෙනවා ඇත්තේ එතකොට නැවත අඩි 10 ක් දුන්නොත් අඩි12 ක් ලබා ගැනිමට නම් ඉහළ අධිකරණයට යා යුතුයි.එය තවත් ප්‍රශ්නයක් වෙනවා.අපි වෙන ප්‍රශ්න සොයන්නේ නැතිව මෙහිදී ඔහු අඩි 10 ක් දෙනවා නම් ඒකට එකඟ වෙමු.මේකට එහා ඔබතුමාට ඉල්ලන්න නොහැකිය.විත්තියට හා පැමිණිල්ලට ඉල්ලන්නත් නොහැකිය.නමුත් ඔහුගෙන් අපිට අඩි 10 ක් නොලැබෙනවා නම් මේ නඩු තීන්දුව මේ අකාරයට යයි.එහෙම නැත්නම් අපගේ අඩි 10 ලබා ගනිමු. ප්‍රදේශයෙන් අපට ඉල්ලීමක් ආවොත් ඒ ඉල්ලීම අනුව අපට ඒක සිය කැමැත්තෙන් දෙනවා නම් ඒ ඉඩම් ටික සිය කැමැත්තෙන් කිවාට බෑ මාර්ගය ලියාපදිංචි කිරිමේ දී ඒ අදාළ පාර්ශවය විසින් පිඹුරු පත් සකස් කර සභාවට භාර දිය යුතුය.එය අදාළ ජනතාව කිරිම අවශ්‍ය දෙයක්. නමුත් ඒක එහෙම වෙන්නේ නැත්නම් සභාවෙන් ඉල්ලිමක් කරන්නේ නම් සභාතිතුමාගේ බලතල අනුව සභාවේ බලතල අනුව සභාවට අතපත් කර ගැනිමට පුළුවන.එක දෙවැනි කාරණයකි.ඒ නිසා අපි පැමිණිල්ල විසින් අපිට නියෝග ලබා දෙන එක හෙළා දකිනවා. ඔහුව අපි මේක ගන්නවා නඩු කියලා.ඒනිසා මම හිතන්නේ ඔහුගේ ප්‍රකාශයයි.මෙකයි.අතර පොඩි පරස්පරතාවයක් තිබෙනවා.මොකද අපි අඩි 10 ක් වෙනුවෙන් පෙනි සිටින්නේ ඔහු එකට පෙන්වා දී ඇති අනෙක් කරුණේදී අපිට එකඟ විය නොහැකිය.ඒ නිසා ඔහුගේ අපිට සමථ වෙන්න ඕනෑ නම් අඩි 10 මාර්ගයක් ඉල්ලා සිටිමු.එහා පැත්තේන් මායිම් කරන්නට මේකට දැන් මාර්ගය පටන්ගන්නා තැන සිට අවසානට යන්න වෙනවා.ඒක දෙවැනි කාරණයක් ඔහු පැමිණිල්ල කර තිබෙන විදිහට සභාවේ අපිට කටයුතු කරන්න නොහැකිය.ඒ නිසා ඔහුට මේ නඩු කරය අවසන් කර ගැනිමට අවශ්‍ය නම් සභාවක් විදිහට අඩි 10 ක නඩු කටයුත්ත කර දෙන්න කියලා එකට එකඟ වෙමු.ඔහුගේ අනෙත් නියෝගය එක සම්බන්ධ කිරිම එකට අපි එකඟ වෙන්නේ නැති බවත්,ඒ නිසා මේ පිළිබඳ ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

### ❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා

ගරු සභාපතිතුමනි, මෙම මාර්ගය සම්බන්ධයෙන් මම කරුණු සොයා බැලුවා.මේ මාර්ගය මැදට යනකම් වාහනයක් ගිය හැකිය.I.M.ජයලත් යන පුද්ගලයාගේ නිවසට යනකම් වාහනයක් ගිය හැකිය. එතැනින් වමට හැරෙනවත් සමඟ තමා ගැටලුවක් තියෙන්නේ. ඉතිරි ටික තියෙන්නෙ පොඩියි එච්චරයි ගැටලුවකට තියෙන්නේ මේ පාරේ උඩ හරිය කොන්ක්‍රීට් කර ඇත. උඩම හරියේ රජයේ මුදල් වියදම් කර පඩිපෙළක් සකස් කර තියෙනවා. යම්කිසි ප්‍රතිපාදනයක් වෙන්කරලා තියෙනවා රජයේ මුදල් වලින් මේක ඒ අය කියන්න විදිහට කරන්නට නොහැකිය. සමහර විට නඩු තීන්දුවක් දුන්නොත් ඒකට යටත් වෙන්න වෙනවා. එයාලා නඩුව දාලා දැන් නඩුව සමථයකට එකඟතාවය එන්න හදනවා. සභාව තමා විත්තිකාරයා, සංවර්ධනය කරගෙන යනකොට නඩුව දමලා මෙතුමා කියනවා වගේ වැඩේ නතර කළා. මොකක්දෝ ප්‍රශ්නයක් දාලා නඩුව නිදහස් කරගන්න හදනවා. සභාව එකඟ වෙන්න පවසනවා. ජේ ආර් රත්නායක මහතාගේ නිවසට පහළින් මේක ලබාදෙන්න ඕනෑ.ඒක තමා අපි බලාපොරොත්තු වෙන්නේ. සභාවක් වශයෙන් ඒ නිසා මේක සමථ කරන්නට සභාවේ කැමැත්ත පවසනවා. මම උදාහරණයක් කියන්නම් මම පාරක් හැදුවා වඩුවාදෙණියේ සභා අරමුදල් දාලා ඉඩම් හිමියාගේ කැමැත්ත අරගෙන තාක්ෂණ නිලධාරි මහතා ගිහින් පරීක්ෂා කරලා ඔක්කොම කරලා පාර හැදුවා. පසුව සභාවේ පාර කැපුවා.පාර කරගෙන යනකොට එකකට මොකක්දෝ කියලා ඒ පුද්ගලයා නඩුවක් දාලා ඔය වගේ සමථයක එන්න කියලා ඉල්ලීමක් සිදු කළා.එතන පොඩි ප්‍රශ්නයක් තිබෙනවා.අඩි පාරකින් යන්නත් පුළුවන්, අපි පැවසුවා මේකට සමථ වෙන්න නොහැකි බව, මොකද මම නීත්‍යානුකූලව වැඩේ කෙරුවේ හැබැයි මට හොරෙන් සභාපතිතුමා සමථයකට පත් වී තිබුණා.සමථ කළාට පස්සේ උසාවිය නියෝගයක් එනවා එක්ලක්ෂ දාහතර දාහක් සභවෙන් ගෙවන්න කියලා අපිට මේකටත් වෙන්නේ ඔය ටික තමා අපි සමථ වෙලා බැරි වෙලාවක් මේක නොකරනුත් එහෙම උසාවියේ නියෝගයක් එනවා අපි සමථ වුණාට පසුව ගෙවන්න.දැන් එක වඩුවාදෙණිය මාර්ගයට වුණා. එක ගෙවලා තියෙනවා.ඔබතුමා දැනුවත් කලා මහජන මුදල් වලින් පාර හැදුවොත් පාර වැසුවොත් නඩු තීන්දුවෙන් නඩු තීන්දුවක් දුන්නේ නෑ පාර බෙදුවා.ඔය වගේ සමථ කරන්නට පුළුවන්ද කියලා ඔය නීත්‍යඥ මහත්වරුන්ගේ වැඩ තමා අපි කැමැත්ත දුන්නොත් එහෙම ආපසු වන්දියකුත් ගනියි. ගරු සභාපතිතුමනි, මෙම මාර්ගයේ කෙටි දුරක් යනකම් වාහනයකට යන්න පුළුවන්. ජයලත් මහත්තයාගේ ගෙදර ළඟට යනකල් ගොස් වමට හැරෙනකම් මේක හොඳට තිබෙනවා. උඩ ලක්ෂ දෙක හමාරක පඩිපෙළක් තිබෙනවා.එම පඩිපෙළ දැනටමත් පාවිච්චි කරනවා. ඉස්සරහට රටේ සංවර්ධන කටයුත්තක් එනකොට අපිට අයිතියක් තිබෙනවා ඔය ඉඩම් අත්පත් කර ගැනීමට, දැන් අත්පත් නොකරගෙන වෙලා සංවර්දන කටයුතු කිරිම ට ගොස් ගම් දෙකක තුනක් අපට නඩු දාලා තිබෙනවා. රත්නායක දිසානායක මාවතේ කොටදෙණියේ දුම්රිය ස්ථානයට යන තැන නඩු දමා ඇත. දැන් නඩුව යන්නේ නෑ පාර හැදෙන්නෙත් නෑ ඒ නිසා මම ගිහින් කතා කරන විට පැවසුවේ මගේ බැම්ම කඩලා දෙන්නම් හැබැයි දැම්ම නොහැකි බව පැවසුවා. තව ටිකක් ඉස්සරහට යනකොට පාර පටුය. අනෙක් පැත්තෙන් රාජපක්ෂ නෝනා කෙනෙක් මැදිහත් වෙලා ඉන්නවා. එයා මේ ලබා දෙන්න නෙහැකි බව පවසනවා. මෙතුමා කියන ආකාරයට පැමිණිලිකාරයා අනුව විත්තිය හැසිරෙන්න නොහැකිය.මේක අධිකරණයේ බේරගන්න කියලා මම විශේෂයෙන් කියනවා. මේක බල ප්‍රදේශය තුළ සිටින ඔබතුමාගේ මන්ත්‍රීවරයාට එයට මැදිහත්වී මේ ප්‍රශ්නය විසඳගන්න පුළුවන්.අපි මේකට මැදිහත් වෙනවාට වැඩිය හොඳයි ඒක බලපදේශයේ සිටින මන්ත්‍රීවරයාට බාර දෙන එක සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

### ❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා

මේක අධිකරණයේ පවතින ගැටලුවක් එතකොට ආධිකරණයෙන් අපට ඉල්ලීමක් කරලා තිබෙනවා. සභාවෙන් මේකට කරුණු දක්වන්න කියලා මොකද අපිට පුළුවන් මේකෙදි මේ සමථයකට එනවාද? කියන එක මේ සභාවේ තීරණය කරන්නේ නැතුව ස්ථානිය පරීක්ෂණයක් සභාවේ මන්ත්‍රී කමිටුවක් පත් කරලා ඒ ගැන නිසි අධ්‍යයනයක් කරලා සමථයකට එනවද? එහෙම නැත්නම් අපි ඊළඟ කාරණයට යනවද? කියන එක තීරණය කරන්න පුළුවන්. මොකද මේ නඩුවේ ඊළඟ නඩු වාරය දහ වැනි මාසෙ වෙන්න පුළුවන්. ඒ කාලය ඇතුලත අපි මන්ත්‍රි කමිටුවක් පත්කර ස්ථානිය පරික්ෂණයක් සිදු කර ඒ ගැන තීරණයක් ගෙන මේ මහා සභාවට කරුණු දක්වන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

මේකයි අපි තීරණය කර නොමැති බවත්, අධිකරණයෙන් නියෝග කරල තිබෙන්නේ මෙය ලබා දීමට බව ගරු සභාපතිතුමා පවසන ලදි.අපිට තීරණය දෙන්න කියලා අධිකරණයෙන් නියෝගයක් ඇවිත් තිබුනේ පසුගිය සභාවරයේදීය.එනම් 08/05 දිනය. ඒ කියන්නේ ගිය සභා වාරයේ තිබුණු දවසෙම මේකට සභා තීන්දුව ලබාදීමට ගරු අධිකරණය විසින් නියෝග කර තිබුණේ.මොකක්ද කියලා ප්‍රකාශයට පත් කරන්න කර විට එයට හේතුව අපි විත්තිය නිසා. එතකොට ඒක තමා දැන් සභාවෙන් විමසන්නේ.දැන් අපිට 08/05 ට තීන්දුව දීමට නොහැකිය. එදින සභාව පත්වා ඇති බැවින් ඒ නිසා 10/03 දිනට දීලා තියෙන්නේ. ඒ සඳහා කරුණු දැක්වීමට එනම් 10/03 දිනට පෙර ලබා දීම ඇත. අපි කොහොමත් එයට එකඟ වී නැත. පූරෝකථනයක් කළා මේක කාරණයක් අවධානයක් වෙන බව, ගැසට් කරන්නේ නෑ එක අඩි 10 ට ගැසට් කරන්න ඉල්ලීමක් කළත් එහෙම ඇවිත් නැති බව පවසන ලදි.දැන් තියෙන්නේ අඩි 06 ට මේ අඩි 06 තමා තිබෙන්නේ ගැසට් කරපු මාර්ගයේ මේ මාර්ගය කවදා හරි විශාල කරනවා නම් ඒ ඉඩම් ටික ලබාදෙන බවට පොරොන්දුව තමා අපි එකඟයි කියලා කියන්නේ.08/05 කියන්නේ අද 09/02 අපි එතකොට කණ්ඩායමක් ගිහිල්ලා ක්ෂේත්‍ර චාරිකාවක් සිදුකර වාර්තාවක් ලබා දෙන ලෙසත්, අපිට ඒ වාර්තාව සාකච්ඡා කිරීමට විශේෂ සාකච්ඡාවක් අරගෙන මේකට තීන්දුවක් ගනිමු. අධිකරණ කටයුත්තක් නිසා ඒකට විරුද්ධත්යක් නැති බව ප්‍රකාශ කරන ලදි.එහෙනම් අදහස් දක්වන්න කරුණු දෙකක් තිබෙනවා.එකක් ක්ෂේත්‍ර චාරිකාවක් ගිහින් සාකච්ඡා කර තීන්දුවක් දෙනවද?එහෙම නැත්නම් රුක්මන් මන්ත්‍රීතුමා කියන ආකාරයට අපි අඩි10 ඉල්ලුම් කර සභාව එකඟ වෙනවද? කියන එක සභාව තීරණය කරමු. යැයි ගරු සභාපතිතුමා පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා

සභාපතිතුමා ඇත්තටම මේ අඩි දහයක කතාවකට සභාවක් විදිහට එකඟ වෙනවද නැද්ද කියන එක ඡන්ද විමසුමකට යන්න වෙනවා. මොකද අවංකවම මම ඒ කියන තැන දන්නේ නැත. මේ සභාවේ සිටින කිහිප දෙනෙක් හැරෙන්නට මේ ගැන අනෙක් අයට අවබෝධයක් නැති බව පවසන ලදි.මෙතන ඉඳගෙන කතා කළාට එතන තියෙන්නේ මොකක්ද කියන්නට කවුරුවත් දන්නේ නෑ අපි මේකට සභාවෙන් යෝජනාවක් හරි තීරණයක් හරි ගන්නවා නම් කමිටුවක් දමා ලොකු දෙයක් නොවන බව පවසන ලදි. මේක කමිටුවට ගිහිල්ලා අපේ සභාවේ මන්ත්‍රීවරු කමිටුවකින් එතනට ගිහින් නිරීක්ෂණය කරලා අඩි 06 අඩි 10,12,16 මොකද්ද මේ කොන්දේසි එයා ඉදිරිපත් කරන එම පුද්ගලයා නඩු දමලා සමථයකට කතා කරනවා. එතකොට අපි තීරණයක් ගන්න පුළුවන් එම පුද්ගලයා කියන දෙයට එකඟ වෙනවද නැද්ද කියන ඒක පිළිබඳව සභාවේ මන්ත්‍රීවරු සහභාගි වී තීරණයක් ගන්න අවශ්‍යයි.සභාවක් විදිහට නැත්නම් අපි මෙතන ඉඳගෙන අඩි 12 යනවාද කියන එක අපිට තීරණය කරන්න නොහැකි බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා

නමුත් අපේ මේ මහජන නියෝජයන් විදියට මේ වගේ දෙයක් ඉදිරිපත් වී වුණාම ප්‍රායෝගිකව අධ්‍යයනය කරලා තීරණයක් ගන්න පුළුවන්. මේ වගේ විදිහට සභාව අපිට ගෙනියන්න වෙන්නේ නෑ. ඒ හින්දා මහජන නියෝජිතයන් විදිහට ඒ අවදානම තිබෙන්න අවශ්‍යයි.සාරාංශය කීවාට පසුව තීරණයක් ගන්න.ඒ නිසා මම හිතන්නේ පරීක්ෂණයක් යොමු කර එයට තීන්දු තීරණ දෙන එක වෙනම දෙයක් ඒ නිසා අඩි 12 දෙන්න එයා එකට එකඟ වෙලා දොළහක් දෙනවා කියනවා නම් එය හොඳ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

මේකට කියන්න කාරණා දෙකක් තිබෙනවා. එකක් ක්ෂේත්‍ර චාරිකාවක් කරලා උත්තර දෙනවද? නැත්නම් අඩි 12 ක් අර ගැනිමට එකඟ වෙනවා. එහෙනම් මන්ත්‍රීතුමාලා කියන්නේ කමිටුවක් අවශ්‍යය නැති බව ද? මන්ත්‍රීතුමාලා ඒ ස්ථානය නිරීක්ෂණය කරලා මේ වගේ විශේෂ සභාවක් පවත්වා ඒ සභාවේදී මේ ගැන පූර්වයෙන් සාකච්ඡා කර තිරණය ගනිමු. අධිකරණ කටයුත්තක් නිසා එතැනට ගොස් මේක නිවැරදි ගනිමු. ඒ සඳහා කමිටුවක් පත් කර ගන්නා ලෙස ගරු සභාපතිතුමා පවසන ලදි. මට පත් කිරිමට නොහැකිය. එකට ප්‍රශ්නයක් එන්න පුළුවන් සභාපතිතුමාට කැමති අය දැම්මා මේ වැඩේ කරගන්න අවශ්‍ය නිසා ,ඒ නිසා මම කියන්නේ ස්වේච්ඡාවෙන් කමිටුවක් පත් කර ගන්නා ලෙසත්, එම ස්ථානයට සභාවෙන් ගිහින් නිරීක්ෂණය කර මෙතන කරුණු කියන්න මොකක්ද කියලා ඇත්ත දැනගැනීමෙන් පසුව, මම ඒකෙදි දැකපු දෙයක් කීවට තීරණය කරන්නේ නැතිව එම ස්ථානය නිරීක්ෂණ කර තීරණය කරමු. කැලුම් මන්ත්‍රීතුමා ගමේ නිසා ගිහින් එම ස්ථානය නිරීක්ෂණ කර තිබෙනවා. අපේ තෙන්නකෝන් මන්ත්‍රීතුමාත් ගිහින් තිබෙනවා. ඒ වගේ අනේ

මන්ත්‍රීතුමාලාත් ස්වේච්ඡාවෙන් නිරීක්ෂණය කර උත්තරයක් දෙන්න ලෙසත්,නැත්නම් ස්වේච්ඡාවෙන් කමිටුවක් පත්වෙලා නිරීක්ෂණය කරන ලෙසටත් දැනුම් දෙන ලදි.විශේෂ සභාවට දිනයක් තීරණය කර තොරතුරු අරගෙන තිරණය කරමු.විශේෂ සභාවකට දිනයට නියම කරන ලෙස ගරු සභාපතිතුමා සභාවට දැනුම් දෙන ලදි. නිරීක්ෂණය කර තොරතුරු රැගෙන එන ලෙසත්,එම තොරතුරු මෙතන සාකච්ඡා කර තීරණයක් ගනිමු. මෙම මාතෘකාවේ සභා තීරණය 10/03 ගරු අධිකරණය භාර දීමට නියමිත බැවින් මෙයට කාර්මික කමිටු ප්‍රමාණවත්ද යනුවෙන් ගරු සභාපතිතුමා පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

ඉඩමෙන් කොටසක් ලබා දෙනවා කියන්නේ.මෙම මාර්ගය සම්බන්ධ වෙනවා නම් තමා එම පුද්ගලයා ලබා දීමට එකඟ වෙලා පැමිණිල්ල දමලා තිබෙන්නේ. නමුත් දැන් මෙතන කියන විදිහට පාර සම්බන්ධ වෙන්නේ නැති නිසා නඩුවට ඉදිරිපත් වෙලා තිබෙන්නේ.එම නඩුවට ඉදිරිපත් වෙලා තිබෙන පාර්ශ්වය මාර්ගය සම්බන්ධ වෙනවා නම් නඩුවට එකඟ වෙනවා කියන එක.ඒ නිසා සභාවට සභාව තීරණයක් ලබා දෙන ලෙසට දන්වා ඇත.සභාපතිතුමා මෙතන ගිහින් නිරීක්ෂණය කරලා තියෙනවා. ඒ නිසා සභාපතිතුමා නිරීක්ෂණ කරලා තිබෙන නිසා මේක සභාවට ඉදිරිපත් කර තිබෙන්නේ එතුමා දැනුවත්වය. ඒ නිසා සභාපතිතුමාගේ තීරණයට එකඟව වෙමු. අපි නිරීක්ෂණය එකඟ නොවේ. කණ්ඩායමක් එම ස්ථානයට යාමෙන් සිදු වන්නේ අපේ කාලය නාස්ති විම හා යම්කිසි මුදලක් යන බවත්,ඒ නිසා අපි සාධාරණ තීරණයක් ලබා දෙමු යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සභාපතිතුමා නිරීක්ෂණය කළා කියලා ඒක තීරණය කරන්න නොහැකිය.අපිට සභාවක් විදියට සභාපතිතුමා කියන්නේ මේ සභාව නියෝජනය කරන ප්‍රධානියාය. ප්‍රධානියා ගියා කියලා මහ සභාවේ තීරණයක් ගන්න නොහැකිය.මේක මහ දෙයක් නොවේ. ඇත්තටම මේක කාර්මික කමිටුව නම් කරන්නට නොහැකි වෙන බව පවසන ලදි. මොකද බාහිර පුද්ගලයන් කීහිපදෙනෙක් කමිටුවේ සිටින නිසා මොකද ස්ථානය පරීක්ෂණ කරන්නට යන කොට පුද්ගලිකකම එහෙම බලපාන නිසා, බාහිර පුද්ගලයන් සම්බන්ධ කර ගැනීමට අවශ්‍ය නැත.ඔබතුමාට අපහසු නම් කමිටුවක් පත් කරන්න.නැත්නම් ස්වේච්ඡාවෙන් පත් වෙමු. කමිටුවට මම එන්න සූදානම් මේක මහා ලොකු දෙයක් නොවන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

දැන් මම කියන්නේ මම සභාපතිවරයා හැටියට වගකීම් ගන්න පුළුවන් දේවල් තිබෙනවා. බැරි දේවල් තිබෙනවා. ගරු අධිකරණය දන්නවා ඇත්තේ සභාපතිතුමාට තීන්දු ගන්න පුළුවන්ද බැරිද කියලා. එහෙනම් මේක මෙහෙම එවන්නේ නැති බව ගරු සභාපතිතුමා පවසන ලදි.මේකේදී දැන් ගරු අධිකරණය අපෙන් අහන්නේ සමථයකට වෙනවාද? සභාවේ අනුමැතිය ලබා දෙන ලෙස දන්වා ඇත. අපි නඩු දැමුවේ නැති බවත්, අපි කියන්නේ එයාගේ කොන්දේසිය ඒක නම් අපේ කොන්දේසිය මේක නම් අපි කැමතියි. ඒකට හේතුව පහසුගිය අවුරුදු 10 ක කාලය සිට නඩු කියලා තියෙන්නේ. මගේ දේවල් වලට පමණක් තීන්දුවට එළඹෙන්නේ නැතිව මන්ත්‍රීතුමන්ලා/මන්ත්‍රීතුමියන්ලා මම කැමතියි. සමීර මන්ත්‍රීතුමා කළ යෝජනාවට අපි මහා සභාවක් තව සතියකින් හෝ දෙකකින් පැවැත් විමට කටයුතු කරමු. මේ කාරණය වෙනුවෙන් කාර්මික කමිටුව මූලික කරගනිමින් එම කමිටුවට පත් වී නොමැති මන්ත්‍රීවරු හා මන්ත්‍රීතුමියලා සිටිනවා නම් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වන ලෙසත්,එම කමිටුවෙන් සාකච්ඡා කර ඊළඟ මාසික රැස්වීමට වාර්තාව ලබා දෙන ලෙස ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සභාපතිතුමා කාර්මික කමිටුවත් එක්ක ප්‍රශ්නයක් තිබෙනවා. බාහිර පුද්ගලයින් කිහිපදෙනෙක් සම්බන්ධ වෙන බව පවසන ලදි.බාහිර පුද්ගලයින් කියන පාර්ශවයෙන් කාර්මික නිලධාරීයෙක් සිටියා නම් ඇති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කාර්මික කමිටුවේ සිටින මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීමියන්ලා සමඟ උපාලි රෝහණ මන්ත්‍රීතුමා සභාපතිකම දරන්නේ එතුමා මූලික කරගෙන අනෙක් මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාත් එකතු වී නිරීක්ෂණ චාරිකාවක්

සිදු කර ඔබතුමාලා සාකච්ඡාවක් අරගෙන අපට තීන්දුවක් ලබාදෙන්න.ගරු අධිකරණයට ලබා දිමට සඳහා යනුවෙන් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මේ එක කාරණාවක් ගැන නොව තව කාරණා ගැන මේ සභාවේ කථා කිරීමට තිබෙන නිසා කාලය නාස්ති නොකර මේක කරන්නට තිබෙනවා. හොඳම සුදුසුම දේ මේ ගැටලුව මතු වුණ ප්‍රදේශයේ සිටින මන්ත්‍රීතුමා තමා අපේ කැලුම් මන්ත්‍රීතුමා ඒ වගේම අපේ කුඩාගම මන්ත්‍රීතුමිය සිටිනවා.සමීර මන්ත්‍රීතුමා සිටිනවා. රුක්මන් මන්ත්‍රීතුමා සිටිනවා මේ සියලුම දෙනා ස්ථානය නිරික්ෂණය කර පැහැදිලි තීරණයක් ගන්නවා නම් හොඳ බවත්,නැත්නම් එක් කරුණක් ඉදිරිපත් කිරීම අපේ කාලය නාස්ති වෙන බවත්,සඳහන් කරන ලදි. මම දන්නේ විදිහට ඒක තමයි සුදුසුම දේ අනෙක් මන්ත්‍රීතුමන්ලාත් ඒක අනුමත කරයි කියලා මම හිතනවා. ඔබතුමා ගිහින් සහභාගි වුණා නම් හොඳය. ඔබතුමාටත් අවබෝධයක් තිබෙනවා මේක නඩු කටයුත්තක් නිසා ඔබතුමා සහභාගී විම සුදුසු බව පවසන ලදි.ඒකට අපේ සමීර මන්ත්‍රීතුමා,අපේ කුඩාගම මන්ත්‍රීතුමියත්,කැලුම් මන්ත්‍රීතුමත් සිටිනවා. කොට්ඨාශයේ කිසිම ගැටලුවක් නැති බවත්,මේක පැහැදිලි තීන්දුවක් ගන්න පසුව සභාපතිතුමාට තීන්දුව දෙන්න ප්‍රශ්න නැති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කාර්මික කමිටුවේ සභාපති උපාලි මන්ත්‍රීතුමා නිසා මේක මෙහෙය වන්න මෙම මස 23 වැනිදා පෙ.ව.9.30ට මේ සම්බන්ධයෙන් තීරණයක් ගැනිමට විශේෂ සභාවක් පැවැත්විම සුදුසු බව පවසන ලදි. තව සතියක් තිබෙනවා.සුදුසු තීරණයක් ගන්න මන්ත්‍රීතුමා මේ ක්ෂේත්‍ර චාරිකාව සම්බන්ධයෙන් වෙනම වෙනම හරි ගොස් ඒ සම්බන්ධව තීරණය ලබා ගන්නා ලෙස සභාවට දැනුම් දෙන ලදි. එම නිසා මස්කඩේ යෝජනාවයි,පාරේ යෝජනාවයි අපි පසුවට තබන බවට ප්‍රකාශ කළ අතර ඊට සභාවේ කවුරුවත් විරුද්ධ නැති බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි

අදාළ යෝජනාව පසුවට කල් තබන ලදි.

තීරණය -

2025.09.23 දින විශේෂ සභාවකින් සාකච්ඡා කිරිමට තීරණය විය.

(iii).මෙම සභාව සතු නව පළමු වෙළඳ සංකීර්ණය පළමු මහල අංක13 කඩ කාමරය W.G.මංගොනෝනා මිය බදු අයිතිකාරිය වන අතර මේ වනවිට ඇය මිය ගොස් ඇත.ඇගේ ස්වාමිපුරුෂයාද මේ වන ජීවතුන් අතර නොමැත.එහෙයින් ඇයගේ පුතා වන අයි.උපාලි පුෂ්ප කුමාර ජයලත් බාලසූරියට චක්‍රලේඛ අංක ප.පා.කො.01/2023 අනුව බදු අයිතිය පවරා දිම සුදුසු බව ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සඳහා සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට ගරු සභාපතිතුමා විමසන ලදි.එහි දී විරුද්ධවයක් නොමැති බැවින් සභාව එකඟ වු බවට ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අංක13 කඩ කාමරය W.G.මංගොනෝනා මියගේ පුතා වන අයි.උපාලි පුෂ්ප කුමාර ජයලත් බාලසූරිය මයාට බදු අයිතිය පවරා දිම අනුමත කිරිම තීරණය විය.

(iv). මෙම සභාව සතු නව පළමු වෙළඳ සංකීර්ණය පළමු මහල අංක12 කඩ කාමරය W.G.මංගොනෝනා මිය බදු අයිතිකාරිය වන අතර මේ වනවිට ඇය මිය ගොස් ඇත.ඇගේ ස්වාමිපුරුෂයාද මේ වන ජීවතුන් අතර නොමැත.එහෙයින් ඇයගේ පුතා වන අයි.චමින්ද සෙනරත් බාලසූරියට චක්‍රලේඛ අංක ප.පා.කො.01/2023

අනුව බදු අයිතිය පවරා දිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

මෙම යෝජනාව සඳහා සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට ගරු සභාපතිතුමා විමසන ලදි.එහි දී විරුද්ධවයක් නොමැති බැවින් සභාව එකඟ වු බවට ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අංක12 කඩ කාමරය W.G.මංගොනෝනා මියගේ පුතා වන අයි.චමින්ද සෙනරත් බාලසූරියට මයාට බදු අයිතිය පවරා දිම අනුමත කිරිම තීරණය විය.

(V).ලෝක ළමා දිනය නිමිති කර ගෙන සකස් කරන ලද වැඩ සටහන අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

මෙම යෝජනාව සඳහා සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට ගරු සභාපතිතුමා විමසන ලදි.එහි දී විරුද්ධවයක් නොමැති බැවින් සභාව එකඟ වු බවට ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ලෝක ළමා දිනය නිමිති කර ගෙන සකස් කරන ලද වැඩ සටහන අනුමත කිරිම තීරණය විය.

(vi).සෞඛ්‍ය අංශයේ සේවකයින් ඇතුළු කාර්ය මණ්ඩලයේ සියලුම දෙනාම වෙනුවෙන් පැවැත්වීමට යෝජිත සෞඛ්‍ය සායනය සඳහා යන වියදම් ලෙස රු23,000.00 දළ ඇස්තමේන්තුව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

මෙම යෝජනාව සඳහා සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට ගරු සභාපතිතුමා විමසන ලදි.එහි දී විරුද්ධවයක් නොමැති බැවින් සභාව එකඟ වු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ රු23,000.00 දළ ඇස්තමේන්තුව අනුමත කිරිම තීරණය විය.

(vii).සෞඛ්‍ය අංශයේ සේවකයින් සඳහා ලබාදීමට යෝජිත පුහුණුව සඳහා යන වියදම් ලෙස රු57,100.00 ක් දැරීමට සිදු වේ යැයි අපේක්ෂා කරන අතර එය අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

මෙම යෝජනාව සඳහා සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට ගරු සභාපතිතුමා විමසන ලදි.එහි දී විරුද්ධවයක් නොමැති බැවින් සභාව එකඟ වු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
යෝජිත පුහුණුව සඳහා අපේක්ෂා කරන ලද වියදම වන රු57,100.00 ක මුදල අනුමත කිරිම තීරණය විය.

(viii).2006 සිට 2010 දක්වා පළාත් සභා ආදායම් ලෙස තැන්පත් ලේඛනයේ සඳහන්ව ඇති, මේ දක්වා තැන්පත් ලේඛනයෙන් ඉවත් වී නොමැති, රු.1,241,234.89 ආදායමට ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සඳහා සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට ගරු සභාපතිතුමා විමසන ලදි.එහි දී විරුද්ධවයක් නොමැති බැවින් සභාව එකඟ වු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු.1,241,234.89 ක මුදල ආදායමට ගැනිම අනුමත කිරිම තීරණය විය.

(ix).මෙම සභාව සතු පින්නවල අලි අනාථාගාරය ඉදිරිපිට වාහන නැවතුම්පළෙහි සංවර්ධන කටයුතු සිදු කිරිමට නියමිතව ඇත.එහෙයින් 2025.08.18 දින සිට එම දේපල බදුගත් M.P.ලංකා කාන්ති මියට නැවත දැනුම් දෙන තෙක් 2025.08.18 දින සිට මෙම රථගාලේ වාහන වලින් ගාස්තු අය කිරිමේ කටයුතු නවතා තබන ලෙස ලිඛිත දන්වා යවා ඇත.එහෙයින් මෙම රථගාලේ සංවර්ධන කටයුතු අවසන් වන තෙක් බදු ගාස්තු අය නොකිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සඳහා සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට ගරු සභාපතිතුමා විමසන ලදි.එහි දී විරුද්ධවයක් නොමැති බැවින් සභාව එකඟ වු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
මෙම ස්ථානයට අදාළ මුදල 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 182 වගන්ති ප්‍රකාරව කපා හැරිම සඳහා ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යැවීමට තීරණය විය.

(x).රඹුක්කන ප්‍රාදේශීය සභාව සතු පින්නවල ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලාව පිහිටි ඉඩමේ බිම් බදු කුලිය තක්සේරු කර තක්සේරු වාර්තාවක් 2025.08.15 දින අප වෙත දන්වා ඇත. එහෙයින් එම වාර්තාව අනුව පින්නවල ආයුර්වේද මධ්‍යම බෙහෙත් ශාලා ගොඩනැඟිල්ල පිහිටි භූමිය සඳහා 2024,2025,2026 සඳහා වාර්ෂික බිම් බදු කුලිය රු1,750,000.00 ක මුදල ලේඛණගත කර බිල් කිරිම සිදු කර අය කිරිමේ කටයුතු සිදු කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සඳහා සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට ගරු සභාපතිතුමා විමසන ලදි.එහි දී විරුද්ධවයක් නොමැති බැවින් සභාව එකඟ වු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
වාර්ෂික බිම් බදු කුලිය වන රු1,750,000.00 ක මුදල ලේඛණගත කර බිල් කිරිම අනුමත කිරිම තීරණය විය.

(xi).2026 වර්ෂයට මෙම සභාව සතු දේපල හා එලදාව බදු දීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**

එකොළොස් වැනි යෝජනාව සභාව සතු දේපළ සම්බන්ධව කෙසෙල්කැන් වෙළඳපළ ,රඹුක්කන සතිපොළ නැවත ටෙන්ඩර් කරනවාට වඩා ඒවා සභාව විසින් කරගෙන යනවා නම් හොඳ බවත් පවසන ලදි. එහි කෙසෙල් කැන් කිරනවාට එක වෙළෙන්දෙකුගෙන් රු1000.00 ක මුදලක් එකතු කරනවා.ඊලඟට කෙසෙල්කැන් වල නැටි සඳහා මුදලක් ලබා ගන්නවා.එතකොට කවුරු හරි වෙළෙන්දෙක් කෙසෙල්කැන් 1000 kg ක් ගෙනාවොත් අඩුම තරමින් නැටි 50 ක ප්‍රමාණයක්වත් තිබෙනවා. තරාදියෙන් කිරලා බිලක් දෙන අතරම එක කෙසෙල් නැට්ටක් සඳහා රු15.00 කුත් ගන්නවා. එතකොට කිලෝදාහක් වෙළඳපළට රැගෙන එන කෙසෙල්කැන් වෙළෙන්දාගෙන් කෙසෙල්කැන් වෙළඳපළ ටෙන්ඩර් ගත්ත පුද්ගලයා නිකම්ම රු1750.00 ක් ලබා ගැනිම සිදු කරනවා. ඒ නිසා වෙළෙන්දෝ අපට කරනු ලැබූ යෝජනාව තමා කෙසෙල්කැන් පොළෙන් සභවට රු700 ක් පමණ මාසිකව ලබාගන්නා ලෙසට පවසන ලදි. සාමාන්‍යයෙන් සතිපොළෙන් අපි දිනකට රු100.00ක් දැන් අපිට ලැබෙනවා. සභාපතිතුමනි,එම නිසා එකොළොස්වැනි යෝජනාවේ ඇමුණුම 06 යේ අංක 10,11 යන අංක මා සංශෝධනයට ලක් කරනවා සභාව විසින් පවත්වාගෙන යාම සිදු කරන ලෙසට යෝජනා කරනවා. කෙසෙල්කැන් පොළ හා රඹුක්කන සතිපොළ ලක්ෂ දහයට පහළවට ටෙන්ඩර් දෙනවා. ඉන්පසුව එම පුද්ගලයා ඇවිත් මුදල් ලබා ගැනීම පමණක් සිදු කරන බව සඳහන් කරන ලදි. අනෙක් ඒ අයට සතිපොළ ගැන ඒ වගකීමක් නැත. වගකීම් සභාව විසින් ගනු ලබන්නේ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සභාපතිතුමා,10,11 කියන්නේ රඹුක්කන කෙසෙල්කැන් වෙළඳපළයි.රඹුක්කන සතිපොළයි. ඒක අපි විසින්ම කරගෙන යන්නට කියලා තමා එතුමා යෝජනා කරන්නේ. ඇත්තටම මන්ත්‍රීතුමා මෙම යෝජනාව ඔබතුමා සභාපතිතුමාගේ යෝජනාවට තමා අභියෝග කර මේක මේ කරගෙන යන්න කියල කියන්නේ. මේකෙන් සභාවේ අපිට අය වෙන මුදලක් නැතිවෙන එකක් වෙන බවත්, අපිම කරන්නට ගියාම වෙන්නේ සේවක ප්‍රශ්නය එනවා. ඒ වගේ ගැටලු රාශියක් මතු වෙනවා.මේකෙන් ඔබතුමා අදහස් කරපු ප්‍රශ්න තිබෙනවා.බල්බ් දාන එක හරි මොනවා හරි කටයුත්තක් ඒක අපි නිසි ක්‍රමවේදයකට අනුව ඉස්සරහට යමු.ටෙන්ඩර් දැම්ම සිදු කරන විට මේක වගන්තියේ ඇත. මේක ගැන නැත්නම් ඒ වගන්තිට ඇතුලත් කර ගනිමු. ඒ අයට වගකීම පවරා දිමේන් ප්‍රශ්නයක් නැති බව පවසන ලදි.මේකේ රඹුක්කන සතිපොළ ලක්ෂ අටකට ඒ වගේම මුදල් තිබෙනවා. අප විසින් කරන්නට ගියොත් සභාවට අය වෙන එම මුදල ද නැති විමේ හැකියාව තිබෙනවා. ඔබතුමා විසින් සඳහන් කළා ඊට වැඩිය අපි ගන්න පුළුවන් වෙන බවට.අපි මෙහි තිබෙන අඩුපාඩු ටික සකස් කරගෙන ඒ අය සමඟ කථා කර ගනිමු. නැත්නම් මේක ටෙන්ඩර් ගන්න අය කරන්නේ නැත්නම් ඒ කරන විදියට වැඩපිළිවෙල සකස් කරගනිමු. ඒ නැතුව මේක සභාවේ අපි විසින්ම අය කරන්නට ගියොත් එහෙම ලොකු ප්‍රශ්නයක් වෙනවා.පද්මසිරි මන්ත්‍රීතුමා ගිය වාරයේ සඳහන් කරපු යෝජනාවට සමාන යෝජනාවක් තමා මේ තියෙන්නේ. මෙතුමා නැවත මතක් කරන්නේ. ඒ නිසා මේ ගැන අවධානය යොමු කර මේක ටෙන්ඩර් ගන්න පිරිසට දැනුවත් කර ක්‍රමවේදයක් හදාගෙන යමු. ආපසු මේවා අපට කරන්නට ඕනෑ දේවල් නොවන බවත්, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමනි, සභාවක් නොමැති කාලසීමාව තුළ ලේකම්තුමාගේ පාලනය කාලයේ ටෙන්ඩර් දීලා තිබුණේ රුපියල් 80.00 කට. දැන් රුපියල් 100.00 ක් සභාවට ලබා දෙනවා. කෙසෙල්කැන් වෙළඳපොළෙහි ද කලේ ඒ දේම තමා දැන් කෙසෙල්කැන් වෙළඳපොළ රුපියල් 700.00 ලබාදෙනවා.අවුරුද්දක් ලේකම්තුමා කරගෙන ගියා. පොළ කාසි එකතු කිරිම සභාවට කිරිමට නොහැකි නම් මෙම සභාවෙන් වැඩක් නොමැති බව පවසන ලදි.ජලය,විදුලිය වැනි සියලුම දේ සිදු කරන්නේ සභාව විසින් නම් සති පොළ ටෙන්ඩර් නොද මා සභාවෙන් කර ගෙන යාම සුදුසු යැයි යෝජනා කරන බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.වී.ප්‍රියන්ත එදිරිසූරිය මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

### ❖ ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා

ඇමුණුම අංක 06 හි අංක 25 යෝජනාවට අදාළව ටෙන්ඩර් කිරිම සුදුසු ද/නුසුදුසු ද යනුවෙන් සඳහන් කර ඇත.මේ යෝජනාව ස්ථිර වෙන්නේ ඒ දෙකම තිබියදී ද? යනුවෙන් ගරු උපසභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

### ❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

අමාරුවෙන් මෙය කරගෙන යන බවත්,සතිපොළ ක්‍රමවත් කිරිම සිදු කළ යුතු බවත්, ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.කොහොමත් බදු ලබා ගැනිම ඒකාධිකාරයට යන බවත්,එම පුද්ගලයන් සියල්ල තීරණය කරන බවත්,වෙළඳපොළෙහි ප්‍රශ්න තිබෙන බව ද සඳහන් කරන ලදි. සභාපතිවරයා හැටියට මා හට සියලුම දේවල් කිරිමට සිදු වී ඇති බවත්, ටෙන්ඩර් ලබා දිමෙන් නැවත සියලුම දේවල් කරන්නට සිදුවන්නේ සභාවටය.එම නිසා අපි කල්පනා කරන්නේ ඊළඟ අවුරුද්දේ කෙසෙල්කැන් වෙළඳපොලයි, සතිපොළයි විධිමත් ආකාරයට කරන්නටය. සභාව මැදිහත් වෙලා මෙහි පොළකාසි එකතු කරන්නට නිලධාරී මහත්තයෙක් යෙමු කිරිම සුදුසු බවත්,එය පැය දෙකක තුනක රාජකාරියක් කරන්නට තිබෙන්නේ බවත් පවසන ලදි.පසුගිය කාලයේහි සතිපොළ පිරිසිදු කරන්නේ සෞඛ්‍ය කම්කරුවන් හා අපේ වාහන යොදලාය. ඊට පසුව මේ මස දෙක තුනේ සිට ටෙන්ඩර්කරුවා විසින් පිරිසිදු කිරිම් කරමින් සිටින බව පවසන ලදි. අපි නොකරන්නේ මුදල් එකතු නොකරපු එක පමණයි. ඊළඟ මෙහි මහජනතාවට සේවයේ සපයනවා වගේම වෙළෙන්දාටත් ආරක්ෂාව සපයන්න අවශ්‍යයි.මෙම සති පොළ අපි භාරයට ගන්නවා නම් හොඳ බව සඳහන් කරන ලදි. සමීර මන්ත්‍රිතුමා මේකට විරුද්ධ අදහස් දැක්වූ බවත්, මේ සඳහා සභාව මන්ත්‍රීවරු අදහස් ප්‍රකාශ කරන්න ලෙසට ගරු සභාපතිතුමා යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කරන ලදි.

### ❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.ඒ.ප්‍රියමාල් දසනායක මැතිතුමා

මෙහි සත්‍ය කථාව වන්නේ අපේ රටේ සතිපොළ භූමි,මස්කඩ,මාළුකඩ,පොදු වැසිකිළි,රථවාහන ස්ථාන,බදු ලබාගෙන අදායම් මාර්ග විදිහට ටෙන්ඩර්කරුවන් පවත්වාගෙන යනු ලබනවා.දැන් බොහොමයක් අය අපි දන්නවා පසුගිය ඉතිහාසයේ විවිධ දේශපාලන පක්ෂ වලට සම්බන්ධ හා විවිධ සම්බන්ධතා පවතින අය තමයි රථවාහන ගාල් කරන්නේ. පොළ මෙහෙය වන්නේ සම්බන්ධතා තිබෙන අය පමණක් බව පවසන ලදි.ඒ නිසා මම පෞද්ගලික දන්නවා ඉතිහාසය පුරා රඹුක්කන සතිපොළ වැන සියලුම ස්ථාන ලබාගත් අය වෙළෙන්දාට සාධාරණයක් ඉෂ්ඨ කළේත් නැත. සභාවට සාධාරණයක් ඉෂ්ට කළේත් නැත.බොහෝ අය එම මුදල් මග හැරු අවස්ථාවන්ද පවතින බව සඳහන් කරන ලදි. එම නිසා අපි ආණ්ඩුවක් විදිහට තීරණ ගන්න පුළුවන්. ලේකම්තුමා අපි නොමැති කාලයේ කරගෙන ගියා. ඒ නිසා අපි වැඩි ආදායමක් ලබා ගැනීමට දැන් අවධානය යොමු කළ යුතුය.මෙයින් වැඩි ආදායම් ගැනිමට පුළුවන් බවත්, දැන් සිද්ධවෙන සේවාවට වඩා වැඩි සේවාවක් සිදු කිරිමට පුළුවන් බවත්,සඳහන් කරන ලදි.මම ඒකෙන් අදහස් කරන්නෙ නෑ සභාවේ සියලුම ආයතන සභාව විසින් පවත්වා ගෙන යුතු ව බව, නමුත් කෙසෙල්කැන් වෙළඳපළයි,සති පොළයි ඉතා ලේසියෙන් පවත්වාගෙන යන්නට පුළුවන්ද ඒ නිසා ටෙන්ඩර් වලට නොගිහින් මෙය වඩා හොඳන් කරගෙන යාමට හැකි බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.ඒ.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

### ❖ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා

සභාවේ ටෙන්ඩර්කරණයට ක්‍රමවේදයක් තිබෙනවා.ඕනෑම කෙනෙකුට ටෙන්ඩර් ගන්න පුළුවන්ය. ටෙන්ඩර් දැම්මේදී කොන්දේසි වලට එකඟකතාව අනුව ටෙන්ඩර් පෝර්ම් එකට අත්සන් කරන්නේ.අපි සභාවක් විදියට ආදායම් එකතු කරන්නට ගියොත් සභාපතිතුමා අපේ සේවකයෙක් සතියකට දින දෙකක් යොමු කරන්න වෙනවා. එක පැත්තකින් අපිට සභාවේ එදිනෙදා කටයුතු කරගෙන යන එක අපහසු වෙනවා.අපි සතිට දින දෙකක් කියන්නේ මාසයක් දැම්මොත් ඔහුට තිබෙන වගකීම් වලින් දවස් අටක් පස්සට යනවා. මම දන්නා ආකාරයට විවෘත ටෙන්ඩර් එකක් ලබා දෙන්නේ. වැඩි මිලටය. මේක අනුමත කිරිමෙන් සියලුම දෙනාට ප්‍රශ්නයක් වෙන්නේ නැත.එයින් ඔබතුමාගෙත් ඔළුව නිදහස්ය. අපි සභාව විදිහට සම්මත කරනවා. කෙසෙල්කැන් වෙළඳපොළ එතකොට අපේ සේවකයෙක් උදේ 5.30 වෙනකොට සේවකයා එතැන සිටිමට අවශ්‍යයි. උදේ 5.30 ත් 7.00 අතර සභාවේ නිලධාරි කෙනෙක් යෙදවිමත්,එසේ නොමැති වු විට කෙසේකැන් ටික විකිණිලා ඉවරයි. එතකොට සභාවට එන ආදායම නැතිවෙලා යනවා. ඒ නිසා ගන්න පුද්ගලයා ජ.වි.පෙ ද,ස.ජ.බෙ ද යන එක අදාල නොවන බවත්,වැඩි මිලට ඇවිත් තිබෙනම් ඒ මිලට ලබා දෙනවා.ඒ නිසා සභාවේ තනි තීරණයකට යනවාද? නැතිනම් ලංසු කැඳවලා මෙය වැඩපිළිවෙලක් හැටියට සකස් කරලා කර ගෙන

යනවද? කියන ඒක තමා තීරණය කරන්න ඕන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

දැන ගතයුතු කරුණු දෙකක් තිබෙනවා.
1.සභාවෙන් කිරිමට එකගවෙනවා ද?
2.ටෙන්ඩර් ක්‍රමයට යනවාද ?
මෙම කරුණු දෙකෙන් තීන්දුවක් ගන්නා ලෙස ගරු සභාපතිතුමා, විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

කරුණු දෙකක් ගැන අදහස් විමසුවා.ඒ වගේම කෙසෙල්කැන් පොළ හා සතිපොළ ටෙන්ඩර්කරණය ගත්තොත් සතිපොළට පාරිභෝගිකයන් විශාල වශයෙන් පැමිණෙනවා.ඒ අයගෙනුත් ප්‍රශ්න ටිකක් එනවා. ඒ නිසා මේක මන්ත්‍රීතුමන්ලාගෙන් ඉදිරිපත් වෙන්න මම අදහසක් දෙන්න කැමතියි. අපි කෙසෙල්කැන් වෙළඳපොළ මේ විදිහටම ටෙන්ඩර් කරගෙන යමු. 2026 අපි නියමු ව්‍යාපෘතියක් වශයෙන් අරගෙන බලමු. සතිපොළේ තිබෙන අඩුපාඩු හදලා එකට ප්‍රශ්න තිබෙනවා.ඒ නිසා ඒ අඩුපාඩු ටික අපි හදලා 2026 වර්ෂයට යථා තත්ත්වයට පත් කර 2027 ඒක නැවත සභාවේ පාලනයට අර ගෙන ඔබතුමා කියනවා වගේ නැට්ටත් අලෙවි වෙනවා නම් කෙසෙල්කැන් වෙළඳපොළත් ඒ ආකාරයට ගනිමු.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

තව ප්‍රශ්නයක් එනවා නිලධාරින්ට ප්‍රශ්නයක් එනවා. දේශපාලනයේ රාජකාරීය ඒකනේ. දැන් ඊළඟට මන්ත්‍රීතුමා පැවසු ආකාරයට අක්‍රමිකතා තිබෙනවා. කඩ හිමියන් පැමිණ යම්කිසි මුදලක් ලබාදී අත්සන් කර කඩ අරගෙන තිබෙනවා.හැබැයි වැඩි මුදලකට තමා අරන් තිබෙන්නේ.සති පොළ විධිමත්ව කරගැනීමට අවශ්‍යයි. ඒ නිසා මට මේ ගරු මන්ත්‍රීවතුමන්ලා/තුමියන්ලාගෙන් ඉල්ලා සිටිනවා. අපිට අවස්ථාවක් දෙන්න ඊළඟ අවුරුද්දේ සභාවෙන් මුදල් එකතු කරලා පොල ක්‍රමවත් කර, මොකක් හරි නීති ක්‍රමයක් සකස් කර,හෝ වෙන හොඳ ක්‍රමයකට අනුව කිරිමට.මේකට බෙදීමකට යන එක මන්ත්‍රී කණ්ඩායමක් විදිහට හොඳ මදි බවත්, ඔබතුමාලාගේ පැත්තෙන් කියන්නේ මේක ඒකමතිකව සම්මත කරනවද? නැත්නම් බෙදීමකට යනවාද? කියලා අපිට අවස්ථාවක් දෙන්න. යනුවෙන් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සභාපතිතුමා, ඇත්තටම මේක බෙදීමකට ගියොත් හොඳ බවත්, අපි කණ්ඩායමක් විදිහට මේක පැහැදිලි කරලා කීවේ.සභාවක් විදියට අපි මේ කාරණය කරන්නට ගියොත් සභාවක් හැටියට අපි අමාරුවේ වැටෙනවා. මොකද පසුගිය කාලයේ ආර්ථික අර්බුදයක් ආවා. රටේ ඒකෙදි විවිධ මතිමතාන්තර ආවා. මේ ආර්ථික අර්බුදයට විවිධ හේතු ඇවිත් තිබුණා. විවිධ ආයතන රජය විසින් ව්‍යාපාර කටයුතුවලට නැඹුරු වීමත් එක්ක ආපසු ප්‍රශ්න තිබුණා කියන කාරණය එලෙසම පැමිණියා.ඒ වගේ තැනකදී අපි මේ වගේ දෙයකට නැඹුරු වෙනවා නම් අප ලොකු අවධානමක් ගන්න වෙනවා ඒ නිසා ඒ අවදානම ඔබතුමාලාට ගැනිමට හැකියාවක් තිබෙන නිසා මේ අවදානම ඔබතුමා ගන්න සූදානම් නම් අපි ඒකට සුබ පතනවා. ඒ වගේම මේකේදී විශේෂයෙන් සඳහන් කරන්න ඕන. සති පොළ ටෙන්ඩර්කරුවන් ලබා ගැනිමේදී ආක්‍රමිතා සිදුවුණා.ඒක මැඩ පවත්වා ගන්න ඒක සභාවක් විදිහට අපිට කරන්නට පුළුවන් කාරණයක් මොකද? මොනවා හරි අඩුපාඩුවක් තිබෙනවා නම් ඒ අය සමඟ ගිවිසුම් ගත වී තිබෙන්නේ නිසා එම ගිවිසුම්ගත ටෙන්ඩර්කරුවන් ඉවත් කිරීමේ හැකියාවක් තිබෙනවා.එහෙත් අපිට ඒ ප්‍රශ්න එන්නේ නැති වෙයි කියලා හිතනවා. නමුත් ඔබතුමාලා විශ්වාස කරනවා නම් මේක සභාවක් විදිහට අපිට කරගෙන යන්න පුළුවන් කියලා ඒකට අවස්ථාවක් දෙන්න අපි ලැස්තියි. ප්‍රශ්නයක් නැති බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා**

සති පොළේහි සියලු කටයුතු කරන්න සභාවක් විසින් පොළ කාසි එකතු කිරීම විතරයි නොකරන්නේ. නමුත් අනෙක් සියලු කටයුතු වතුර ටික,විදුලිය ,අපද්‍රව්‍ය එකතු කිරිම වැනි සියලු දේ කරන්නේ සභාව විසින් ප්‍රශ්නයකට තිබෙන්නේ පොළ කාසි එකතු කරන එක විතරයි. අපගේ අදහස් කෙසෙල්කැන් වෙළඳපළ,සතිපොළ තව අවධානයට යොමු කරන්න ඕන.පින්නවල රථගාල මොකද සංචාරක ව්‍යාපාරය නිසා රථගාලේ මුදල් එකතු කිරිම පිළිබඳ ගැටලු තිබෙනවා. රුපියල් 500 ක් එකතු කරන්නට ඕනෑ තැන රුපියල් 1000 ක් එකතු කරනවා. ඒකෙන් වෙන්නේ ප්‍රාදේශීය සභාව අපකීර්තියට පත් විම.ඒ නිසා රථ ගාලා අරගෙන

එකතු කිරීමේ සියලු දේවල් සභාව විසින් කිරීමත්, ඊළඟට පොදු වැසිකිළියේ ටිකට් එක තිබුණට මුදල් එකතු කිරීමෙන් ගැටලුවක් තිබෙනවා.ඊට අමතරව පින්නවල රථගාල ගැන අවධානය යොමු කර තීරණයක් ගන්නා ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී.පද්මසිරි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සභාපතිතුමා, අපි සභා දේපළ ටෙන්ඩර් කරනවා නම් ඔහුට යටිතට පහසුකම් සභාව විසින් සැපයීම සිදු කළ යුතුයි. ඔහු ගන්නේ වෙළෙඳ වපසරිය පමණයි. කුණු අර ගන්න හා ගෙනිහින් දමන්න අපි ටෙන්ඩර් දෙන්නේ නැත. එතකොට සතිපොළෙහි ඔවුන්ගේ කාර්යය වන්නේ වෙළෙඳ මහතුන්ගෙන් මුදල් අය කරගෙන සභාවට යම්කිසි මුදලක් දීම.ඒක කඩ හිමියන්ගේ මාසෙකට හෝ සතියකට හෝ ලැබෙන මුදලක්නේ. ඔහු ගන්නේ එතකොට මේක ශුද්ධ කරන්නේ කවුද? ටෙන්ඩර් කරන්නේ කවුද කියන එක ටෙන්ඩර් කරන්නේ නැත. සභාවක් විදිහට අපි එය කළ යුතු දෙයක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

රුක්මන් මන්ත්‍රීතුමාගේ කතාවට අදහසක් ඉදිරිපත් කරන්නට මමත් නැගිටියේ මොකද? අපි සභාවක් වශයෙන් යම්කිසි දේපළක් බදු දුන්නට පස්සේ ටෙන්ඩර් කරලා එයාගේ ඉලක්කය කරා යනවා.සභාව සභාවක් විදියට අපිට කරන්නට තිබෙන්නේ කුණු ටික එකතු කිරීමය.අපි කුණු බදු දෙන්නෙ නැත. ඒ කුණු ටික එකතු කිරීම සභාවක් වශයෙන් කරන්න ඕනෑ. ඒ කරන කොට අපි එතෙන්ට අවශ්‍ය වැඩ පිළිවෙල හදලා දුන්නා නම් පොළ හරියට ක්‍රියාත්මක වෙනවා.පොළ කාසි එකතු කිරීමට ගියාට පසුව අපිට මේ සල්ලි ටික එන්නත් පුළුවන් නොයෙන්නත් පුළුවන්.අවුරුද්දක් හරි අපි මේකට ටෙන්ඩර් කරලා ටෙන්ඩර් ගාන වැඩි කරලා දෙන කොට සභාවට යම් කිසි ඉලක්කයක් කර ගන්න පුළුවන් අපිට මෙච්චර ඇස්තමේන්තුවකට යන්න කියලා අවුරුද්දට හදාගන්න පුළුවන්. අපි පින්නවල අලි අනාථාගාරය ළඟ රථ ගාල ගන්න ගියාට පස්සේ එතැන අර මන්ත්‍රීතුමා කීවා රු1000 ක් ගන්නවද රු1500 ක් ගන්නවා කියලා ඒකට විපල්පයක් තිබෙනවා. සභාවේ ටිකට් පොතක් ගහන්න ඕනේ. බස් එකකට මෙච්චරයි ,කාර් එකකට මෙච්චරයි කියලා ප්‍රදර්ශනය කරන්න. එතකොට බදු ගන්න එක්කෙනාට වැඩියෙන් ගන්න බැරි වෙනවා. අපි හරියට ක්‍රියාත්මක වෙන්නේ නැතුව මෙතන කවුරු ගියත් ඔය මාපියාව සිදු වෙනවා. පොළෙහි මුදල් ටික එකතු කිරීමට ගියාට පසුව වෙන්නේ එකමයි.කෙසෙල්කැන් වෙළඳ පොළට උදේ පාන්දර හතරට කෙසේල්කැන් එනවා. ගරු මන්ත්‍රීතුමා සේවය සපයන කෙනාට ඒ වෙලාවට එන්න පුළුවන් ද? හැන්දෑවේ හතට කෙසෙල්කැන් එයි.මහ දිගට මිනිස්සු කෙසේකැන් ටික ගන්නවා. පොළට ආදායමක් එන්නේ නැහැ. ඒ කට්ටිය එන්නේ ඉලක්ක කරගෙන අහවල් වෙළඳපොළට හැන්දෑවේ පහට ගියා නම් වෙළඳාම හොඳයි කියලා ඒ මිනිස්සු එනවා බලාගෙන ඉඳලා තමා එන්නේ. එයාලට මහ දී ගණන් දුන්නට පස්සේ පොල් කාසි කඩන්නේ කාටද? ඊට වැඩිය හොඳයි පොළ බදු දීලා අපි යම්කිසි ආදායමක් ගන්නවා නම්. පොළ එයා වෙනුවෙන් අපි ශුද්ධ පවිත්‍ර කරන එක සභාවේ යුතුකමක් අනෙක් එක අපි කඩ කාමරයක් දෙනවා රු1500 කට මම කඩේ ගන්නවා.මට ඕනෑම විදහට මම දෙනවා රුපියල් දෙදාහකට එකට සභාවට කතා කරන්න දෙයක් නැත.ඒක හම්බ කිරීමකට යන ගමනක් සභාවේ ටෙන්ඩර් කරන ක්‍රමවේදයක් තිබෙනවා. කඩේ වටින්නේ රු1500 ට නම් මම රු1500 කට ගන්නවා එය වැඩියෙන් රු 2000 ඉල්ලී කරොත් දෙනවා. මම ගෙදර ඉන්නවා. ටෙන්ඩර් පටිපාටියට බදු නොගෙන රජයේ දේපල බදාගෙන කරන්නට ගියාම කර ගැනිමට නොහැකි බව පවසන ලදි. මට දැනෙන විදියට කරන්න පුළුවන් දේවල් තිබෙනවා බැරි දේවල් තිබෙනවා. මම කියන්නේ ටෙන්ඩර් පටිපාටියට ගිහිල්ලා ඒ වැඩපිළිවෙල හරියට ක්‍රියාත්මක කරනවා නම් හරි කියන එක තමා මගේ අදහස යනුවෙන් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේක දිගින් දිගටම ගෙන යාම සුදුසු නැත.ටෙන්ඩර්කරණයට අපි එකඟ නොවේ මොකද රු1500 ක් දීලා රුපියල් 2000 කට දෙනවා නම් සභාවක් විදියට ලැජ්ජාවට පත් වෙන්න ඕන. පනතේ තිබෙනවා දෙවන පාර්ශ්වයකට නඩත්තු කරන්න දීමට නොහැකි බව රුපියල් 1500 කට තමා එයාලට දෙන්න පුළුවන්. එතකොට කුණු ශුද්ධ කරන එක බලා ගැනිමට නොහැකි කිවට ගිවිසුමේ තිබෙනවා. පිරිසිදු කිරිමට අවශ්‍ය බව ඒක කරන්න ඕනේ කියලා හැබැයි ගිවිසුමේ තිබෙනවා.අපේ සතිපොළ සම්බන්ධයෙන් තීන්දුවක් ගන්න සභාවෙන් කර ගෙන යවනද?බදු දෙනවද?කියන එක අපිට කරගෙන යන්න අවස්ථාව දෙනවද යනුවෙන් ගරු සභාපතිතුමා පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

මොකක්ද මේ මන්ත්‍රීතුමාලා ප්‍රකාශ කළා දේශපාලන බලය මත මේක ලබා දුන්න බවට යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සභාපතිතුමා ප්‍රකාශ කළේ සභාවෙන් කරගෙන යාමට එකහද? කියල ද ? යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

අපි සතිපොළ අවුරුද්දක් කරලා බලමු යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඔබතුමාලාගේ අදහස් පවසන ලෙස ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මේක කිරීමට නොහැකිය. දාපු තර්කයට යාම ඔබතුමාට හැකියාවක් තිබෙනවා නම් අවුරුදු 18 ට මේකට සභාව නිලධාරී දමා කරන්න හැකියාව තිබෙනවා නම් ඒ වගේම හැකි වුණොත් අපිට අධිභාරයක් එයිද මොකද ටෙන්ඩර් මුදල ලක්ෂ දහයක් තියන්නේ අධිභාරයක් එන්න පුළුවන් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපට තීන්දු ගන්න පුළුවන්.වැඩක් කරන්න පුළුවන්. පුරෝකථනය කරන්න පුළුවන්. ඒක හරියට වෙන්න පුළුවන්. නරක වෙන්නත් පුළුවන්. වැරදි නිවැරදි කරන කරන්න පුළුවන්. අපි මාසයක් දෙකක් බලමු පුළුවන්ද බැරිද කියලා බැරිනම් ඊළඟ විකල්පයට යන එක සුදුසු බවත්,පවසන ලදි. ඒ නිසා පරණ දේවල් වල ඉඳලා වැඩක් නැති නිසා ඔබතුමාලාගේ විරුද්ධත්වයක් තිබෙනවා නම් පවසන ලෙසට ගරු සභාපතිතුමා සභාවට දැනුම් දෙන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ඡන්ද විමසීමකට යන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එහෙනම් බෙදීමකට යමු රඹුක්කන සතිපොළ සභාව විසින් ටෙන්ඩර් නොකර පොළ සල්ලි එකතු කරනවා කියන එකට පක්ෂව ඡන්දය ලෙසත්,ඉන්පසු ටෙන්ඩර් කරනවා කියලා කියන එකට කැමති අය ඡන්දය ලෙසත්, ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම් දෙන ලදි.ඉන් අනතුරුව

රඹුක්කන සතිපොළ සභාව විසින් ටෙන්ඩර් නොකර පොළ සල්ලි එකතු කරන එකට පක්ෂව ඡන්දය 20 ක්ද විපක්ෂව ඡන්ද 10 ක්ද ඡන්දය දීමෙන් වැළකී සිටීම 07 ක් ලෙසද සඳහන් විය. ඒ අනුව වැඩි ඡන්ද 20කින් රඹුක්කන සතිපොළ සභාව විසින් ටෙන්ඩර් නොකර පොළ සල්ලි එකතු කරන තීරණය විය. ඒ අනුව සතිපොළ සභාව විසින් ජනවාරියේ සිට නඩත්තු කරන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශයට පත් කරන ලදි.

ඊළඟ ප්‍රශ්නය අලිඅනාථාගාරය.ඒක නඩත්තු කරන්නේ සභාවෙන් මෙහෙම කිරීමට හේතුව තමා අපේ පත්මසිරි මන්ත්‍රීතුමා පෙන්වා දුන් කාරණාව සත්‍ය නිසා. නියමිත මිල ගණන් නැත. විනයක් නැත. හිතෙන ගණන් ගන්නවා. මේ ආකාරයට අපි බෝඩ් එකක් දානවා මේ ආකාරයට තමා ගණන් පවතින්නේ කියලා. එතකොට ගිවිසුම් ප්‍රකාරව පැයකට මෙච්චරයි ගන්නේ යනුවෙන් ප්‍රකාශයට පත් කිරීමෙන් කිසිම කෙනෙකු ගැටලුවක් වෙන්නෙ නැති බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

මෙහි මුං කොටුව සුසාන භූමියේ එළදාව ටෙන්ඩර් කිරීම සුදුසු ද/නුසුදුසු ද කියලා තිබෙන බව පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මුං කොටුව සුසාන භූමිය.ඒ වගේ ම පහළවල්පොළ සුසාන භූමිය දැනට කැළැවැහිලා ඇත.ඒවා බදු දීමට සුදුසු නැත.ඒ නිසා තමා සුදුසු ද/නුසුදුසු ද කියලා දමා ඇත්තේ.ඊට අමතරව සහා දේපළ බදු දිමට තිබෙනවා.ඊළඟ අවුරුද්දට බදු දීමට ඇති ටික තමා මේ දමලා තිබෙන්නේ.එතකොට රඹුක්කන සතිපොළ සහ අලි අනාථාගාරය ටෙන්ඩර් නොකර අනෙක් ඒවා ටෙන්ඩර් කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

තීරණය -
රඹුක්කන සතිපොළ ,අලි අනාථාගාරය ඉදිරිපිට වාහන නැවතුම්පළ හා පොදු වෙළඳපළ තුළ පිහිටි මස්,මාළු කඩ කාමර 06 හැර අනෙකුත් දේපළ බදු දිමට තීරණය විය., මුං කොටුව සුසාන භූමියේ එළදාව බදු දිම, පහළවල්පොළ සුසාන භූමිය හැර අනෙකුත් පලදා භූමි ටෙන්ඩර් කිරිමට අනුමත කිරිම තීරණය විය.

(xii).අත්‍යවශ්‍ය මහජන ඉල්ලීම් ඉටු කිරිම -2025 යටතේ මහීපාල හේරත් මාවත අබලන් වී ඇති කොටස අලුත්වැඩියා කිරිම රු450,000.00 ව්‍යාපෘතිය 2024 භාණ්ඩ,වැඩ,හා උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය යොමු අංක 3.1.9 යටතේ වැඩ කොන්ත්‍රාත්තු සඳහා ප්‍රජා සහභාගිත්වය අනුව ගිවිසුම් ගතව කාර්ය ඉටු කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහමම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මෙම යෝජනාව සඳහා සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට ගරු සභාපතිතුමා විමසන ලදි.එහි දී විරුද්ධවයක් නොමැති බැවින් සභාව එකඟ වූ බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු450,000.00 ක ඇස්තමේන්තුව අනුමත විම හා යොමු අංක 3.1.9 යටතේ වැඩ කොන්ත්‍රාත්තු සඳහා ප්‍රජා සහභාගිත්වය අනුව ගිවිසුම් ගතව කාර්ය ඉටු කිරිමට තීරණය විය.

(xiii).අත්‍යවශ්‍ය මහජන ඉල්ලීම් ඉටු කිරිම යටතේ හීනාබෝව ඉහළවෙල මාර්ගය ගම්මැද මාර්ගය බොරළු දමා සකස් කිරිමේ ඇස්තමේන්තුව - රු76,700.00 ක මුදල අනුමත කිරිම හා භාණ්ඩ,වැඩ,හා උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2024 යටතේ යොමු අංක 3.1.9. අදාළ වැඩ කොන්ත්‍රාත්තු වලදී ප්‍රජා සහභාගිත්වය ලබා ගැනිම සඳහා ප්‍රජා සංවිධානයක් මඟින් ගිවිසුම ගත විමටත්,ක්‍රියාත්මක කර ඉටුකරවා ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහමම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
මෙම යෝජනාව සඳහා සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට ගරු සභාපතිතුමා විමසන ලදි.එහි දී විරුද්ධවයක් නොමැති බැවින් සභාව එකඟ වූ බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
රු76,700.00 ක ඇස්තමේන්තුව අනුමත විම හා යොමු අංක 3.1.9 යටතේ වැඩ කොන්ත්‍රාත්තු සඳහා ප්‍රජා සහභාගිත්වය අනුව ගිවිසුම් ගතව කාර්ය ඉටු කිරිමට තීරණය විය.

(xiv).2025 වර්ෂයේ සභා අරමුදලින් ක්‍රියාත්මක කිරිමට යෝජිත පහත සඳහන් ව්‍යාපෘති සඳහා 2025.08.05 දින මහ සභාවේ අනුමැතිය ලැබී ඇත.එහි කර්මාන්ත සඳහා භාණ්ඩ,වැඩ,හා උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2024 යටතේ අදාළ වන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සඳහා වන යොමු අංක 3.1.9 අදාළ වැඩ කොන්ත්‍රාත්තු වලදී ප්‍රජා සහභාගිත්වය මත ගිවිසුම් ගත වීම හා කර්මාන්ත ඉටු කිරිම

සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.
1.කොම්පෝස්ට් අංගනය අලුත්වැඩියා කිරිම - රු1,340,000.00
2.හේනේපොල ඊරියගොඩ මාර්ගය බොක්කු බට යොදා සංවර්ධන කිරිම- රු120,000.00
3. කාඩවට්ටිය ,වල්පොල වත්තේ ලක්ෂ්මන් ජයරත්න මහතාගේ නිවස අසල ආනන්ද මහතාගේ නිවස ඉදිරිපිට අතර ඇති මාර්ගය සංවර්ධනය කිරිම - රු310,000.00
4. ඉහළගම ප්‍රධාන මාර්ගයේ ගල්වැටිහේන වැරැල්ල දක්වා මාර්ගය සංවර්ධනය කිරිම - රු240,000.00
5. කුරෙම්පොළ මාර්ගය හා මොට්ටප්පුලිය මාර්ගය යා කෙරෙන වෙළ මැද ඇති මාර්ගයේ ඉතිරි කොටස ඉදිකිරිම - රු230,000.00
6. කෙසෙල්වතුගොඩ සිට මල්බෙරිවත්ත දක්වා මාර්ගය සංවර්ධනය කිරිම - රු475,000.00
7.කොටගම හිරිවඩුන්න ප්‍රධාන මාර්ගයට සම්බන්ධවන R.M.රත්නායක ජයවර්ධන මහතාගේ නිවස අසලින් ආරම්භ වන හිටිනාවත්ත පාර සංවර්ධනය කිරිම - රු310,000.00
8. ගබ්බල උතුර වල්පොල පාර සංවර්ධනය කිරිම - රු390,000.00
9. දඹරහේන ඔයට බසින ස්ථානයේ පඩිපෙල ඉදිකිරිම - රු400,000.00
10. මුද්දනාව පන්සල් මාර්ගය සංවර්ධනය කිරිම - රු260,000.00
11.පලොල්ගහ මුල හන්දියේ සිට හල්පිටිය දක්වා යන අතුරු මාර්ගය සංවර්ධන කිරිම - රු500,000.00
12.බොලගම කනත්ත පාර කැඩි ඇති බොක්කුව අලුත්වැඩියා කිරිම - රු425,000.00

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සඳහා සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට ගරු සභාපතිතුමා විමසන ලදි.එහි දී විරුද්ධවයක් නොමැති බැවින් සභාව එකඟ වු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

අදාළ ඇස්තමේන්තු සහිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
ඉහත ඇස්තමේන්තු අනුමත කිරිම විම හා යොමු අංක 3.1.9 යටතේ වැඩ කොන්ත්‍රාත්තු සඳහා ප්‍රජා සහභාගිත්වය අනුව ගිවිසුම් ගතව කාර්ය ඉටු කිරිමට තීරණය විය.

xv. 2025 වර්ෂයේ පළාත් සභා ව්‍යාපාති ක්‍රියාත්මක කිරිම.
01.ග්‍රාමීය යටිතල පහසුකම් සංවර්ධන වැඩසටහන - 2025 යටතේ අලගල්ල ප්‍රවේශ මාර්ගය සංවර්ධනය කිරිම - රු2,000.000.00

02.පළාත් පාලන මාර්ග සංවර්ධන වැඩසටහන - 2025 යටතේ යෝධගම වලව්වත්ත මාර්ගය සංවර්ධනය කිරිම - රු1,250,000.00

03. පළාත් පාලන මාර්ග සංවර්ධන වැඩසටහන - 2025 යටතේ අන්දිරමඩ ඕවෙල මාර්ගය සංවර්ධනය කිරිම- රු1,250,000.00

04.වතුයටිතල පහසුකම් සංවර්ධනය -2025 යටතේ රඹුකකන වලල්ගොඩ ග්‍රාම නිලධාරි වසමේ මල්මීය පේලි නිවාස දක්වා මාර්ගය සංවර්ධනය කිරිම - රු1,930,000.00

05. පළාත් පාලන සේවා පුනරාවර්තන - 2025 යටතේ කුරෙම්පොල මෛත්‍රී මාවත ප්‍රතිසංස්කරණය කිරිම - රු550,000.00

06. පළාත් පාලන මාර්ග සංවර්ධන වැඩසටහන - 2025 යටතේ සනිමේට්වත්ත 2 පටුමඟ කොන්ක්‍රීට් කිරිම - රු500,000.00

07. පළාත් පාලන මාර්ග සංවර්ධන වැඩසටහන - 2025 යටතේ කොන්ගස් හන්දිය කුරුදු වත්ත මාර්ගය සංවර්ධනය කිරිම - රු2,000,000.00

08. පළාත් පාලන සේවා පුනරාවර්තන - 2025 යටතේ සියඹලන්ගමුව කටුපඳුර හේවාදිවෙල මාර්ගය අලුත්වැඩියා කිරීම -රු500,000.00

පළාත් සභා අරමුදල් යටතේ ඉහත සඳහන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා භාණ්ඩ,වැඩ,හා උපදේශන නොවන සේවා සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2024 යටතේ යොමුව 3.1.9. ට අදාළව ප්‍රජා පාදක සංවිධානය වෙත කුඩා පරිමාණ කොන්ත්‍රාත් පිරිනැමීම් කටයුතු සිදු කිරීමටත්,ක්‍රියාත්මක කරවා කාර්ය ඉටුකර ගැනිමට අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මේ සංවර්ධන යෝජනා වලට විරුද්ධත්වයක් නැත.අපි ප්‍රතිපාදන 2025 අවුරුද්දට නැතිනම් පසුගිය සභාවේ අයවැය ලේඛනයේ සඳහන් කළාද?අපිට ගැටළුවක් තිබෙනවා.යෝජනා අනුව වියදම් කිරීමට බලතල තිබෙනවා ද? කියලා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පසුගිය වර්ෂයේ ලේකම්තුමා විසින් අයවැය වාර්තාවක් සකස් කර ලබා දි ඇත. සභාවේ කටයුතු කිරීමට කරුණු ගණනාවක් සඳහා වැය ශීර්ෂ වෙන්කර ලබා දී තිබුණ බවත්, ඉන්පසු අපි යෝජනාවලියක් සකස් කර ආණ්ඩුකාරතුමියට ඉදිරිපත් කළා එම යෝජනා සඳහා අනුමැතිය ද ලබා දී ඇත්තේ ලක්ෂයේ ව්‍යාපෘති ලෙස ඒ අනුව එම ව්‍යාපෘති වල නම මෙසේ හැඳින්වෙන බව පවසන ලදි.පසු එම ව්‍යාපෘති ලක්ෂයෙන් කිරීමට නොහැකි නිසා ලක්ෂ 20 දක්වා ව්‍යාපෘති එකතු කිරීමට අනුමැති ලබා දුන්නා ඊළඟට ලක්ෂ 05 දක්වා හා ලක්ෂ 05 ට වැඩි ඒවා සහා අනුමැතිය අරගෙන කිරීමට දන්වා ඇති අතර එම යෝජනා තමා මෙම යෝජනා බව ගරු සභාපතිතුමා පවසන ලදි. අපි සභාවට පැමිණීමට කලින් පළාත් සභාවෙන් ප්‍රධාන අමාත්‍යාංශයෙන් ව්‍යාපෘති ඇවිත් තිබුණ බවත්, ඒවා නිලධාරින් හා මහජන ඉල්ලීම් අනුව යෝජනා වී ඇති බවත් පවසන ලදි.අංක 15 යටතේ 2025 වර්ෂයේ පළාත් සභා ව්‍යාපෘති වශයෙන් යෝජනා 08 තිබෙන ඒවා බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

පළාත් සභාවේ පළාත් පාලන ආයතන වලට මුදල් ඉල්ලීම් කර ඇත්තේ මහජන නියෝජිතයන් නොමැති නිසා ආණ්ඩුකාරතුමිය සමඟ එකතු වී සභාව කටයුතු කළත් දැන් මහජන නියෝජිතයන් පත් වි ඇති බව පවසන ලදි.පත් වූ පසු තීන්දු තීරණ ලබා ගන්නේ සභාව විසින් බවත්,ආණ්ඩුකාරතුමිය නොවන බවත් පවසන ලදි.එතකොට අපිට ලැබිය යුතු මුදල පළාත් සභාවෙන් ලබා දීමට අවශ්‍යයි.එසේ ලබා දුන් පසු තීන්දුව අනුව අපි ලබා ගන්නවා නම් ලබා ගන්නවා. ඔබතුමා පවසා තිබුණා මේ අපේ මුදල් නොවේ.පළාත් සභාවේ මුදල් ලෙස පළාත් සභාවෙන් ආයතනයට ලැබෙන මුදල් යෝජනා කර අනුමත කරන්නේ ජනතා නියෝජිතයන් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ ඔක්කොම අපේ මුදල්ය.රටේ මුදල් වියදම් කිරීමට පිළිවෙලක් තිබෙනවා.ඒ ක්‍රමයට අනුව වෙලා තිබෙන්නේ බව පවසන ලදි.ඔබතුමාට ප්‍රශ්නයක් තිබෙනවා නම් විගණනයට දමලා විසඳ ගැනිම සිදු කර ගන්න.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

අපි ඉල්ලීමක් සිදු කරනවා මන්ත්‍රීතුමන්ලා දාහත්දෙනා සඳහා ප්‍රතිපාදන ලබා දෙන ලෙසට, අපගේ ගම්වල අයගේ කැමැත්ත මත ඒක අපිට ඉටුකර දෙන්නට පුළුවන් බව පවසන ලදි.ආණ්ඩුකාරතුමියගේ යෝජනා වෙලා නිසා අපිට කර ගැනිමට හැකියාවක් නොමැති බැවින් ඔබතුමා යෝජනාවක් ගෙනවිත් ලක්ෂ 05 ක පමණ ලබා දෙන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ලක්ෂ 05 ක් ඉල්ලීම් සිදු නොකරන ලෙසත්,යෝජනා ඉදිරිපත් කරන ලෙසත් දැනුම් දෙන ලදි.ඉතිහාසයේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සිදු ආකාරය පිළිබඳ මම නොදන්නා බවත් පවසන ලදි.දැන් හැම ව්‍යාපෘතියක් සඳහාම සක්‍යතා අධ්‍යනයක් සිදු කළ යුතු බවත්,හොඳ නරක තෝරා ගැනිම සිදු කිරීම,ප්‍රතිලාභීන් ප්‍රමාණය,පසු ප්‍රතිඵලය යන කාරණා ගැන බැලීම සිදු කළ යුතුය. ඉන්පසු පළාත් සභාවෙන් හෝ මධ්‍යම ආණ්ඩුවෙන් අනුමත කර දීම සිදු කරන්නේ එසේ නොමැති නම් ලබා දීමට නොහැකි බවට පවසන ලදි.ඔබතුමා මතු කළ කාරණය

නිසා මෙය පවසන බව ගරු සභාපතිතුමා සඳහන් කරන ලදි.ප්‍රධාන අමාත්‍යාංශයට යන්නට අවස්ථාවක් හම්බවුණා එහිදී බස් නැවතුම්පොළ ගැන පවසන විට අනුමත කර දෙන බව පැවසුවත්,මුදල් ලබා දීම සිදු කරන්නේ පසුව බව සඳහන් කරන ලදි.කවුරුවත් දන්නේ නෑ බස් නැවතුම්පොළෙහි අයිතය පවතින්නේ කටද කියලා මෙහි එක කොටසක් පුද්ගලයකුට විකුණා ඇත.එහි අයිති ලබා ගැනිමට රජයට හා ලංකා ගමනා ගමන මණ්ඩලයට මොකක් හරි වෙලා එය මාර්ගස්ථ මඟී ප්‍රවාහන අධිකාරියට භාර දී තිබෙනවා.කඩකුලී ලබා ගැනිමට හා නිල අයිතිය සී.ටී.බී.එකට එම නිසා යෝජනා භාර දෙන්න සක්‍යතාව මොකක්ද කියලා සොයා බලා අනුමත කරන බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

සභාපතිතුමා අපිට ලිඛිතව මොකක් හරි ලබා ගැනිමට පුළුවන් ද ? යනුවෙන් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

එය ලිඛිතව ලබා ගැනිමට මම නොදන්නා බවත්,අපි දන්නේ නිල අයිතිය තිබෙන්නේ සී.ටී.බී.එකට කියන එක පමණයි.ප්‍රශ්නය තිබෙන්නේ නිල අයිතිය සොයන විට වැඩිපුර අයිතිය පවතින්නේ සී.ටී.බී.එකට බව පවසන ලදි.මම අවුරුදු දෙකකට කලින් මෙය මතු කළා දැන් වැඩේ කරන්නට භාර දුන්නාම පසුව කවුරු හරි සිදු කරයි.යනුවෙන් ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

සභා අරමුදලින් වලින් සිදු කිරිමට පුළුවන්ද යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සභා අරමුදලින් වලින් සිදු කිරිමට නොහැකි බවත්,පළාත් සභාවේ විධියක ඉංජිනේරු කාර්යාලයට ඇස්තමේන්තු යවන බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

මේකේ වරද කාගේද යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මහජනතාවට ප්‍රාදේශීය සභාවක් විදිහට වැඩ කිරිම.ඒ හින්දා ඔබතුමා යෝජනාවක් ලබා දෙන්න යෝජනාව සභාවට ඉදිරිපත් කර අනුමක කර අදාළ අංශ වෙත යොමු කරන බව පවසන ලදි.මුදල් ඉල්ලුම් කරනන්නේ නැතිව යෝජනා භාර දෙන ලෙසත්,පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

හිරිවඩුන්න පාලමේහි විදුලිය නොමැති බව පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

විදුලි බිල්පත් රු.50,000.00 ක් වී තිබෙනවා.මොකක් හරි ක්‍රමයකට හිරිවඩුන්න පාලම සඳහා විදුලිය ලබා දිමට කටයුතු කරන බවට ගරු සභාපතිතුමා පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

වියදම් කිරිමට බලතල ඔබතුමාට තිබෙනවා සභාපති නිසා.තෙන්නකෝන් මන්ත්‍රීතුමා සඳහන් කළ පරිදි අවුරුද්දකට ප්‍රාදේශීය සභාවට අපේක්ෂා කරන අයවැය ඉලක්කයට යන්නය පුළුවන්.රඹුක්කන ආසනය තුළ දඩ මුදල්, මුද්දර ගාස්තු පළාත් සභාවෙන් එවීම නිසා.එම මුදල් වියදම් කිරිමේ හැකියාව ඔබතුමාට තිබෙන බව පවසන ලදි.යෝජනා ඉදිරිපත් කළාට පසු යෝජනා ටික ආණ්ඩුකාරතුමියට ඉදිරිපත් කිරිමෙන් අනුමත කර එවනවා.එතකොට අයවැය එකේ ඉලක්කයට යන්නට නොහැකි වෙන බව පවසන ලදි. දඩ මුදල් අවමාන කර වත්කම් අවුරුද්දට සකස් කරනවා. නමුත් යෝජනා ක්‍රියාත්මක කිරිමේදී අපගේ අයවැය එකට එන මුදල අඩු වෙනවා.ආදායම් පැත්ත හිර වෙනවා.මේ දඩ මුදල් අපේ ගිණුමට අරගෙන ඒවා වියදම් කිරිමේ බලතලය ඔබතුමාට තිබෙනවා.එතකොට තෙන්නකෝන් මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට ආණ්ඩුකාරතුමියට ඉරිදිපත්

කිරිමට අවශ්‍ය නැත.යවනා තමා මොකද එක පැත්තකින් හිර විමක් සිදු වෙනවා.ආදායම් මුදල් අපේ සභාවට ලබා ගන්නා ලෙසත්,වියදම් කිරිමේ හැකියාව ඔබතුමාට තිබෙන නිසා.එම නිසා මම යෝජනා කරන්නේ පළාත් සභාවට යැවිමට අවශ්‍ය නැත.සභාවෙන් සම්මත කරලා ක්‍රියාත්මක කිරිමේ හැකියාව ඔබතුමාට තිබෙන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

සභාව පත් වීම කලින් මාර්ගෝපදේශයක් දීලා තිබෙනවා.අවුරුද්දක් යන්නට වෙන්නේ ඒ ආකාරයට බව පවසන ලදි.දෙපාර්තමේන්තුව අයවැය ලේඛනයක් දිලා තිබෙනවා.අපි ඒ අකාරයට කරන බවත්,මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා පැවසුවාට කරන්නට බොහොමයක් දෙවල් තිබෙනවා.ඒ නිසා සාකච්ඡාවක් ගන්න අවශ්‍ය බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

මෙහි අංක 14 යෝජනා යටතේ කොම්පොස්ට් අංගනය අලුත්වැඩියා කිරිම යන කර්මාන්තයට නව ඇස්තමේන්තුවක් සකස් කළ බැවින් මෙම නිවැරදි විය යුතුයි.වහලය උස මදි නිසා තව ටිකක් වැඩිදියුණු කළා.එම නිසා ඇස්තමේන්තුව වෙනස් කිරිමට සිදු විය.එම නිසා මේ කොටස ඉවත් කර ගන්නා බවටත්,සංශෝධන කර නව යෝජනාවක් ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා පවසන ලදි.

කාඩවට්ටිය ,වල්පොල වත්තේ ලක්ෂ්මන් ජයරත්න මහතාගේ නිවස අසල ආනන්ද මහතාගේ නිවස ඉදිරිපිට අතර ඇති මාර්ගය සංවර්ධනය කිරිම - රු310,000.00ක ඇස්තමේන්තුව සංශෝධනයට කර ගන්නවා.කාර්මික නිලධාරිතුමා අතින් ගණන් වැරදිමක් සිදු වී ඇති නිසා මෙය සංශෝධන කර ගන්නා බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

පළාත් සභා යෝජනා වල අංක 03 යටතේ අන්දිරමඩ ස්ථානය වෙනස් කර ගැනිමට අවශ්‍ය බව පවසන ලදි.එම ස්ථානයේ ගැටළුවක් පවතින නිසා මෙම මාර්ගය මැදින් වතුර බට ගිහින් තිබීම නිසා මාර්ගය ගියොත් ගටළුවක් වන නිසා ඉල්ලීමක් සිදු කර තිබෙනවා ස්ථානය මාරු කිරිමට සිදුවන බවත් මුදල වෙනස් නොවන බවත් සංශෝධන යටතේ සිදු කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සඳහා සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට ගරු සභාපතිතුමා විමසන ලදි.එහි දී විරුද්ධවයක් නොමැති බැවින් සභාව එකඟ වු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

අදාළ ඇස්තමේන්තු සහිත යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

ඉහත ඇස්තමේන්තු අනුමත කිරිම විම හා යොමු අංක 3.1.9 යටතේ වැඩ කොන්ත්‍රාත්තු සඳහා ප්‍රජා සහභාගිත්වය අනුව ගිවිසුම් ගතව කාර්ය ඉටු කිරිමට තීරණය විය.

(xvi).1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 146 වන වගන්තියේ (I) වන උප වගන්තියේ ප්‍රාදේශිය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාරව රඹුක්කන ප්‍රාදේශිය සභාව මඟින් දියුණු කළ ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශවල පිහිටි සෑම නිශ්චිත දේපළකම 2026 වර්ෂයේ වාර්ෂික වටිනාකම සඳහා 2016/2017 වර්ෂවල සිදු කරන ලද තක්සේරු ප්‍රතිශෝධනය මත 2025 වර්ෂයේ වටිනාකම 2026 වර්ෂයේ වාර්ෂික වටිනාකම ලෙස පිළි ගැනිමටත්,යථෝක්ත පනතේ 134 වැනි වගන්තියේ (I) වැනි උප වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර (I) වැනි උපලේඛනයේ පිහිටි දේපළෙහි වාර්ෂික වටිනාකමින් 6 % ක් ද (II) වැනි උපලේඛනයේ පිහිටි දේපළෙහි වටිනාකමින් 5% ක් ද වරිපනම් බද්ධක් පනවා අය කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සඳහා සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට ගරු සභාපතිතුමා විමසන ලදි.එහි දී විරුද්ධවයක් නොමැති බැවින් සභාව එකඟ වු බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
(I) වැනි උපලේඛනයේ පිහිටි දේපළෙහි වාර්ෂික වටිනාකමින් 6 % ක් ද (II) වැනි උපලේඛනයේ පිහිටි දේපළෙහි වටිනාකමින් 5% ක් ද වරිපනම් බද්ධක් පනවා අය කිරිම අනුමත කිරිමට තීරණය විය.

(xvii). A.S.M.හලීම් මයාගේ ඉල්ලිම පරිදි බෝගහවත්ත,හුරීමලුව,රඹුක්කන ලිපිනයේ පිහිටි ඉඩමේ ගව ගාථකාගාරයක් පවත්වා ගෙන යාමට නීත්‍යානුකූල අවසරය ලබාදීම සුදුසු බවට ගරුසභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**
අංක 17 යටතේ යෝජනාව ඒ.එස්.එම්.හලීම් මහතාගේ ඉල්ලිම අනුව එම මහතාගේ ඉඩමේ ගවගාථකාගාරයක් ඉදි කිරිමට ඉල්ලුම් කර ලිපියක් භාර දි ඇත. ඒ අනුව යෝජනාව සභාවට ඉදිරිපත් කරන බව ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුවත් කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මෙහොම්මඩ් අනීස් මැතිතුමා**
මෙම යෝජනාව සඳහා අදහස් ප්‍රකාශ කිරිමට අවශ්‍ය බව ගරු සභාපතිතුමාට පවසන ලදි.මීට පෙර සභාවට අයිතිව ගවගාථකාගාරයක් තිබුණා නමුත් යම්කිසි පිරිසක් විසින් එය කඩාකප්පල් කර ඉවත් කිරිමක් සිදු කළා මේ සභාවට අයිතිව අවුරුදු 60 ක කාලයක් පමණ පැවතිව තිබුණ ස්ථානයක් එයින් සාමාන්‍යයෙන් ගවමස් භාවිතා කරන අය ස්ථිරවම හොඳ තත්වයෙන් පවතින ගවමස් ලබා ගැනිමට හැකියාව ලැබුණා.නමුත් දැන් සමහර ප්‍රදේශ වලින් ගෙනවිත් අලෙවි කිරිම සිදු කරනවා. ඒවා ප්‍රවාහන සඳහා සභාව විසින් අවසර ලබා දී ඇත.ඒ ප්‍රවාහනය කරන ගවමස් තමා ඉදිරියට ලබා ගැනිමට හැකියාව ඇත්තේ.මට යම්කිසි පැහැදිලිතාවයක් ලබාදිමට පුළුවන.මෙය සකස් කිරිමට ඉල්ලිම් කර ඇත්තේ පෞද්ගලික ඉඩමකය.එම නිසා සභාවක් හැටියට මැදිහත් වීමක් සිදු කරනවා නම් හොඳ බව පවසන ලදි.සාමාන්‍යයෙන් අපි දන්නේ නැත ගවමස් ගෙනාවට මැරුණු එකක් ද,කියලා ගෙනැවිත් විකිණිම සිදු කරන්නේ.එයින් ලෙඩ රාශියක් ඇති වීමේ හැකියාව ඇත.මෙම ගවමස් සිංහල,මුස්ලිම්,යන සියලුදෙනාම භාවිතා කරයි.රඹුක්කන ගවමස් කඩේ කිලෝ 300 ක් පමණ විකිණිම සිදු කරනවා.නමුත් ගවගාථකාගාරය ප්‍රශ්නය පිටුපසට ගොස් නැති වී ගිය බවත් පවසන ලදි.පුද්ගලයා නොව කැමැත්ත ප්‍රකාශ කරනවා නම් සභාවේ මහජන පරීක්ෂක මහතුන් සිටින බැවින් එහි ගොස් එතැන සුදුසු ද බලා තහවුරු කර එම කටයුත්ත කර ගෙන යාම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මෙහොම්මඩ් අනීස් මැතිතුමා විසින් ප්‍රකශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමනි හොඳ මාතෘකාවට ඇවිත් තිබෙන බව පවසන අතර සභාවට හොඳ ආදායමක් එන බවත්,පාරිභෝගිකයන් සඳහා හොඳ තත්වයක් ඇති වෙයි.මමත් බෞද්ධයෙක් නමුත් මෙම ක්‍රමවේදය බෞද්ධයන් විදිහට අපහසුතාවය පත් වෙනවා.සභාවක් විදිහට අපිට මේ වගේ තීරණයක් ගන්නට හැකියාවක් නොමැති වෙයි.ගවගාථකාගාරයක් ස්ථාපනය කරන්නේ පෞද්ගලික ඉඩමකය.එතකොට මේකට නීතිමය පැත්තෙන් ගැටළු මතුවේ.අපේ ගව මස් කඩ දෙකක් තිබෙනවා.එතකොට ඉදිරියේදී මේ වගේ ප්‍රශ්නයකට මුහුණ දීමට පුළුවන.අපේ කඩදෙක ටෙන්ඩර්කරුවන් ලබා නොගනි.අපි මේකට ක්‍රමවේදයක් සකස් කළ යුතුය.අපිට ඒක ටෙන්ඩර් කිරිමට නොහැකිය.උදාහරණයක් වශයෙන් හේවාදිවෙල විල්සන් මුදලාලිගේ කඩය.ඒක පෞද්ගලික කඩයක් එතකොට අපේ සභාවේ ඌරුමස් කඩයක් සභාවෙන් ටෙන්ඩර් දැම්ම සිදු කරනවා.නමුත් ටෙන්ඩර් දැම්මට ක්‍රමවේදයක් නැත.ඒ ගොඩනැඟිල්ල එම පුද්ගලයාගේ මංහිතන්නේ ඔහු අවුරුද්දකට ලක්ෂ 02 කට ටෙන්ඩර් ගන්නවා.ඒකියන්නේ අපිට පාඩු නැතිව ලබා ගැනිමට නොහැකි බවය.ඒ මොකද පෞද්ගලික ඉඩමක් නිසා පුද්ගලයකුගේ දේපලක් නිසා ඔහු ලබාගන්නේ ඌරුමස් වෙළඳ බලපත්‍රය පමණයි.නමුත් සභාවක් විදිහට එය ටෙන්ඩර් කළයුතුය.එහෙත් එසේ කිරිමට නොහැකිය.මංහිතන්නේ ලක්ෂ දෙකගානේ හැම අවුරුද්දකම ගන්නවා ඒ වගේම ඉදිරියේදී ගැටළුවක් මතු වෙයි.මොකද ස්ථාපන කරන්නේ පෞද්ගලික ඉඩමක ඒ වගේම මෙම පුද්ගලයා පමණයි ගවගාථකාගාරය සිදු කරන්නේ.එහෙම නම් ඔහු අපේ ගවමස් කඩදෙක අවුරුද්දකට තිබෙන ලංසු මුදලට එම කඩ දෙන ලබා ගැනිමත්, එකට අයකරන ක්‍රමවේදයක් සකස් කිරිමට අවශ්‍යයි.මොකද අපිට මේක ලබාදුන් පසු ගවමස් තිබෙනවා. අනෙක් පැත්තෙන් සභාදේපල ටෙන්ඩර්කරුවන් නොගෙන හිටියොත් සභාවට පාඩු වෙනවා.ඒ නිසා ටෙන්ඩර් ක්‍රමයට ගව මස් කඩ හා ගවගාථකාරගාරයට අවසර ලබා දෙන්නේ නම් පරිභෝගික ජනතාව ටෙන්ඩර් දමනවා එතකොට ඔබතුමා අසීරුතාවයට පත්වෙනවා.ගවගාථකාරගාරයක් තිබෙනවා නම් අපි මස්කඩ ද ලබාදෙනවා.සභාවක් විදහට ලංසු මුදල අඩු කිරිමට නොහැකිය.එම නිසා අවුරුද්දේන් අවුරුද්දට ලබාදිමට ගිවිසුමක් සකස් කළ යුතුය.මේ

අවුරුද්දේ ලක්ෂ 3 ට ගන්නවා නම් ඊළඟ අවුරුද්දේ තුනයි දහයට ලබා දෙනවා.එහෙම නැති වුනොත් සභාවට එන ආදායම නැති වෙනවා.අනෙක් පැත්තෙන් ඔහුට ගවගාථකාගාරයක් ලබාදීම පිළිබඳ නිතීයෙන් බොහෝ දේ ඇති විය හැකිය.බෞද්ධයන් හැටියට වැඩිපිරිසක් ගවමස් නොකයි.ඒ නිසා මේ සඳහා වක්‍රව නොබලා සභාවක් විදිහට ඒ ඉල්ලීම කළයුතුය ඇත.ඒ නිසා මා හිතන්නේ සභාවක් විදිහට ගැටළුවක් ඇති නොවන ලෙස ඉදිරියට කරගෙන යන්නේ නම් හොඳ බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ගරු සභාපතිතුමා මෙතුමා ඉහත සඳහන් කළ ආකාරයට අපේ ගවමස් කඩවලටත් සමහර විට බලපෑම් සිදු වීමට ඉඩකඩ තිබෙනවා.ඒ එක්කම මම දැන ගැනිමට කැමතියි. සභාව සතු දැනට ගවමස් කඩ කිහිපයක්ම රඹුක්කන ක්‍රියාත්මක වෙනවා ද?කොහොමත් අපේ තිබෙන ගවමස් කඩ දෙක සඳහා බලපෑමක් දැනටම ඇති වෙලා තිබෙන බව පවසන ලදි.කවුරුවත් මේ කඩ ටෙන්ඩර් ගන්නේ නැත.තව අලුතින් ගවමස් කඩ සඳහා අවසර ඉල්ලා තිබෙනවා.ඒක පළාත් සභාවේ බලපත්‍රයක් හරහා තමා අවසර ලැබෙන්නේ අපි ඒ ගැන අවධානය යොමු කළයුතුය.සභාවක් විදිහට මොකද අපේ මේ ගවමස් කඩ මේ විදිහට ගියොත් සභාවට තිබෙන ආදායම නැති වෙලා යන බවත් සඳහන් කරන ලදි.මම මේ පවසන්නේ ගවගාථකාගාරයට අදාළ කාරණයක් නොවේ.වෙනම කාරණයක් මේ කරුණට අදාළ කර ගනිමින් බව පවසන ලදි. මේ ගවමස් සඳහා බලපත්‍ර ලබාදෙන ආකාරය පිළිබඳ අපි සභාවක් විදිහට කටයුතු කරන්නට ලැස්තිවෙන්න ඕනෑ.මොකද පළාත් සභාවෙන් මංහිතන ආකාරයට අවසර දිල තිබෙනවා ගවමස් ගෙන්නන්නට, ගවමස් ගෙන්නන්නේ කොහෙන්ද කියන එක දැනට අපිට ප්‍රශ්නයක් නොවන බවත් කුරුණෑගල ප්‍රදේශයෙන් ගෙන්න බවත් සඳහන් කරන ලදි.ඒ කෙහොම වෙතත් අපගේ ආදායම බලපෑමක් එල්ල වීමට පුළුවන ප්‍රදේශය පුරාම ගවමස් කඩ විවෘත විම නිසා බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**

ප්‍රාදේශීය සභාවකට ගවගාථකාගාරයක් අවශ්‍යයි.ගවමස් කඩ සඳහා ටෙන්ඩර් ක්‍රමය අනුගමන කළ යුතුයි.මාසිකව ලොකු ආදායමක් ලැබෙනවා.අනීස් මන්ත්‍රීතුමා පැවසු ආකාරයට ගවගාථකාගාරයක් ප්‍රදේශයට නොතිබීම නිසා පිට පළාත් වලින් ගවමස් ප්‍රවාහනය කිරිම සිදු වෙනවා.ප්‍රවාහනයේදී වැඩි වේලාවක් යන බැවින් මස් වෙළඳපළ තුළට එන විට සවස 3.30 පමණ වෙන බවත් පවසන ලදි.සාමාන්‍යයෙන් ගවමස් අලෙවි වන්නේ උදේ කාලයටය.සවස ප්‍රවාහන සිදු විමෙන් පිරිසිදු මස් පාරිභෝගිකයන්ට නොලැබෙන බවත්,එයින් වෙළඳහිමියන් අපහසුතාවය පත් වෙන බවත් පවසන ලදි.ප්‍රවාහනය ප්‍රමාද විමෙන් පසුදින එම මස් අලෙවි කිරිම සිදු වෙන බවත්,එයින් පාරිභෝගිකයාට අවදානමක් ඇති වේ.එම අවධානම නැති කර ගැනිමට නම් ප්‍රදේශය තුළ ගවගාථකාගාරයකින් ලබා ගන්නා ලද මස් ලබාදීම සුදුසු බව පවසන ලදි.අපි බෞද්ධ වුණත්, මේක සිදු විය යුතුය.ප්‍රාදේශීය සභාවක වගකිම තමා පාරිභෝගිකයන්ට හොඳ ගවමස් ලබාදීම.ඒ සඳහා ගවගාථකාගාරය හා ගවමස් වෙළඳසැල් ටෙන්ඩර් ක්‍රමයට ලබාදීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මෙහොම්මඩ් අනීස් මැතිතුමා**

මම කලින් ප්‍රකාශ කළා සභාව මැදිහත් විය යුතු බව නැතිනම් ඔය පුද්ගලයා ගවගාථකාගාරය කියලා ඒ පුද්ගලයා හෝ වෙනත් ළඟ ඉන්න වෙනත් කෙනෙක්ට කියලා පවත්වා ගෙන යාමට පුළුවන.ටෙන්ඩර් ක්‍රමයට ගියොත් සභාවට ආදායමක් එන්නට පුළුවන් බවත්,පවසන ලදි.ටෙන්ඩර් කරලා ඒ අයම ගන්නවා නම් තවත් කෙනෙකුට ලබා ගැනිම නොහැකි වෙනවා.ඒ නිසා සභාව මැදිහත් වී පෞද්ගලික ඉඩමක් නිසා නීත්‍යානුකූලව ඉඩම සභාවට පවරාගෙන නැත්නම් කර ගෙන යාමට නොහැකි බවත්,හැම අවුරුද්දකම ටෙන්ඩර් දමා එම පුද්ගලයාට ලබාදිම සිදු කරයි.යම්කිසි ටෙන්ඩර් ක්‍රමයකට ගිහින් සභාව මැදිහත් වී කිරිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.මෙහොම්මඩ් අනීස් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

සභාපතිතුමනි,ගෙදර ගියොත් අඹුනසි මහ හිටියොත් තෝ නසි යන ප්‍රශ්නයක් තමා අපට මතු වී ඇත්තේ සිංහල බෞද්ධ අපේ පංචශීලයේ පළමු වැනි පදය තමා ප්‍රාණාතිපාතා අනෙක් එක අපි කවුරුත් දන්නවා කිරි අම්මා කියන්නේ එළගවයාට ඒ වගේම මීගවයන්ගෙනුත් කිරි ලබා ගන්නවා.නමුත් අපිට ප්‍රශ්නයක් තිබෙනවා මන්ත්‍රීවරයෙක් වශයෙන් අපට එන ආදායම නැති කර ගැනිමට නොහැකි බව,අර මන්ත්‍රීතුමා පැවසුවා ටෙන්ඩර් ක්‍රමයට මස්කඩ පවත්වා ගෙන කියලා දැන් අද තේ කඩ ගාණට මස්කඩ තිබෙනවා.එහෙත් අපට අදාළ මස් කඩය නැත.එම මස් කඩය ගන්නෙත් නැත.සභාවේ ඉඩමක තමා ගවගාථකාගාරය පවත්වා ගෙන ගියේ

අවාසනාවකට පැටියෙකුයි අම්මේකුයි.සතනට කිරිමට ගෙවිත් තිබුණා මේ සභාවේ සිටියා ස්වාමීන් වහන්සේ නමක් එම ස්වාමීන් වහන්සේ බිත්ති පෙරලාගෙන ගොස් එය නතර කළා ඉන්පසු සභාවෙන් තීන්දුවක් ගත්තා ගවගාථකාගාරය වැසිමට දැන් කාගෙවත් ඉඩමක ගවගාථකාගාරය ස්ථාපනය කිරිම අවශ්‍ය නැත.අපට තිබෙනවා ගවගාථකාගාරයේ ඉඩම අපි බෞද්ධයන් වශයෙන් ගවගාථකාගාරය විරුද්ධයි.නමුත් කවුරු හරි කෙනෙක් ඉල්ලීමක් කර ඇත්නම් ඒ ගැන සලකා බැලීම සිදු කළ යුතුය.මුස්ලිම් ජාකයන්ගෙ හලාල් යනු ආගම සිහිකර සතා මැරිම පාපයක් නොවන බවයි.අපට නම් කොහොම කරත් සතා මැරීම ප්‍රාණඝාතයයි.රඹුක්කන දැන් පවතින්නේ කොහෙන් හරි ගෙන එන මස් තමා දෙන්නේ අප හලාල් වලට පණිවිඩ දෙන්න බෑ ගරු සභාපතිතුමනි පෞද්ගලිකව මම විරුද්ධයි සතා මරණවාට සභා මන්ත්‍රීවරයෙක් ලෙස මම විරුද්ධ වුණත්, මුස්ලිම් ජනතාව බලාපොරොත්තු වෙනවා ආහාරයක් විදිහට ගවමස් ලබා ගැනිමට මං හිතන්නේ සෑම මුස්ලිම් ගෙදරකම ගවමස් ආහාරයට ගන්නවා.ඒ මතය තිබෙනවා.ඒ නිසා මම මුස්ලිම් ජනතාවට විරුද්ධ වීම වෙන්නේ නැත.ප්‍රශ්නය තියෙන්නේ ටෙන්ඩර් ක්‍රමයයි.ටෙන්ඩර් ක්‍රමයට ගවගාථකාගාරය දිමට මන්ත්‍රීවරු,මහජන පරීක්ෂක මහතෙකු සමඟ අනුමත කරලා පසුව ටෙන්ඩර් කිරිම සිදු කර ඇත.එහෙත් දැන් ටෙන්ඩර් කිරිම සිදු කරන්නේ කොහොම ද? හුරීමළුවේ තිබෙන නිසා. හුරීමළුවේ ගවගාථකාගාරයක් විවෘත කිරිමෙන් සිටින ගවයින් ටිකත් නැති වෙන බව ප්‍රකාශ කරන ලදි.දැන් ගම්වල මේ ක්‍රමය නැති වී ඇත.මට මේ සඳහා විරුද්ධ වීමට නොහැකිය.එහෙත් සභාව මැදිහත් වී ටෙන්ඩර් ක්‍රමයට ගියොත් හරි ගාණකට දීමට නොහැකිය.පුද්ගලික ඉඩමක ගවගාථකාගාරයක් ස්ථාපනය කිරිම නිසා මේකට නීතිදමා වෙනම පාලනය කිරිමට පුළුවන්.මම බෞද්ධයෙක් වශයෙන් ඒ ප්‍රාණඝාතනයට විරුද්ධ බව තමා ප්‍රකාශ කරන්නේ.එම නිසා වැඩිදෙනාගේ කැමැත්තට මම අවස්ථාව ලබා දෙනවා.මුස්ලිම් ජනතාව ගැනි සොයා බැලිය යුතුය.කොහොම නමුත් මෙයින් බලපත්‍ර ලබා ගැනිම වැඩි දෙනෙක් පැමිණෙයි.ටෙන්ඩර් ක්‍රමයට කඩ ලබා දී මේදී 1km ක් ඇතින් කඩ පිහිටිම නීතියක් බවත් එය පනතේ ඇති බවත් පවසන ලදි.දැනට කඩ දෙකක් තිබෙනවා.හැබැයි එදාට ගවයෙක් සොයා ගැනිමට නොහැකි වෙයි.ඒ නිසා සභාපතිතුමනි,දුර දිග බලා තීන්දු තීරණ ගැනිම සිදු කළ යුතු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් මැතිතුමා**

මම හිතන්නේ තෙන්නකෝන් මන්ත්‍රීතුමා පැවසුවා වගේ සභාවට හිරවිමක් සිදු වන අතරම මේ පාපකර්මයට ඔබතුමාට අත ගහන්නට වෙයි.අර මරණ දඬුවමට කොඩිය අත්සන් කරනා වගේ තමයි.මම හිතන්නේ ගරු සභාපතිතුමනි,ඉදිරියට යන්න වෙන්නේ තෙන්නකෝන් මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට මේ ගවගාථකාගාරය රඹුක්කන ස්ථාපනය කිරිම මගේ පොඩි විරුද්ධතාවයක් ද තිබෙනවා.මෙය පෞද්ගලික ඉඩමක ස්ථාපනය කරන්නේ එයින් ගම්වල හා නගරවල ගවයින් නැති වේ.දැන් ගවමස් ගෙන එන්නේ කුරුණෑගලින්,ඒ වගේම වාහන වලට පැටව් පවා දමා ගෙන හොරකම් කර ගෙන යනවා.රඹුක්කන නගරයට මේ ගවගාථකාගාරයක් ආවොත් රාත්‍රි කාලයට වුණත් ගවයන් දක්කා ගෙන යාම සිදු වේ.ගවයා මස් කරපුවාම ආය සොයා ගැනිමට නොහැකිය.ත්‍රී විල් උත්සනවා වගේ තමා අනෙක් එක මෙය ස්ථාපන කරන්නට යන්නේ හුරිමළුව බෝගහවත්ත මෙහි සිංහල ජනතාව ද සිටිනවා.පාර දිගේ දක්කාගෙන යන විට නැති ප්‍රශ්න ඇති විය හැකි බවයි මගේ පෞද්ගලික මතය වන්නේ මෙහි විහාරස්ථාන පවා තිබෙනවා එම නිසා නැති ප්‍රශ්න සභාවට පැමිණෙනෙ බවයි.එම නිසා හොඳ තීන්දු තීරණ ලබා ගැනිම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.තරංග නුවන් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා**

ගරු සභාපතිතුමනි,එම මන්ත්‍රීතුමා පවසන ආකාරයට ගවයෙකු ඝාතනය කරනවා කියන්නේ ආණ්ඩුව කීරණයක් ගෙන නිත්‍යානුකූලවය. ගවයා මිලදී ගත් කුවිතාන්සිය,ගවයාගේ සලකුණ ,ඒවගේම ප්‍රවාහන බලපත්‍රය වැනි දේවල් තිබෙනවාද යනුවෙන් පරීක්ෂා කර බලා නිත්‍යානුකූලව ගවඝාථකාගාරයක ගවයකු මරණයට පත් කිරිම සිදු කරයි.ඒ සඳහා නීති තිබෙනවා. එම නීතිවල සිදුරු පවතී.එම නිසා ප්‍රාදේශී සභාවක මහනගර සභාවක තිබෙන ඒවා නතර කිරිමට සිදු වන්නේ.ඒ නිසා නීති ප්‍රතිස්ථාපනය කර නිලධාරින් දැනුවත් කර එම නිලධාරින් හරියට කරනවා යන්න පිළිබඳ පසු විපරමක් සිදු කිරිම කළ යුතුය.මමත් බෞද්ධයෙක් මම හරක් මස් කනවා ඒක බෞද්ධ කියලා වළක්වන්නට නොහැකි බව පවසන ලදි.මම දන්න විදිහට බහුතරයක් හරක් මස් ආහාරයට එකතු කර ගන්නේ බෞද්ධයින්ය.ඒ අය මරන්නේ නැති වුණාට මස් ආහාරයට ගන්නවා. බෞද්ධකම නොවේ ඉස්සර විය යුත්තේ අවශ්‍යතාවය.හරක් මස් කියන්නේ පෝෂණය අතින් ඉහළ දෙයකි.ආගම අනුව එක ප්‍රතික්ෂේප කිරිමට ශ්‍රී ලංකාව වැනි රටකට නොහැකිය.එය පුද්ගල අයිතිවාසිකමක් රාජ්‍ය ආයතනයක් විදිහට අපගේ වගකිම ඒකට අවශ්‍ය ප්‍රතිපාදන සකස් කර දිමය.එයින් ලැබෙන ආදායම හරියට ලබා ගෙන ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන ලෙස මම නැවතත් ඉල්ලා සිටින බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.ආර්.සමන් කුමාර මැතිතුමා ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

මේ ගවමස් කඩය,ගවඝාථකාගාරයක් පිළිබඳ අදහස් දැක්වීමේදී රඹුක්කන ගවඝාථකාගාරය මිනිසුන් විසින් තමා රැල්ලක් හදා ගෙන ඒක නැති කර ගත්තේ එතකොට නැවත වතාවක් ගවඝාථකාගාරයක් රඹුක්කනට එනවා කියන්නේ යම්කිසි කැළඹීමක් ඇති වී මහජන විරෝධයක් එන්නට පුළුවන්ය.මම සභාපතිතුමාගේ යෝජනාවට විරුද්ධ වෙනවා නොව අපි ඉදිරිය ගැන කල්පනා කර වැඩ කරන්නය ඕනෑ මොකද මේ යෝජනාව ආවට පස්සේ මිනිස්සු තුපිත වීම පුළුවන.එතකොට හරකා මැරීමට මෙතුමා කියනවා ක්‍රමවේදයක් තිබෙවා කියා.නමුත් අද  හරකෙක් මරණ ක්‍රමවේදය කෙසේ වෙතත් මිනිස්සු  මරණ ක්‍රමවේදය බලන කොට හරකා කියන ඒකා කොහොම ඇවිත් මරලා දමයි ද කියලා හිතා ගැනිමට නොහැක.මොකද හරකා මරණ එක මම දන්නවා හරකා මැරුවට පසුව  හරකගේ බෙල්ල,කකුල් තියෙන්නට ඕනෑලු ගවඝාථකාගාරයෙම නමුත් එක හරකෙක් මරලා ඔය කකුල් ටික කොහේ විසිකරන්නට බැරිද ඒ හින්දා ක්‍රමවේදයට කරනවා හරි නොකරනවා හරි යම්කිසි ව්‍යාකූල තත්වයක් ඇති වෙන්නට පුළුවන් ආගම,ජාතිය අතර මේ ගවඝාථකාගාරය රඹුක්කන එනකොට මේ යෝජනාව ගැන ඔබතුමා කාලෝචිතව කල්පනා කර සුදුසු තීරණයක් ගන්නා ලෙස මම බොහොම කාරුණිකව දැනුවත් කරන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ලයනල් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළ ආකාරයට මෙය මගේ යෝජනාවක් නොවේ.ඉල්ලීමක් සිදු කර තිබෙනවා මගේ යෝජනා යටතේ තමා තියෙන්නේ.මේ ආයතනය පවත්වා ගෙන යන කොට බලය පාවිච්චි කිරිමේ සීමාවන් තිබෙනවා.ලිපියක් මඟින් ඉල්ලීම් කර ඇත්තේ අංක 22,ඒ.එස්.එම් හලීම් ,බෝගහවත්ත රඹුක්කන යන පුද්ගලයෙක් ඒ කෙසේ වෙතත් මේකට තීන්දුවක් ලබා ගැනිමට සිදු වන බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

මේ යෝජනාව එනකොට අපි මන්ත්‍රිවරු කිහිපදෙනෙක් එක්ක සාකච්ඡාවක යෙදුනා ප්‍රශ්නය සාකච්ඡා කරන විට ගරු සභා මණ්ඩලයෙන් විවාද මතු වෙන්න පුළුවන් බව.ඒ වගේම හෙට උදේ ප්‍රවෘතියක් යන්න පුළුවන් ජාතික ජනබල වේගයේ ආණ්ඩුවක් ඇවිත් රඹුක්කන ඉතිහාසයේ වසා දැමූ ගවඝාථකාගාරය නැවත විවෘත කිරිමට යෝජනා කළා යනුවෙන්.ඒ නිසා මම හිතනවා  අපේ පෞද්ගලික මතය කුමක් වුවත් ඒක බෞද්ධ,ක්‍රිස්තියානි,හින්දු,මුස්ලිම් යන ආගමිකයන් ගාවසාථකාගාරය සම්බන්ධයෙන් මතයන් තිබෙන්නට පුළුවන්.මම වෙනම මගේ පෞද්ගලික මතය ප්‍රකාශ කරන්නේ නැත.අපි ගවමස් අනුභව කරනවා. වගේම ඔය කවුරුත් ගවමස් අනුභව කරනවා.අනුභව නොකරන කිහිපදෙනෙක් සමාජයේ ඇති නමුත් මෙතන කාර්යය සම්බන්ධයෙන් මම ගොඩක් වෙලා අහගෙන සිටියේ දැනුවත් වීමට ඒ එක්කම විශ්වාස කරනවා මේ  ඉල්ලිම කරපු එක ඇතුළෙහි යම්කිසි දේශපාලනයක් තිබෙන්නට පුළුවන්.මම එහෙම විශ්වාස කරනවා.මේ යෝජනාව මෙතැනට දමා මොකද වෙන්නේ කියලා බලලා ප්‍රවෘතියක් යැවීමට පුළුවන්.එහෙම කියලා උපකල්පනයකත් මම ඉන්නවා.කෙසේ වෙනත් පෞද්ගලික ඉඩමක ගවඝාථකාගාරය පවත්වාගෙන යාම යම්කිසි ගැටළුකාරිතත්වයක් පවතින් පුළුවන් කියන එක අපි කාටත් පෙනෙන දෙයක් ඒ වගේම පරණ තිබුණු ප්‍රාදේශීය සභා භූමියේම තැනම  ගවඝාථකාගාරයක් නැවත විවෘත කරනවා කියන එකත් ගැටළුවකි.ඒ නිසා මම යෝජනා කරනවා මේ යෝජනාව අදට සම්මත නොකර පසුවට කල් තබන ලෙස ,අපි සියලුදෙනා එකතු වී මුස්ලිම් මන්ත්‍රීවර දෙනෙක් ඉන්නවා.පල්ලියක් තිබෙනවා.ආයතන කිහිපයක් එකතු කර ගෙන යම් සාකච්ඡාවක් සිදු කර මේ සම්බන්ධයෙන් කරන්නට පුළුවන්හොඳම තීරණ මොකක්ද  කියලා බලමු.

අපි දන්නවා ප්‍රවාහනය කර පිට පළාත් වලින් ගෙනවිත් විකිණීම සිදු කරනවා.සමීර මන්ත්‍රීතුමා කීව කථාවේ අතුරු ව්‍යවස්ථා සම්මතයකින් තමා තිබෙන්නේ ගවමස් කඩ දාන්න පුළුවන් කියලා. අපි ලේකම්තුමාගෙන් ඇසුවා.අතුරු ව්‍යවස්ථාව අතික්‍රමණය කිරිමට,එහෙම සභාවට බලතල නැත.එහෙනම් අතුරු  ව්‍යවස්ථාවක් ආපසු කරන්නේ.ගවමස් කඩ දැමීමට නීතියක් ඇත.මේක හරි සංවේදී ක්‍රියාවක් ලෙස ගන්නවා.සමාජයේ රටේ අනාගත සුරක්ෂිතාවය සම්බන්ධයෙන් ගන්නවා නම් කිසිම මසක් සම්බන්ධයෙන් ගැටළුවක් නැත.ආහාර සම්බන්ධයෙන් ගත්තොත් විදිමත් ක්‍රමවේදයකට සතුන් ඝාතනය වෙනවා නම් විදිමත් ක්‍රමයකට විකුණනවා නම් මාළු,කුකුළු මස්,එළුමස්,ඌරු මස් ඔක්කොම එකයි.දැන් ලොකේ ගවමස් පැකට් කර සුපර් මාර්කට් වල විකුණනවා.එතකොට ඒවා නැවුම් ද නැද්ද යන්න බලන්නේ නැත.ඒ නිසා රඹුක්කන ප්‍රදේශය තුළ කොහොමද ගවමස් විකිණීම ,ප්‍රවාහනය  සිදු වන්නේ කියන එක සම්බන්ධයෙන් අයිතිය හා බලය තිබෙනවා ප්‍රතිපත්තිමය තීරණයක් ගැනිමට ඔය කාරණා තුනම තිබිය යුතුයි.ඝාතනය,ප්‍රවාහනය,විකිණීම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය අයිතියක් පළාත් සභාවට තිබෙනවා.ඒ අනුව අපි කටයුතු කරමු.එහෙම නොවුණොත් මම හිතන්නේ ආණ්ඩුවට විරුද්ධ ජන සමාජය මාතෘකාවක් සපයා ගනියි මේ සම්බන්ධයෙන් ඒ නිසා සභාව ඇණ ගන්න හෝ

අපහසුතාවයට පත් වෙන තැනට යන්න ඕනෑ නැත.හැබැයි එතනෙදී මට කොහොමත් ප්‍රකාශ කිරිමට අවශ්‍ය නැත.මුස්ලිම් ජනතාවගෙයි.ගවමස් අනුභව කරන ජනතාවගේ අයිතිවාසිකම් නැත්නම් ඉල්ලීම නිශේධනය කරන්නට බෞද්ධකම පාවිච්චි කරන්නේ ඕන කියන අදහසක් මගේ නැත.නමුත් ජනතා නියෝජිතයන් වශයෙන් අපට සලකා බලන්නට වෙනවා ආණ්ඩුව එකක් තිබෙන අප්‍රසාදය පිළිබඳවත් එහෙම නැත්නම් බෞද්ධයන් කුලප්පු වෙයිද කියන එක ගැන සම්බන්ධයක් හිතන්න සිද්ධ වෙනවා.එම නිසා මම කියන්නේ කොහොම කවදා ගත්තත් මේ සාකච්ඡාව මේ සභාවට එනවා ගවඝාථකාගාරය සම්බන්ධ සාකච්ඡාව ඒ ආපු දවසට අපිට නැවත කථා කිරිමට සිද්ධ වෙනවා.ඒ නිසා මේ අවස්ථාවේ හලීම් කියන්නේ කවුද?කියලා හඳුනා ගැනිම අවශ්‍යයි.එහෙත් මම දන්නවා මේ නගරය තුළ ජීවත් වන හරක් මස් ව්‍යාපාරයේ යෙදෙන කෙනෙක් බව,මෙම හරක් මස් ව්‍යාපාරය ඒකාධිකාරයක් ලෙස පවත්වා ගෙන යාමට මුස්ලිම් ව්‍යාපාරිකයන් යම්යම් අවස්ථාවල කටයුතු කර තිබෙනවා.කොටා ගෙනත් තිබෙනවා.මේ නිසා අපි හොයන්න ඕනෑ හලීම් කියන්නේ කවුද? එයා මේ වැඩේ කරන්නට යෝජනා කරන්නේ කොහොමද ?,ප්‍රාදේශීය සභාවේ අනපනත් වලට එකඟද? නීතියට එකඟව කරගෙන යනවාද? අවසර දීලා ඒ අනුව නොකරන්නේ නම් මේක නවත්තන්නේ කොහොමද ? නැත්නම් හරක් සොරකම් කර ගෙන ඇවිත් මැරිම සිදු කරයි.එහෙම වුණොත් බලපත්‍ර අවංගු කරන්නේ කොහොම ද? යන සියලුම කාරණා සාකච්ඡාවට අරගෙන අපි ඒ සම්බන්ධයෙන් ප්‍රශස්ථ තීරණයක් ගමු කියන එක තමයි.මගේ අදහස යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා**

අපි බෞද්ධ,මුස්ලිම්,හින්දු කියලා නැත මස් අනුභව කරනවා.රටේ කවුරුත් මස් අනුභව කරනවා.හැබැයි අනුභව කරනවා කියලා ඒක ඇඟේ ගාගෙන කෑමට අවශ්‍ය නැත.දැනට අපේ රඹුක්කන නගරයේ මස් කඩ නෑ කියලා අර්බුදයක් ඇති වී නැත.ඒ නිසා මේක මරා ගෙන කන දෙයක් නොවේ.ඇත්තටම රඹුක්කන ප්‍රදේශයේ ගවයන්ගේ ප්‍රමාණය අඩුය.ඔක්කොම ගවයන් මරාදමා ඇත.ඒ නිසා පෞද්ගලික ඉඩම් වලට අවසර ලබා දිමට ගියවිට නැති අර්බුද ඇති විය හැකි බව ප්‍රකාශ කරන ලදි.එයින් සිටින සතුන් දෙතුන්දෙනාත් මරා දැම්මක් සිදුවේ.ඒක අපේ රටේ සාමාන්‍ය මිනිසුන්ගේ හැටියක් බවත්,මිනිසුන් එහෙම පරිවර්තනය වී නොමැති බවත්,පවසන ලදි.ඒ නිසා මම පවසන්නේ මේක අපි පසුවට කල්දමමු.තාක්ෂණයත් එක්ක නිෂ්පාදන අවශ්‍යතාව මක කරන කර්මාන්තයක් හැටියට කරනවා නම් ඒකට අවසර දෙන ලෙසත්,එතකොට අපිට සුපර් මාකට් එකට ගිහින් ගන්න පුළුවන් තැනට ගෙනියන්න පුළුවන් බව පවසන ලදි.මෙතැන දැනට පවත්වාගෙන යන ක්‍රමයට කඩ ටික ටෙන්ඩර් ක්‍රමයට පමණක් පවත්වාගෙන යාමත්,අනෙක් ඒවා සඳහා අවසර නොදෙන ලෙසත් පවසන ලදි.මන්ත්‍රීතුමන්ලා පැවසු ආකාරයට අපේ රට තුළ,ආසනය තුළ අර්බුද ඇති වෙන්න පුළුවන්. ඒ නිසා මගේ යෝජනාව නම් මේක අපි පසුවට කල්දමන ලෙසය.යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේක මහජන ඉල්ලිමක් ආහාර පිළිබඳ ප්‍රශ්නයක් මහජන නියෝජනයිනි,අපගේ පනතේ තිබෙනවා සෝඝාතකාගාරයක් පවත්වා ගෙන යාමට හැකියාවක් තිබෙන බවට,සංජීව මන්ත්‍රීතුමා පැවසු කාරණය අනුව අපි ඉදිරි දිනයකදී ආගමික නායකයන්,මෙයට අදාළ පාර්ශවයන්,බෞද්ධ ආයතවල නිලධාරින් සමග එකතු වී විධිමත් සාකච්ඡාවක් කර ඒ සාකච්ඡාවේ වාර්තාවක් මන්ත්‍රීතුමන්ලාට ලබා දීම සිදු කරන බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව කල්තබන ලදි.

තීරණය -
ඒ අනුව මේ යෝජනාව කල්තබන ලදි. විද්වත් මණ්ඩලයක සාකච්ඡාවකින් පසු ඉදිරි දිනක තීරණයක් ලබා ගැනිමට

(xviii). අදාහනාගාර භාරකරු හා සහයක වන පිළිවෙලින් එන්.ජී.ඒ.ප්‍රියන්තට හා එන්.එම්.පද්මසිරි යන මහතුන් දෙදෙනාට නිල ඇඳුම් ලබා දෙන ලෙස ඉල්ලීම් කර ඇත.නිල ඇඳුම් චක්‍රලේඛනයේ මේ සඳහා ඉඩක් ලබා දී නොමැත.එහෙත් සභාවෙන් එම ස්ථානයේ ගෞරවයට ගැළපෙන ආකාරයට සේවකයින් සිටිය යුතු බැවින් එම ස්ථානයට ගැලපෙන ආකාරයට නිල ඇඳුමක් ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සඳහා සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට ගරු සභාපතිතුමා විමසන ලදි.එහි දී විරුද්ධවයක් නොමැති බැවින් සභාව එකඟ වූ බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

මෙම ස්ථානයට ගැළපෙන ආකාරයට නිල ඇඳුමක් නිර්මාණය කිරිමට තීරණය විය.

(xix).රඹුක්කන ප්‍රා/සභාවේ වැඩ ක්ෂේත්‍ර කම්කරු හා සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා නිල ඇඳුම් ලබාදීමේදී ඔවුන්ගේ රාජකාරි කටයුතු පහසු කර ගැනිම සඳහා ඔවුන්ගේ ඉල්ලීම පරිදි ප්‍රා/සභා ලාංඡනය සහිත ටී ෂර්ට් සහ බොටම් ලෙස මසා නිම කළ නිල ඇඳුම් කට්ටල 02 බැගින් ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙම යෝජනාව සඳහා සභාවේ විරුද්ධත්වයක් නොමැති බවට ගරු සභාපතිතුමා විමසන ලදි.එහි දී විරුද්ධවයක් නොමැති බැවින් සභාව එකඟ වූ බව ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

චක්‍රලේඛනයේ නොමැති බැවින් ආණ්ඩුකාරතුමියගේ අනුමැතියට යැවීමට තීරණය විය.

(xx).2025.07.29.දින සිට 2025.08.21 දක්වා රඹුක්කන ප්‍රාදේශීය සභාවේ වියදම් වාර්තාව අනුමත කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

| දිනය | වවුචර් අංකය | නම | විස්තරය | වටිනාකම (රු.) |
|---|---|---|---|---|
| 2025.08.01 | 826 | නාමල් සර්විස් සෙන්ටර් | SG-52-6699 ඉසුසු කැබ් රථයේ පූර්ණ වාර සේවාව සිදු කිරීම | 24,525.00 |
| | 827 | ප්‍රධාන දුම්රිය ගණකාධිකාරි | 2025 අප්‍රේල් මස නිදහස් දුම්රිය බලපත්‍ර ගාස්තු ගෙවීම | 7,600.00 |
| | 828 | පී.ජී.එල්.සී. කුමාර | PF-7429 කැබ් රථයේ ඉදිරි පස රෝදයේ පැච් දැමීම | 500.00 |
| | 829 | පී.ජී.එල්.සී. කුමාර | RX 1980 ගලි බවුසරයේ ට්‍රැක්ටර් ටේලරයේ දකුණු පස රෝදයට පැච් දැමීම | 600.00 |
| | 830 | ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් | SG RD 4337 ටැෆේ ට්‍රැක්ටරයේ පූර්ණ රක්ෂණාවරණ ලබා ගැනිම | 11,531.85 |
| | 831 | සභාපති,ප්‍රාදේශිය සභාව | ZA- 0108 බොබ් කැට් යන්ත්‍රයේ දුම් පරීක්ෂාව ,යෝග්‍යතා සහතිකය, හා ආදායම් බලපත්‍රය ලබා ගැනීම සඳහා ලබා ගත් අත්තිකාරම් මුදල් පියවීම | 8,290.00 |
| | 832 | ඩබ්.ජී. එන්.එස්.කේ.ප්‍රේමරත්න | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවීම | 910.17 |

| | | | | |
|---|---|---|---|---|
| | 833 | ජල සම්පාදන මණ්ඩලය - සුභ සාධක සංගමය | ක්‍රීඩාංගනය වෙන් කිරීම සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවීම | 4,275.00 |
| | 834 | ඩී.එම්.ඩබ්. ඩී.බී. දිසානායක | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවීම | 1,535.57 |
| | 835 | එම්.ඩී.අනුර ජයවීර | බැකෝ ලෝඩරය සඳහා ගෙවන ලද මුදල් ආපසු ගෙවීම | 21,185.00 |
| | 836 | කේ.ඒ.ඩබ්. පී. ජයවීර | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවීම | 709.99 |
| | 837 | කේ.ඒ. බී.ඩී.එම්. කස්තුරි ආරච්චි | ක්‍රීඩාංගන ඇප තැන්පතු ආපසු ගෙවීම | 911.33 |
| | 838 | රංජනී බේක් හවුස් | හිනාබෝව අඩනඇල්ල මාර්ග ගැටලුව සාකච්ඡාව වෙනුවෙන් සංග්‍රහ වියදම් දැරීම | 5,400.00 |
| | 839 | කළමණාකරු,ලංකා බැංකුව ,රඹුක්කන | ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම | 26,800,000.00 |
| 2025.08.04 | 840 | කර්මාන්ත සංවර්ධන දෙපාර්තමේන්තුව | ස්ථාන මාරු වී පැමිණි ටී.ආර්.එන්. තාඹුගල මියගේ උත්සව අත්තිකාරම් පියවීම | 7,500.00 |
| | 841 | ජගත් ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෝ | කොම්පෝස්ට් අංගනයේ ගොඩනැගිල්ලට ඇතුළු වන ස්ථානය සකස් කිරිම | 7,400.00 |
| | 842 | මෙට්‍රෝ පොලිටන් ටෙක්නොලොජි | cannon -324 ටෝනර් 03 ක් ලබා ගැනීම වෙනුවෙන් ගෙවීම | 63,720.00 |
| | 843 | එස්.එම්.කේ.බී. සමරකෝන් | හාඩ්වෙයාර් උපකරණ සැපයීම වෙනුවෙන් ගෙවීම | 11,310.00 |
| | 844 | පේපර් ලයින් ට්‍රේඩින් ප්‍රයිවට් ලිමිටඩ් | A4 බන්ඩල් 25 සැපයිම වෙනුවෙන් ගෙවීම | 25,050.00 |
| 2025.08.05 | 845 | සභාපති,ප්‍රාදේශිය සභාව, | 2025 ජුලි මස මන්ත්‍රී සභික දීමනාව ගෙවීම | 495,000.00 |
| | 846 | සභාපති,ප්‍රාදේශිය සභාව, | 2025.06.13,26 දින පවත්වන ලද සැලසුම් කමිටුව සඳහා කමිටු දීමනා ගෙවීම | 33,500.00 |
| 2025.08.06 | 847 | සභාපති,ප්‍රාදේශිය සභාව, | 2025.0.13 දින පවත්වන ලද තාක්ෂණික ඇගයුම් කමිටුව සඳහා කමිටු දීමනා ගෙවීම | 9,000.00 |
| | 848 | JOHN KEELS OFFICE AUTOMATION (PVT)LTD | ඡායා පිටපත් යන්ත්‍ර අලුත් වැඩියාව වෙනුවෙන් ගෙවීම | 50190.53 |
| | 849 | BRITEX SAFETY HOUSE (PVT)LTD | වෙළඳ සංකීර්ණය,කිරිවල්ලාපිටිය ආදාහනාගාරය,ඉඹුල්ගස්දෙනිය පුස්තකාලය,ප්‍රාදේශිය සභා ගොඩගැගිල්ල යන ස්ථාන වල ගිනි නිවීමේ උපකරණ සවි කරීම වෙනුවෙන් ගෙවීම | 54,850.00 |
| | 850 | පෝස්ට් මාස්ටර් ජනරාල් | තැපැල් මුද්දර ගාස්තු අලුත් කිරීම | 30,000.00 |
| 2025.08.07 | 851 | කේ.ඒ.එස්.ඩී. කළුආරච්චි | කොන්ත්‍රාත් පදනම මත සේවයේ යෙදවූ කාර්මික නිලධාරි කේ.ඒ.එස්.ඩී.කලුආරච්චි මහතාගේ ජුලි මස දීමනා ගෙවීම | 63,300.00 |
| | 852 | සභාපති,ප්‍රාදේශිය සභාව, | අපද්‍රව්‍ය කළමණාකරණ ව්‍යාපෘතියට අදාළ කම්කරු වැටුප් ගෙවීම | 102,480.00 |

| | | | | |
|---|---|---|---|---|
| 2025.08.11 | 853 | ජාතික ජල සම්පාදන හා ජලා පවාහන මණ්ඩලය | 2025.03.26 දින සිට 2025.04.26 ද අශෝක ක්‍රීඩාගන ජල බිල්පත සහ වැරැල්ලපත ජල කණුව ජල බිල්පත ගෙවිම | 58,830.86 |
| 2025.08.12 | 854 | පුබුදු වැඩිහිටි සමිතිය | රඹුක්කන සතිපොළ ගොඩනැඟිල්ලේ වැසි ජල බස්නා පීලී අලුත් වැඩියා කිරිම 10% අතරැදි මුදල් ගෙවිම | 45,489.60 |
| | 855 | රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය | ගංගොඩ සමඟි මාවත සංවර්ධනය කිරිම 10%රැදවුම් මුදල් ගෙවීම | 151,690.41 |
| | 856 | පින්නවල ග්‍රාමීය වැඩිහිටි කමිටු සංවිධානය | පින්නවල පනම්පිටිගොඩවත්ත මාර්ගයේ කන්ද කොටස කොන්ක්‍රීට් කිරිම | 24,250.00 |
| | 857 | JONE KEELS OFFICE AUTOMATION (PVT)LTD | PC - 073428 ඡායා පිටපත් යන්ත්‍රය අලුත් වැඩියා කිරීම | 52,017.16 |
| | 858 | පී.ජී. මල්ලිකා මන්ත්‍රීතුමිය | ගමන් වියදම් ඉල්ලිම | 700.00 |
| | 859 | සභාපති,ප්‍රාදේශිය සභාව, | 2025.06.13 දින තාක්ෂණික කමිටු දිමනා ගෙවීම | 750.00 |
| | 860 | ඩබ්.ජ්. තිළිබ ම ධුසංබ | ආදාපාන හිනාබෝව අඩනඇල්ල මාර්ගයට පිඹුරු පිටපත් ලබා ගැනිම සදහා අතින් වියදම් කළ මුදල් ගෙවිම | 1,416.00 |
| | 861 | බතඹුරය ගොවි සංවිධානය | ආයුර්වේදය රෝහල අසල සිට නාගවනාරාමය දක්වා මාර්ගය කොන්ක්‍රීට් කිරිම 10% අතරැදි මුදල් ගෙවිම | 24,250.00 |
| 2025.08.13 | 862 | Indra service Park (pvt)Ltd | LL -7614 ෆොටෝන් කැබ් රථයේ පූර්ණ වාර සේවාව සිදු කිරිම | 40629.93 |
| | 863 | Sri lanka insurance Coperation genaral Ltd | JU- 0022 ට්‍රැක්ටරය සඳහා රක්ෂණාවරණය ලබා ගැනිම | 9207.29 |
| | 864 | සභාපති,ප්‍රාදේශිය සභාව, | GG-2824 යතුරු පැදියේ දුම් සහතිකය හා ආදායම් බලපත්‍රය ලබා ගැනිම සඳහා අත්තිකාරම් මුදල් ලබා ගැනිම | 6,900.00 |
| 2025.08.14 | 865 | එස් ඩබ්.සි.එස්.නන්දන | අතිකාල දීමනා ගෙවිම | 6964.69 |
| | 866 | ජී.ජී.බී.ඒ. කුමාර් | අතිකාල දීමනා ගෙවිම | 7276.12 |
| | 867 | ජී.ඒ. බන්දුසේන | අතිකාල දීමනා ගෙවිම | 3048.96 |
| | 868 | එස්.ඩබ්.පී. ධර්මසේන | අතිකාල දීමනා ගෙවිම | 5577.91 |
| | 869 | ජේ.එන්.එල්.ජයසිංහ | අතිකාල දීමනා ගෙවිම | 3124.41 |
| | 870 | එච්.ඩබ්.ඒ.අයි.එල්. විරකෝන් | අතිකාල දීමනා ගෙවිම | 6213.31 |
| | 871 | එස්.එන්.නන්ද ශ්‍රි | අතිකාල දීමනා ගෙවිම | 4970.64 |
| | 872 | වී.ඒ.එස්.ප්‍රේමසිරි | අතිකාල දීමනා ගෙවිම | 4047.53 |
| | 873 | එස්.ඩබ්.ශ්‍රී ලාල් ශ්‍රියානන්ද | අතිකාල දීමනා ගෙවිම | 1432.15 |
| | 874 | ඩී.ඩබ්.ජී.ඒ. සඳරුවන් | අතිකාල දීමනා ගෙවිම | 3772.5 |

| | | | | |
|---|---|---|---|---|
| | 875 | ඩබ්.නලින් පුෂ්ප කුමාර | අතිකාල දීමනා ගෙවීම | 3490.74 |
| | 876 | එම්.ජී.ජ්.කේ.මැදවත්ත | අතිකාල දීමනා ගෙවීම | 11269.52 |
| | 877 | එම්.ජී.ජ්.කේ.මැදවත්ත | අතිකාල දීමනා ගෙවීම | 9,720.00 |
| | 878 | එන්.ජී. අජිත් ප්‍රියන්ත කුමාර | අතිකාල දීමනා ගෙවීම | 5493.94 |
| | 879 | එම්.එන්.පද්මසිරි | අතිකාල දීමනා ගෙවීම | 5588.88 |
| | 880 | කේ.පී.ධනුක ශ්‍රීමාල් | අතිකාල දීමනා ගෙවීම | 6,022.00 |
| | 881 | එස්.ජේ.එස්.සමරසිංහ | අතිකාල දීමනා ගෙවීම | 18227.67 |
| | 882 | එම්.ජ්.එල් මාලනී | අතිකාල දීමනා ගෙවීම | 1,944.50 |
| | 883 | එම්.ජ්.එල් මාලනී | අතිකාල දීමනා ගෙවීම | 2,252.50 |
| | 884 | ඩබ්.ඩබ්.ඩී.විරක්කොඩි | අතිකාල දීමනා ගෙවීම | 15847.91 |
| | 885 | එච්.සී.කේ. හෙට්ටිගොඩ | අතිකාල දීමනා ගෙවීම | 12,061.07 |
| | 886 | එච්.ජ්.සී.එල්.පියසේන | අතිකාල දීමනා ගෙවීම | 12,353.00 |
| | 887 | ඩබ්.ජ්. තිළිණ මධුශංක | ගමන් වියදම් ඉල්ලීම | 502.00 |
| | 888 | ආර්.එම්.එස්.ජ්.රත්නායක | ගමන් වියදම් ඉල්ලීම | 5,592.59 |
| | 889 | එම්.ජ්.එල් මාලනී | ගමන් වියදම් ඉල්ලීම | 1,338.18 |
| | 890 | එස්.ජේ.එස්.සමරසිංහ | ගමන් වියදම් ඉල්ලීම | 4,400.00 |
| | 891 | එන්.එස්.එල්. ගුණවර්ධන | ගමන් වියදම් ඉල්ලීම | 720.00 |
| | 892 | ඊ.ජී.එස්.ආර්.ඩී. හංසනි සේනක | ගමන් වියදම් ඉල්ලීම | 720.00 |
| | 893 | රල්.ආර්.ජ්.ඩී.කුමාරිහාමි | ගමන් වියදම් ඉල්ලීම | 4,850.00 |
| | 894 | ඩී.එම්.ටී.එන්. දසනායක | ගමන් වියදම් ඉල්ලීම | 506.00 |
| | 895 | තිලිණි නිරෝෂනි | ගමන් වියදම් ඉල්ලීම | 3,150.00 |
| | 896 | පී.ඩී.ඩබ්.චන්ද්‍රිකා කුමාරිහාමි | ගමන් වියදම් ඉල්ලීම | 490.82 |
| | 897 | ඩබ්.ඩබ්.ඩී.විරක්කොඩි | ගමන් වියදම් ඉල්ලීම | 4,400.00 |
| | 898 | ඩබ්.ඩබ්.ඩී.විරක්කොඩි | ගමන් වියදම් ඉල්ලීම | 3,880.00 |
| | 899 | වළල්ගොඩ එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය | වළල්ගොඩ ශ්‍රී වර්ධනාරාම විහාර මාර්ගය සංවර්ධනය කිරීම | 47,461.97 |
| | 900 | සභාපති,ප්‍රාදේශිය සභාව, | 2025.07.16 සහ 2025.07.24 දෙදින පවත්වන ලද සැලසුම් | 31,000.00 |

| | | | | |
|---|---|---|---|---|
| | | | කම්ටු සාමාජිකයින් සඳහා දිමනා ගෙවීම | |
| | 901 | ජාතික ජල සම්පාදන මණ්ඩලය | 2025.06.07 සිට 2025.07.07 දක්වා ඉඹුල්ගස්දෙනිය පුස්තකාලයේ ජල බිල්පත ගෙවීම | 1,216.92 |
| | 902 | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය | කාර්යාල දුරකථන බිල්පත් ගෙවීම | 11,289.09 |
| | 903 | ජාතික ජල සම්පාදන මණ්ඩලය | 2025 ජූනි සහ ජූලි මාස වල පෙර පාසල් ,පොදු වෙළඳපල ආදාහනාගාරය, ක්‍රීඩාංගන, පින්නවල ජල කණුව, ප්‍රාදේශිය සභාව,පෞද්ගලික බස්නැවතුම්පල යන ස්ථාන වල ජල බිල්පත් ගෙවීම | 104,434.08 |
| | 904 | ලංකා විදුලි බල මණ්ඩලය | 2025.07.01 සිට 2025.08.01 දක්වා ප්‍රාදේශීය සභාව , කොම්පෝස්ට් අංගනයේ විදුලි බිල්පත ගෙවීම | 48,132.80 |
| | 905 | ලංකා විදුලි බල මණ්ඩලය | 2025 ජූනි සහ ජූලි මාස වල පෙර පාසල් ,පොදු වෙළඳපල ඉඹුල්ගස්දෙනිය පුස්තකාලය,පරපේ,දැලිවල සායන, හේවාදිවෙල ආයුර්වේදය යන ස්ථාන වල විදුලි බිල්පත් ගෙවීම | 46,247.18 |
| | 906 | සි/ස විවිධ සේවා සමුපකාර සමිතිය | 2025 ජුනි මස වල ඉන්ධන බිල්පත් ගෙවීම | 491,652.50 |
| | 907 | ලේඛා ස්ටේෂනර්ස් | රඹුක්කන මහජන පුස්තකාලයේ ජුලි මසට අදාල පුවත්පත් සඟරා බිල්පත් ගෙවීම | 19,270.00 |
| | 908 | ලේඛා ස්ටේෂනර්ස් | ඉඹුල්ගස්දෙනිය මහජන පුස්තකාලයේ ජුනි මසට අදාල පුවත්පත් සඟරා බිල්පත් ගෙවීම | 17,410.00 |
| | 909 | යු.එස්.ඩී.ජේ. කුමාර | රඹුක්කන ප්‍රාදේශිය සභාවට අයත් මාර්ග වල GSI ක්‍රමවේදය යටතේ ගැසට් කිරිමට අදාල නිවේදන ඉංග්‍රීසි භාෂාවට පරිවර්තනය කිරිමට අදාල ගාස්තු ගෙවීම | 560.00 |
| | 910 | Witetree (pvt) Ltd | රඹුක්කන ප්‍රාදේශිය සභාවේ නිල වෙබ් අඩවිය නිර්මාණය කිරීම වෙනුවෙන් ගෙවීම | 209,975.00 |
| | 911 | Melco Elevator Company lanka (pvt) Ltd | විදුලි සෝපානය වසරක කාලයක් සඳහා අලුත් වැඩියා කටයුතු සිදු කිරීම සඳහා ගිවිසුම් ගත විම වෙනුවෙන් ගෙවීම | 394,419.72 |
| | 912 | ජී.ජී. ලක්මාලි | සේවක ඇප ආරක්ෂණ මුදල ආපසු ගෙවීම | 24,034.02 |
| | 913 | Johe Keells office Automation (pvt) Ltd | Toshiba ෆොටෝ කොපි යන්ත්‍රය වසරක කාලයක් අලුත් වැඩියා කටයුතු සිදු කිරීම සඳහා ගිවිසුම් ගත විම වෙනුවෙන් ගෙවීම | 20,091.86 |

| | | | | |
|---|---|---|---|---|
| | 914 | ඒ.කේ.ඩබ්. පුෂ්ප කුමාර | ආදාහනාගාරයට 37.5 Kg ලාෆ් ගෑස් සිලින්ඩර 06 සැපයිම සඳහා ගෙවීම | 105,395.00 |
| | 915 | පි.ජී. එල්.සි. කුමාර | RV-8542 ට්‍රේලරයේ වම්පස රෝදයේ පැච් එක දැම්ම | 600.00 |
| | 916 | පි.ජී. එල්.සි. කුමාර | RD-5925 ට්‍රැක්ටරයේ ඉදිරිපස රෝදයේ පැච් එක දැම්ම | 500.00 |
| | 917 | ජගත් ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෝ | කොම්පෝස්ට් අංගනයේ කසල පැටවිම, තුනි කීරිම සඳහා කුලී පදනමට ලබා ගත් ස්කැවේටර් යන්ත්‍රය සඳහා ගෙවීම | 93,035.00 |
| | 918 | ජගත් ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන්නෝ | කොම්පෝස්ට් අංගනයේ කසල හල්පිටියට ප්‍රවාහනය කීරිමට කුලි පදනමට ලබා ගත් ලොරි රථයට ගෙවීම | 765,575.00 |
| 2025.08.20 | 919 | Kegall distributors (pvt)Ltd | ආදාහනාගාරයට 37.5 Kg ලිට්රෝ ගෑස් සිලින්ඩර 06 සැපයිම සඳහා ගෙවීම | 105,395.00 |
| | 920 | සම්පත් ප්‍රින්ටින් | නිල මුද්‍රාවක් සැකසිම වෙනුවෙන් ගෙවීම | 825.00 |
| | 921 | පළාත් පාලන කොමසාරිස් | සංස්ථාපිත පණත් ලබා ගැනිම සඳහා ගෙවීම | 14,560.00 |
| | 922 | භාෂිත ගැෆික් | මුද්‍රිත ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 6,011.25 |
| | 923 | ආශා ප්‍රින්ටර්ස් | මුද්‍රිත ද්‍රව්‍ය සැපයීම වෙනුවෙන් ගෙවීම | 37,375.00 |
| | 924 | එස්.එම්.කේ.බී. සමරකෝන් | හාඩ්වෙයාර් උපකරණ සැපයීම වෙනුවෙන් ගෙවීම | 1,725.00 |
| | 925 | ඇන්තනීස් ඩිස්ට්‍රිබියුටස් ප්‍රයිවට් ලිමටඩ් | හාඩ්වෙයාර් උපකරණ සැපයීම වෙනුවෙන් ගෙවීම | 22,515.00 |
| | 926 | සුරමායා සෙරමික් | විදුලි අංශය සඳහා බවුත් 01 මිළදී ගැනිම | 1,850.00 |
| | 927 | චන්ද්‍රසේකර බ්‍රදර්ස් ප්‍රයිවට් ලිමිටඩ් | ලිපි ද්‍රව්‍ය සැපයිම වෙනුවෙන් ගෙවීම | 39,845.00 |
| | 928 | නිව් ජෙනරල් ට්‍රේඩින් | ලිපි ද්‍රව්‍ය සැපයිම වෙනුවෙන් ගෙවීම | 1,489.75 |
| | 929 | දිනපාල කොම්පැනි | පෙර පාසල් සහ මුදල් අයකැමි සඳහා කාර්යාල උපකරණ සැපයිම වෙනුවෙන් ගෙවීම | 111,315.00 |
| | 930 | ඩබ්.කේ. විජේසේකර | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 931 | බි. ජී.ඩී.එන්. ජයවිර | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 932 | ඩී.ජී.එස්. නන්දිසේන | ජල සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා තබන ලද ඇප තැන්පතු ආපසු ගෙවීම | 2,000.00 |
| | 933 | අධිකාරි,සේවක අර්ථ සාධක අරමුදල | 2000/01 සිට 2025/06 දක්වා නොගෙවූ කාල පරිච්ඡේද සඳහා අධිභාර මුදල් ගෙවීම | 3,497.05 |

| | | | | |
|---|---|---|---|---|
| 2025.08.21 | 934 | සභාපති,ප්‍රාදේශිය සභාව, | අගෝස්තු මස ස්ථිර සේවක වැටුප් ගෙවීම | 7264317.51 |

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කුමාර ධර්මසේන මැතිතුමා**

අංක 817 සංග්‍රහ වියදම් වුණේ කොහොමද?ක්ෂේත්‍ර පරීක්ෂණයකට අනතුරුදායක කුඹුක්ගහක් සඳහා සංග්‍රහ වියදම් කොහොමද?වුණේ යනුවෙන් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඒක අහන එක හොඳයි.ඒක ක්ෂේත්‍ර පරීක්ෂණයක් සම්බන්ධයෙන් වුණේ භූ විද්‍යා දෙපාර්තමේන්තුව,වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව,ප්‍රාදේශීය ලේකම් කාර්යාලය.ගොවිජන සේවා එකේ නිලධාරි මණ්ඩලයක් එක්ක අපි ක්ෂේත්‍ර කටයුතු කළේ.අපට අදාල එකක් නිසා ඒ මහතුන්ට සංග්‍රහයක් කළා ඒකේ වියදම බව ගරු සභාපතිතුමා පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කුමාර ධර්මසේන මැතිතුමා**

අංක 838 අඹනැල්ල මාර්ගය සඳහා සංග්‍රහ වියදමක් දරලා තිබෙනවා. ඒ පිළිබඳ විස්තර කිරිමක් අවශ්‍ය බව පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඒකත් එහෙමයි.අඹනැල්ල හීනාබෝව මාර්ගයේ ප්‍රශ්නයක් තිබෙනවා. හිටපු ලේකම් මහත්මිය ගේට්ටුවක් දාලා මාර්ගයක් අවහිර කරලා තියෙනවා. ඒ සම්බන්ධයෙන් ගැසට් එකේ තිබෙනවා අපට අයිති මාර්ගයක් කියලා. නමුත් නඩු මාර්ගයක් තිබෙන බැවින් එකේදි මට තනි තීන්දුවක් ගැනීමට දැනීමක් නැති නිසා මම මේක දිස්ත්‍රික් කමිටුවේ යෝජනා කළා ඉන්පසුව දිස්ත්‍රික් ලේකම්තුමා,නියෝජ්‍ය පොලිස්පතිතුමා,ප්‍රාදේශීය ලේකම්තුමිය එකතුව හා භූ විද්‍යා සංවිධානය ,ගොවිජන සේවා එක එක්කත් ප්‍රශ්නය මොකක්ද කියලා සිද්ධිය තහවුරු කර ගත්තා. ඒකට ගිය සංග්‍රහ වියදමක් මේක ඒක නීතිමය උපදෙස් පතමින් ක්‍රියාත්මක වෙන බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, ඒ මාර්ගය සම්බන්ධයෙන් දිගින් දිගටම එන ප්‍රශ්නයක් මට හිතෙන්නේ ලේකම්තුමිය වෙන්න ඇති ඒකට ගේට්ටුවක් දාලා තියෙන්නේ.අපිට මතකයි ගොවිජන සේවා එකේ තීරණයක් දීලා තිබුණා පාරක් නෑ කියලා.එතකොට අනික මේ මේකෙ මෙතුමාගේ පාක්ෂිකයෝ වෙන්න අයගේ ප්‍රශ්නයක්.මේක පෞද්ගලික ආරවුලක් කියලා මම දන්නේ.සභාවේ ලියාපදිංචි නැති මාර්ගයක්ය අනිත් එක ක්ෂේත්‍ර පරීක්ෂණයක් තියෙනවා.මේකට මාර්ගයේ ඉදිකිරීම පිළිබඳව අයිතිය තිබෙන්නේ සභාවටය. වෙනත් ආයතනයක් වන ප්‍රාදේශීය ලේකම් කාර්යායට යොමු කිරිම පිළිබඳ ගැටළුවක් තිබෙනවා.සභාවට ගැටලු තිබෙනවා නම් ඔබතුමාට පුළුවන් ඒක කරගන්න. මේක ක්ෂේත්‍ර පරීක්ෂණයක් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කැඳවා ගැනීම සිදු කලේ කුමන පදනමක් යටතේද? දැන ගැනීමට අපි කැමතියි.මෙය 91/92 පටන් එන පෞද්ගලික ආරවුලක විරෝධයක්.කුඹුක්ගසකට නියෝගය ගියා.ඒක පොලිසියෙන් ගෙන්නලා මිල කැඳවලා ටෙන්ඩර් කරලා මිල ගණන් දීලා ඒකට කැපීමට නියෝග කරලා තියෙන්නේ.මෑත ඉතිහාසයේ ඔබතුමා පත් වුණාට පස්සේ මේ නියෝගය අත්හිටුවා තිබෙනවා.මේ ප්‍රශ්නේ ඇදුන නිසා කියන්නේ අපි සභාවක් විදිහට නියෝගය දීලා නියෝල නතර කරනා කියන්නේ.සභාව පනට අනුව ගන්න තීරණයක් නිසා මේකේදී සභාව පහත් තත්ත්වයට වැටෙනවා. මොකද නියෝග ලබාදී තියෙද්දී අනතුරුදායක ගස් බවට නියෝගය දී ඇත.පනතේ බලතල අනුව එතකොට මේක කපන්න පුළුවන්. මේක දේශපාලනය දිගින් දිගට යන ප්‍රශ්නයක්ය. මේකට නියෝග දීලා මිල ගනන් කැඳවලා ඇත්තේ රු.68,000.00 ක ඒක පොලිස් ආරක්ෂාව දීලා ගිය වකවානුවේ හත්වෙනිදා කපන්න තිබුණේ. ඔබතුමාගේ නියෝගය මත තාවකාලික තිබෙනවා.මේක දේශපාලන අරමුණක් විදියට යන ගැටළුවක් ලසෙත්, ඉස්සරහට පරීක්ෂණ පවත්වා තිබෙනවා. අදාළ මාර්ගයක් නැත කියලා නමුත් වෙලත් එකක් එතුමියගේ ගේට්ටුවක් දලා තියෙන්නේ.මීරිහවක් පස්සේ යනවා

කියලා අපි දකින්නේ. දේශපාලන අරමුණකින් දේශපාලන කෝපයකින් වෛරයකින් යන දෙයක් බව පවසන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේකේ වෛරයක් නැත. දේශපාලන අරමුණක් නැත.තියෙන්නෙ වෙනම කතාවක් මේකේ නිතීමට ප්‍රශ්නයක් තියෙනවාද සභාවට මහජන පැමිණිල්ලක් හරි පෙස්සමක් හරි එනකොට එක ගැන ක්‍රියාත්මක වෙන්න ඕන. කුඹුක්හගහක් මැදින් කපන්න නියෝග දීලා තිබෙනවා. එයාලගෙ උවමනාව මුලින් ගලවන්නේ කියලා. පෞද්ගලික ආරවුලක් සමඟම ඊට එහා ගිය කරුණකුත් තිබෙනවා. ගැසට් එකේ පාරක් තිබෙනවා.ඉතිහාසයේ තිබුණ පාරක්ය. ඒකට අදාල හරි සැලසුම සොයාගත්තේ ගිය සභා වාරයේදීය. දිසාපතිතුමා ලියුමක් දීල තිබුණා මේ ගැන සෙවීමට ප්‍රාදේශීය සභාවේ සභාපති හැටියට මට බලතල පාවිච්චි කරන්න පුළුවන්. ඒවා වැරදියට පාවිච්චි කරන්න සූදානම් නැත. එතන ප්‍රශ්න එකක් නොවේ ප්‍රශ්න බොහොමයක් තිබෙනවා.මේ ප්‍රශ්නය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ තිබෙනවා. ආයතන කිහිපයක තිබෙනවා.ඒ නිසා සියලුම ආයතන සහභාගී වී සියල්ලගේ අදහස් ගත්තා. නැතිතම් අපි තනියම ගිහින් වැරදිකරුවෝ වෙනවා. කුඹුක්ගහටයි,මාර්ගයටයි.කැඳවුකරු මමයි. ඒකට ගිය වියදම් තමා ඒක බව පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කුමාර ධර්මසේන මැතිතුමා**

ප්‍රාදේශය සභාවට අයත් දෙයක් වෙනුවෙන් ගෙවීමක් කළාට විරුද්ධත්වයක් නැත. ප්‍රාදේශීය සභාවට අයත් නොවන දෙයක් නම් අපි විරෝධය පළ කරන බව පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

අපිට ඒ පිළිබඳව වගකීමක් තියෙනවා අපි ගෙවීමට විරුද්ධ නැති බව පවසන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සහා සම්මත විය.

*තීරණය -*

2025.07.29.දින සිට 2025.08.21 දක්වා උපලේඛන අංක 01 හි සඳහන් වියදම් දැරීම සුදුසු බව තීරණය විය.

**(ඊ).02.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.පී.සුදත් දූමින්ද ප්‍රේමසිරි මැතිතුමා**

i. කවුඩාඋල්ල,ගල්පොළ මාර්ගයේ තුන්මං හන්දිය අසල පැති බැම්ම සංවර්ධනය කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.පී.සුදත් දූමින්ද ප්‍රේමසිරි මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතමා විසින් ස්ථිර කරන ලදි.

- **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.පී.සුදත් දූමින්ද ප්‍රේමසිරි මැතිතුමා**

සභාපතිතුමනි, මේ යෝජනාවේ පැති බැම්ම බලන්නත් පැමිණියා. ඒකෙන් ජීවිත හානියක් පවා සිදු වීමට පුළුවන. මේ ළඟදි ටිපර් එකක පිටිපස්ස රෝදය එතැනින් පල්ලමට යන්න ගිහින් බොලොක්කයක් දමා ඇදලා ගත්තේ. පුළුවන් නම් මෙහි පැති බැම්ම හැකි ඉක්මනින් කරලා දෙනවා නම් හොඳ බවත්,අපේ කවුඩාඋල්ල වසමට මන්ත්‍රීතුමන්ලා දෙන්නෙක් සිටිනවා. එහෙත් කිසිම සංවර්ධනයක් වෙලා නැත.ඒක කරන අතරතුරේ තුන් මං හන්දියේ ලයිට් එකක් තිබෙනවා. ඒක දාලා දෙනවා නම් ලොකු දෙයක්ය. පැති බැම්ම හදලා ,ලයිට් එක දාලා දෙන්න මෙන් ඉල්ලා සිටින බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.පී.සුදත් දූමින්ද ප්‍රේමසිරි මැතිතුමා විසින් පවසන ලදි.

ii. කවුඩාඋල්ල,විදුලි බල මණ්ඩලය අසල කැන්දපිටිය දක්වා මාර්ගය ගල්පස් දමා සංවර්ධනය කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.පී.සුදත් දූමින්ද ප්‍රේමසිරි මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.පී.සුදත් දූමින්ද ප්‍රේමසිරි මැතිතුමා**

මගේ දෙවැනි යෝජනාවේ මුද්‍රණ දෝෂයක් වෙන්න ඇති එහි විදුලි බල මණ්ඩලය නොව විදුලි නඩත්තු ඒකකය ලෙස නිවැරදි විය යුතු බව සඳහන් කරන ලදි. සභාපතිතුමනි,මෙහි පවුල් 16 ක් පමණ ජීවත් වෙනවා.වැසි කාලයට ගමන් කිරිම අපහසුය.එම නිසා ගල්පස් දමා සංවර්ධනය කර දෙන ලෙස ඔබතුමාගෙන් ඉල්ලා සිටින බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.පී.සුදත් දූමින්ද ප්‍රේමසිරි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

**iii.** වරකාදෙන අළුපතඋල්ල මාර්ගය සංවර්ධනය කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.පී.සුදත් දූමින්ද ප්‍රේමසිරි මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.පී.සුදත් දූමින්ද ප්‍රේමසිරි මැතිතුමා**

සභාපතිතුමනි,මෙම මාර්ගයේ මුල් කොටස සංවර්ධය කර ඇත.සභාපතිතුමනි,උඩම හරියේ පවුල් හතක් ජීවත් වෙනවා. ත්‍රීවිල් එකක් ගමන් කිරිම තියා කිසිම දෙයක් ගමන් කිරිමට නොහැකිය. වැහි කාලයේදී කොහොමත්ද යන්න අමාරුයි. අවදානමිය.මීටර් 100 ක් හරි මීටර් 50 ක් හරි කොන්ක්‍රිට් කර එම මාර්ගය සංවර්ධන කර දෙන මෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටින බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.පී.සුදත් දූමින්ද ප්‍රේමසිරි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඔබතුමාගේ මතුකළ මුල්ම යෝජනාව ඒක ලොකු අවදානම් තිබෙනවා.ලොකු පැති බැම්ම ඒක අවදානමිය. ඔබතුමා එම ස්ථානය ශුද්ධ කර තියන්න අපට මැන ගැනීමට සඳහා යනුවෙන් ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.පී.සුදත් දූමින්ද ප්‍රේමසිරි මැතිතුමා**

එම මාර්ගයේ පැති බැම්මවල් දෙකක් තිබෙනවා.ලොකු පැති බැම්ම තමා කැඩිලා පවතින්නේ ඔබතුමා දකින්නට ඇති.ලෙස ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කේ.පී.සුදත් දූමින්ද ප්‍රේමසිරි මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනා ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -
අදාළ යෝජනා සංවර්ධන කිරිමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ).03.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා**

i. වහව සිට උඩුගම මංසන්ධිය දක්වා ජල නළ දමා ඇති අතර ඒ සඳහා ජලය ලබාදීම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එන්.මොහම්මදු සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා**

2014 වර්ෂයේ දැයට කිරුළ යටතේ ජලය ලබාදීමට ජල නළ එලා තිබෙනවා. මොනයම් හේතුවක් නිසා තවමත් ජලය ලබාදී නොමැත. මම ඒ ස්ථානයේ භෞතිකව බැලුවා විමසුවා. ඒ අවස්ථාවේ මට රත්නපුර පළාත් සභාවට කථා කළා.ඒ ස්ථානයේ මේ ජලය ලබාදීමට නොහැකි වුණේ.ජල ධාරිතාවය මදි නිසා බව පවසන ලදි.මෙම ව්‍යාපෘතිය සඳහා පවුල් 650 ක් පමණ සිටින බවත්,පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි පී.ජී.මල්ලිකා මැතිතුමිය**

පළමු යෝජනාව වල්ගම මාර්ගයට ජලය ලබාදීම සම්බන්ධයෙන් 2014 මහීපාල මහත්තයා මහ ඇමති වෙලා ඉන්න කාලයේ තමා ජල නළ දැම්මේ. මගේ දැනීමේ හැටියට දෙවතාවක් ජලනල ගිහින් දමා තිබෙනවා. මම සභාවේ සිටින විට මේ සම්බන්ධව අපේ අමාත්‍යාංශයට කතා කරලා කියවා.ඒත් හම්බවුණේ නැත. අපිට ජලය මේ දවස්වල නැතුව ජලය හිඟයක් පවතිනවා.අපට මේක ලියාපදිංචි කරලා තිබෙන්නේ පුවක්මොටේ ළඟට නමුත් ජලය නැත.මේක හොඳ යෝජනාවක් මම යෝජනාව අනුමත කරනවා. මේ ජලය ලබා දෙන්න පුළුවන් නම් මොකක් හරි ක්‍රමයකට ලබා දෙන ලෙසත්,එක සැරයක් කීවා අහුපිනිඇල්ලෙන් දෙනවා කියලා, තව සැරයක් කිව්ව පනලිය පැත්තෙන් දෙනවා කියලා,හිරිවඩුන්නෙන් දෙනවා කිවා.නමුත් කොහෙන්වත්

හම්බවුණේ නැත.ජල නළ දමලා තියෙන්නේ. ඒවා දිරාපත් වුණොත් නැවතත් රජයට විශාල මුදලක් අපතේ යනවා. ඊට කලිනුත් බට දමා ඒවා ගලවලා අයින් කරලා ලොකු මුදලක්අපතේ ගියා. ඒ හින්දා මම කියන්නේ මේ යෝජනාව අනුමත කරලා මේකට ජලය ලබා දුන්නොත් හොඳයි කියල. මමත් අනුමත කරන බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී පී.ජී.මල්ලිකා මැතිතුමිය විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මම හිතන්නේ ඉන්දික සමන් කුමාර මැතිතුමා යෝජනාව කරපු යෝජනාව වෙලා තියෙන්නේ ජලය ලබා ගැනීමේ යෝජනාව සභාවෙන් ඉක්මන් කරන්න ඇති. මේක ක්‍රියා කරන්නේ එතුමාගේ ප්‍රකාශය අනුව පසුගිය ආණ්ඩුවේ දැයට කිරුළ මගින් කරන්නට හැදූවා යනුවෙන් සඳහන් කළා.මෙච්චර මුදලක් මං හිතන්නේ ආයතනයක කළමනාකරණය හා දේශපාලන අධිකාරිය මගින් කරන්ට ඇත.දේශපාලන අධිකාරිය බලන්නේ ජනතාවට සේවය කරන්න.ඕනෑම පක්ෂයක් ජනතාවට සේවය කරන්න බැඳිලා ඉන්නවා. එතකොට එම ඇමතිවරයා හෝ මන්ත්‍රීවරයා යම්කිසි මුදලක් මෙතෙන්ට වියදම් කරලා ජල නළ ලබාදෙන්න කියනවා. බට එලූවට පසුව වතුර ධාරිතාව මදි කියනවා.ගරු සභාපතිතුමනි එතැනදි දේශපාලනයට යොමු කරන්නේ නැතුව ජලය සම්පාදන කරන්න නොහැකිය.මොකද දේශපාලනය බලන්න මහජනතාවට සේවය කරන්න.ජල සම්පාදනය මණ්ඩලය මේකේදී දෙන්න නොහැකි බව ප්‍රකාශ කරනවා.මේ ව්‍යාපෘයට ජලධාරිතාවය මදි කියනවා.දේශපාලන අධිකාරියට මේකෙදි වැඩක් කරන්න ගිහින් එම ප්‍රදේශයෙන් අප්‍රසාදයට ලක් වෙනවා. ආයතන ප්‍රධානීන් කරපු වරදකට දේශපාලන අධිකාරියේ මෙහිදී ලොකු මුදල් වියදම් කරනවා. එතකොට මේක ආයතනය කරපු වරදක් හැටියට තමා මම දකින්නේ.මේකට ජල නළ ලබාදීම අනුමත කළාට පසුව තමා අවශ්‍ය කටයුතු භාර දෙන්නේ.ඒ නිසා ජල සම්පාදන මණ්ඩලය දැනගන්න ඕන අවශ්‍යය ජලය දෙන්න.මෙහිදී දේශපාලන අධිකාරියි,ජනතාවයි නොමඟ හරින්නේ ජල සම්පාදන මණ්ඩලය.එතකොට මේකට වෙනම ක්‍රියාමාර්ගයක් ගත යුතුව බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.අනීස් මැතිතුමා**

වල්ගම/උඩුගම ප්‍රදේශයට ජලයේ සැපයිම අත්හිටුවා තිබෙනවා. ගරු සභාපතිතුමනි,මම ජල සම්පාදනය මණ්ඩලයට වෙන වැඩකට ගිය අවස්ථාවේ මේ පිළිබඳ කථා කළා.අපේ උඩුගම පැත්තට ජලයේ සැපයීම සම්බන්ධයෙන්.ප්‍රදේශය භාර මන්ත්‍රීතුමා එතුමාත් කතා කළා.එහි බට වළලලා තියෙන්නේ. ඒවට වතුර දීමේ ප්‍රශ්නයක් තිබෙනවා. ජලය එන වේගය මදි.නමුත් ඒගොල්ලෝ ගාමට එක ළඟට එනකන් අලුත් Line එකක් සපයලා තිබෙනවා. මේ ජල ප්‍රශ්නයෙන් පවුල් 450 පීඩා විඳිනවා, වතුර ලබා දෙන බලාපොරොත්තු වෙන් සිටිනවා.මං හිතන්නේ ළඟදිම ඒ ප්‍රදේශයට වතුර ලබා දෙයි. මාස කිහිපයක් තුළ ඒ ප්‍රදේශයට ජලය ලබා දිමට කටයුතු කරන ලෙස ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.අනීස් මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

එම යෝජනාවට ඇත්තටම හොඳ යෝජනාවක්. අපි මහජන නියෝජනය විදිහට ඇවිත් ඉන්නේ මහජනතාවට සේවය කරන්න.කාලයක් තිස්සේ ක්‍රියාත්මක නොවූ ව්‍යාපෘතියක් තමා ක්‍රියාත්මක කරන්න කියලා තමා මේ යෝජනාවෙන් අදහස් කරන්නේ.නමුත් රුක්මන් මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට අපට මේකට මැදිහත් වීමට පුළුවන් කාරණයක් නොවේ.මොකද මේක ජල සම්පාදනයෙන් තමා කරන්න ඕන.පසුගිය කාලේ මේක අපේ හිටපු මහ ඇමතිතුමා මහීපාල ඇමතුමා ප්‍රමුඛ කනක හේරත් මැතිතුමා ප්‍රමුඛ දේශපාලන අධිකාරිය මැදිහත් වෙලා තමා මේක ක්‍රියාත්මක කළේ.නමුත් මේකට ජලය ලබාදීමට අපොහොසත් වුණා.ඒ අවස්ථාවේ තිබුණු විවිධ හේතූන් මත මොකද?රඹුක්කන ජල සම්පාදන හරහා ලබාදෙන ජලධාරිතාවය ප්‍රමාණවත් වුණේ නැත. කෑගල්ල නගරයේ පවා රඹුක්කන ජලය ගෙන යනවා.නමුත් මේ ප්‍රශ්න ටික කෙරීගෙන යන අවස්ථාවක් තිබුණා. අහුපිනි ඇල්ල ව්‍යාපෘතිය පවා ජලය ලබාදෙන මාවනැල්ලේ ඉඳන් සකස් කළා. එතකොට මේ ප්‍රශ්න ටික ටික විසඳේ.ඒකෙදි ඔබතුමා මැදිහත් වෙලා මේ යෝජනාව අදාල ආයතන දැනුවත් කරනවා නම් හොඳය.පදවි ගම්පල ගම දක්වා බට Line යනවා. ඒකටත් විශේෂ අවධානය යොමු කරන්න.ඒ එක්කම මේ යෝජනාව සංශෝධන සහිතව ඉදිරිපත් කරන්න කියලා මම එතුමාට යෝජනා කරනවා.එහෙම නැත්නම් මේක අදාළ ආයතන දැනුවත් කරන්න කියලා යෝජනාව සංශෝධන සහිතව ඉදිරිපත් කරනවා යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඔය කාරණය අද ඊයේ ආපු ප්‍රශ්නයක් නොවෙයි. මේ සභාවට එන්න කලින් මම මැදිහත් වෙලා පෙන්නුවා. බට වළලා තිබෙන්නේ. Line එක පටන් ගන්න ඕන තැන් දෙකකින් එහාට වෙන Line එකක් දාන්න ඕන. ගාමට් එකේ මෙහා පැත්තට එනකොට මීදුම දිහාට බොහෝ දුරයි කියලා උපකල්පනා කරනවා. එතකොට මාස දෙක තුනකින් වතුර දෙයි. කවුරු කළා නමුත් අගේ කරන්න ඕන බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත විය.

ii. වල්ගම මාතෘ සායනය සඳහා ජලය ලබා ගැනිමට අවශ්‍ය කටයුතු සලසා දිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උප සභාපතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා**

කුඩා දරුවන් හා ගැබිණි මව්වරු මේ සායනය සඳහා සහභාගී වෙනවා.ඒ අයට ජලය ලබා දෙන්නේ පෞද්ගලික ළිඳකින්ය. වතුර ටැංකිය තියෙනවා.ටැංකිය සිදුරු වී ඇත. වැසිකිළි සඳහා ද ජලය නැත. ඒ නිසා මෙම සායනයට වතුර ලබා දෙන්න කියලා යෝජනා කරන බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ආර්.ඉන්දික සමන් කුමාර මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මං හිතන්නේ ගරු ඉන්දික මන්ත්‍රීතුමා ගෙනා යෝජනාව විවාදයකින් තොරව සභා අරමුදලෙන් කඩිනමින් කරන්න. ඊළඟ සභා වාරයේ එන්න කලින් කරන්න. පුළුවන් එක ඔබතුමාගේ දක්ෂතාවයක් ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය අරගෙන කරන්න පුළුවන් බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි පී.ජී.මල්ලිකා මැතිතුමිය**

මේ යෝජනාවට මම කරුණු ඉදිරිපත් කරනවා. අපිට තිබෙන්නේ මේ සායනය තමයි. ගැබිණි මව්වරු පොඩි ළමයින් ආපහු වතුර නැත. ළඟ ළිඳකින් තමා වතුර දෙන්නේ. ඒ දුන්නත් මේ දවස්වල වතුර නැහැ.ඒ නිසා ඒ ගෙවල් වලත් වැල් එක වහන්න පුලුවන්. ඒ හින්දා වතුර ලබා ගන්න ටැංකිය සිදුරු වී ඇති බැවින් ඒ සඳහා අලුත් ටැංකියක් ගෙනිහින් තියලා හරි වතුර ටිකක් ගෙනිහිල්ලා දෙනවා නම් ලොකු පිනක් බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි පී.ජී.මල්ලිකා මැතිතුමිය විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සභාපතිතුමා අපේ ජල බවුසරය අරගෙන ගිහින් ටැංකියක් ද අරගෙන ගිහින් ජලය ලබා දෙන්නේ. ඒක සද්භාවයෙන් කරන්නේ.අපේ විරුද්ධත්වයක් නැති සඳහන් කරන ලදි. අදාළ සායන දවස් වලට වතුර ටැංකියක් අරගෙන ගිහිල්ලා තියලා අපේ ජල බවුසරයෙන් ජලය ලබා දෙන්නේ. ඒකට අපි කිසිම විරුද්ධත්වයක් නැති බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපි ජල බවුසරයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ඉල්ලීමක් කළා.අපට ලබා දුන්නට පස්සේ කටයුතු කරන්න සූදානම් බව සඳහන් කරන ලදි.ඒකට ප්‍රශ්නයක් නැති ද සමීර මන්ත්‍රීතුමා,අපි මේ ස්ථානයේ පරීක්ෂා කරලා එය කරමු. යනුවෙන් ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ).04.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

i. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමා/මන්ත්‍රීත්මියන්ලාට මසකට අවම රු.8000 ක යැපීම් දීමනාව හා ගමන් දීමනාව වැය කර අඩුපාඩුව පවතින ආයුර්වේද මධ්‍යස්ථානයක් ඉදිකිරිමට සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මෙම යෝජනාවේ ගෙනාවේ සද්භාවයෙන් ඒ නිසා විවාද එයි. මොකද මම දැක්කා රෝගීන් එතැනට එනකොට සෑහෙන අපහසුතාවයකට ලක් වෙනවා.අනෙක් බැංකු දෙක නිසා. සභාවේ අපේ සියලුම මන්ත්‍රීතුමන්ලා සිටින්නේ මහජනතාවට සේවය කරන්න. ඒ නිසා මේ යෝජනාව ස්ථිර වුනේ නැති එක ගැන කණගාටු වෙනවා.මොකද අපි ගෙනාවේ සද්භාවයෙන්ය.ජනතාවට සේවය කරන්න වරප්‍රසාද බලාගෙන නොවෙයි.ඒ නිසා මෙම යෝජනාව ඉදිරිපත් කළේ. ස්ථිර නොවුණාට කණගාටුව ප්‍රකාශ කරනවා. ඉදිරි කටයුතු කරගෙන යන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ආයුර්වේද මධ්‍යස්ථානයක් සකස් කළොත් හොඳයි.එතුමා ආයුර්වේද මධ්‍යස්ථානය දැමීමට යෝජනා කළා.මම පුද්ගලිකව සිතුවා මොකක් හරි කරලා ආයුර්වේද මධ්‍යස්ථානය දැමීමට.අපිට මේ අවුරුද්දේ ප්‍රතිපාදන නැත. ඒ වුණාට උත්සාහයේ අත්හැරලා නැති බව පවසන ලදි. දුම්රිය ස්ථානයේ නිල නිවාසය සම්බන්ධයෙන් හෝ වහව උපකාර්යාලය හා ටී.සී. ගොඩනැගිල්ල හරි ලබා ගැනිමට අදහස් කරනවා. විගණන කටයුතු අවසන් වෙලා තිබෙන බැවින් මොකක් හරි කරලා ආයුර්වේද මධ්‍යස්ථානයක් පටන් ගන්නව. ඔබතුමාට අවස්ථාව දෙනවා ඒ ළඟ යෝජනාව ඉදිරිපත් කිරිම.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

සභාපතිතුමා මේ යෝජනාව ස්ථිර කළ බවට පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මම හිතන්නේ මේ යෝජනාවට සමහර මන්ත්‍රීවරු කැමති නැති බව සඳහන් කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී පී.ජී.මල්ලිකා මැතිතුමිය**

අපට ඒ රු.8000.00 අත්‍යවශ්‍යයි.අපිට ගමන් වියදම් තිබෙනවා.දුරකථන තිබෙනවා යනුවෙන් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනී පී.ජී.මල්ලිකා මැතිතුමිය විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජේ.එස්.පුෂ්ප කුමාර ධර්මසේන මැතිතුමා**

ඔබතුමාලාගේ මන්ත්‍රීවරු හයදෙනෙක් ගිය මාසයේ රු.679 ගානේ දැනටමත් අරගෙන තිබෙනවා.එක නිසා අත්‍යවශ්‍ය වන බව පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

රු.8000.00 ගානේ අපිට ලේසි නැත. යැපීම් දිමනාව නිසා අවදානයක් බව ගරු සභාපතිතුමා පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා**

සභාව සඳහා රු.8000.00 ක් ලබා දි ඇත්තේ. ඉන්ධන වියදම්,දුරකථන වියදම් මම වුණත් එන්නේ ඉඹුල්ගස්දෙණියේ සිට වාහනයට පෙට්‍රල් සඳහා මට රු.1000.00 යනවා. අනෙක් සභාවල සියලු දෙනා මේ යෝජනාව ආණ්ඩුකාර තුමියට යවලා තිබෙනවා. අපිත් ඒකමතික තීරණයක් අරගෙන ආණ්ඩුකාරතුමියට යවමු. අපිට රු.8000.00 දීමනාවක් වශයෙන් දෙන්න කියලා. මොකද? වරකාපොළ මුළු සභාවේ ඔක්කොම යවලා තියෙනවා. ඒක එහෙම කරමු. නැත්නම් අපිට දීමනාව වශයෙන් ගන්න වෙන්නේ නැත. අපට පැමිණීමට දීමනාව ගැනිමට නොහැකිය. මොකද පැය 12 ක් ආවරණය වෙන්න ඕන. ඒ නිසා අපි සියලු දෙනාම ඒකමතික තීරණයක් අරගෙන ආණ්ඩුකාරතුමියට මේක යවමු. ඒක නොදෙන එක එහේ වැඩක් බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.එන්.ප්‍රියංජිත් රාජපක්ෂ මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සභාපතිතුමනි, මම යෝජනාවට ගෙනාවේ වෙනත් කාරණයක් සභාවේ විග්‍රහවෙන්නේ වෙනත් කාරණයක් නිසා මම දැන ගැනිමට කැමති මේ යෝජනාව මොකද වෙන්නේ ඡන්දයකින් පරද්දනවද? ඒකට සභාව තීරණය කරන්න ඕන.ඉදිරි කටයුතු කරන්න.ඒක ඒකමතිකව සම්මත වුණොත් මේකට තීරණයක් ගන්න වෙනවා. සමහර අය පරස්පර අදහස් ප්‍රකාශ කළා. ඔබතුමා මේක ඡන්ද විමසිමේදී යෝජනාව සම්මත වුණොත් ඔබතුමාට මේක ක්‍රියාත්මක කරන්න වෙනවා. නැති වුනොත් මේකේ සභා වාර්තාවෙන් වැඩක් වෙන්නේ නැති බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඡන්දයක් දීම ඇරඹුවොත් මේක දුර දිග ගියොත් මම අනෙකට බැඳෙනවා. මොකද රු8000.00 යැපීම් දීමනාවක් නිසා නීතිමය ප්‍රතිපාදන එන්නෙ නැත. ඒක නීති විරෝධියි. මේක අධිභාරයට ලක් වෙනවා. කවදා හරි ගෙවන්න වෙනවා. සංයුක්ත දිමනාව බාහිර විගණනයට ලක්වේ. අපි ඒකට පිටින් යන්න නොහැකිය. මේකට බෙදීමකට ගියාට වැඩක් වැඩක් නැත. නොකරන දෙයකට කටයුතු කිරිමට නොහැකි බව ගරු සභාපතිතුමා පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

රුපියල් 8000.00 ගන්න යෝජනාව ක්‍රියාත්මක කරනවා නම් ගරු ආණ්ඩුකාරතුමියට යවන්න ඕන.අපට ලැබෙන මුදල එකතු කරලා ආයුර්වේදයක් හදන්න ඕන. සියලුම මන්ත්‍රීතුමන්ලාගේ අදහස් වන්නේ තමන්ට ලබා ගැනීම එතකොට ඒක පරස්පරයි.අපි මේ යෝජනාව ක්‍රියාත්මක වෙන්නේ කොයි ආකාරයට මම යෝජනා කළේ ආයුර්වේදයක් හදන්න.එතකොට මේ ආණ්ඩුකාරතුමියට යවන්නට හදන්නේ රු8000.00 ලබා ගැනිමට රු8000.00 ලබා ගැනිම ආණ්ඩුකාරතුමිය අනුමැතිය දුන්නොත් යෝජනාව සම්මත විදිහට යවන්න ඕන.යෝජනාවේ තිබෙන්නේ මේක රු8000.00 ක උපරිමකට යටත් කරලා අනුමැතිය දෙන්න ආයුර්වේදයක් හදන්න. එතකොට ආණ්ඩුකාරතුමියට මේක අවසර දුන්නොත් ආයුර්වේදයක් හදන්න වෙනවා. එතකොට අපේ ප්‍රියංජිත් මන්ත්‍රීතුමා කිව්වා අපට ඒ රුපියල් 8000.00 ලැබිය යුතුයි. මම සභාවක් විදියට න්‍යාය පත්‍රයට අනුව යෝජනා කළේ ආයුර්වේදයක් හදන්න. මම මේක ඉල්ලා අස්කර ගන්න නැත. මේකට විරුද්ධව ප්‍රකාශ කර ඔබතුමාලා මේක අස්කර ගන්න.මට ඒක ප්‍රශ්නයක් නෑ. මම ඒ ගෙනාවේ සත්භාවය මොකද ඒ ඉදිරියට වැඩ කටයුතු කරන්න ඔබතුමාටලාට තියෙන්නේ ඡන්දයක් විමසන්න ඒක ඉල්ලා අස්කර ගන්න යනුවෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ සඳහා අදහස් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා පවසන ලදි.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

රුපියල් 8000.00 ක දීමනාව අපිට ගැනිමට ගැටලු සහගතයි. පැය 6 ක කාලයක් සභාවේ කාර්යයන් සඳහා යෙමු වුණොත් පමණයි. මේක ගන්න පුළුවන්. ඔබතුමා යෝජනා කරන්නේ ඒ දෙන දේ කොහොම හරි අරගෙන රුපියල් 8000.00 ක දීමනාව කෙලින්ම මේ ව්‍යාපෘතියට දැමීමටනේ අදහස් කරන්නේ යනුවෙන් ගරු උපසභාපතිතුමා පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා**

අපි මේ මත විමසිමකට යන්න නොදෙන දිමනාවක් සම්බන්ධයෙන්. දැනට ලැබෙන දීමනාව නම් මොන යම් හරි තීරණයකට යන්න පුළුවන්.ඔබතුමා යෝජනා ස්ථිර කළාට ඡන්ද විමසීමකට යන්න තරම් මේක ප්‍රමාණවත් නොවෙයි.හේතුව අපට වියදම් දීමනාව හම්බවෙන්නේ නැති නිසා.ඒක අරගෙන ඉවර වෙලා පසුව මෙතුමාගේ යෝජනාවට අපට අදහස් දක්වන්න පුළුවන් බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.එම්.ආර්.එස්.ප්‍රියමාල් දසනායක මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

47 I රීතිය තියෙන විදිහට අපිව දැනුවත් කර තිබෙන්නේ ගමන් වියදම් ගන්න ඕන ක්‍රමවේදයක් තියෙනවා. ඒ ක්‍රමවේදයට පටහැනි වෙනවා.ඔබතුමාගේ යෝජනාව ඉදිරියට ගියොත්.ඒ වගේම අපි මේ රීතියට අභියෝග

කළා වෙනවා. ඒ නිසා ප්‍රියංජිත් මන්ත්‍රීතුමා යෝජනා කළ පරිදි අපි සභාවෙන් ආණ්ඩුකාරතුමියට විමසුමක් කරලා දෙවනුව මේ යෝජනාව ක්‍රියාත්මක කරනවා නම් සාධාරණ බව ගරු උපසභාපතිතුමා පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

ගරු සභාපතිතුමා, මම යෝජනා කරනවා. අපේ මේ ප්‍රියංජිත් මන්ත්‍රීතුමා පැවසූ ආකාරයට අපි මේක යෝජනාවක් විදිහට ඉල්ලීමක් කරන ලෙස පවසන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මේ පනත යටතේ පටහැනිය. අපට ලබා දෙන එකක් නැත.ඔබතුමාලා ඉල්ලනවා නම් යෝජනාවක් වශයෙන් ඉල්ලීමක් කරන ලෙස ගරු සභාපතිතුමා පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

ලිඛිතව අවශ්‍ය නම් දෙන්නම් මම යෝජනා කරනවා. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් සඳහා රඹුක්කන ප්‍රාදේශීය සභාවේ යැපුම් දීමනාවට අමතරව රු8000.00 දීමනාව ලබා ගැනීමට ගරු ආණ්ඩුකාරතුමියට ඉල්ලා යැවීම සුදුසු බවට යනුවෙන් පවසන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඒක මන්ත්‍රීතුමාලා මට න්‍යාය පත්‍රයේ නිසා නැති ඉදිරිපත් කිරීමට නොහැකිය.මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා එක ලිඛිතව ලබා දෙන්න. අපි ඒක යොමු කරලා දෙන්නම්. ඉල්ලීම් ලිපියක් ලබා දෙන ලෙස ගරු සභාපතිතුමා පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත නොවීය.

තීරණය -
ගරු ආණ්ඩුකාරතුමියගේ අවසරය ලබා ගැනීම ඉල්ලීම් ලිපියක් ගරු සභාපතිතුමාට ලබා දීමට තීරණය විය.

ii. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීතුමන්ලා/මන්ත්‍රීත්මියන්ලාට කොට්ඨාශයේ සංවර්ධන කටයුතු සඳහා රු.ලක්ෂ 5 ක මුදලක් හෝ එක් සංවර්ධන යෝජනාවක් සඳහා ලබා දිමට යෝජනා කරමි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මගේ දෙවැනි යෝජනාව ඉල්ලා අස් කර ගන්නා බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින පවසන ලදි.

**(ඊ).05.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

i. පින්නවල සත්වෝද්‍යානය සහ මාර්ගය අතර ඇති කොටසේ අපනයනය කළ හැකි විසිතුරු මල් වගාවක් ප්‍රදේශයේ තෝරාගත් අඩු ආදායම් ලාභී පවුල් සඳහා ආදායම් උත්පාදනය කළ හැකි ව්‍යාපෘතියක් සැකසීම හා ඒ සඳහා අදාළ රාජ්‍ය ආයතන සමඟ සාකච්ඡා කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

මේකේ ඇත්තටම අපේ සභාවේ ක්‍රියාපටිපාටිය ඇතුලේ තිබෙන යෝජනාවකට වඩා එහා ගිය දෙයක් මොකද සත්වෝද්‍යාන භූමිය අපිට අයිති භූමියක් නොවේ.නමුත් ඔබතුමා මට මතකයි.මුලින්ම සඳහන් කළා රාජ්‍ය ආයතන සමඟ සාකච්ඡා කරලා ඔබතුමාලාගේ ආණ්ඩුවේ ඒ අවබෝධතාවයක් එක්ක කටයුතු කරන්න පුළුවන් බවත්, සූදානමක් තියෙන බවත් පැවසුවා.ඒ අනුව මට හිතුණා මේ යෝජනාව තමුන්නාන්සේලා ලවා සිදු කර ගැනීම අවකාශය තිබෙන බව පවසන ලද.විශේෂයෙන් පින්නවල සත්වෝද්‍යාන අයත් මාර්ගය අයිනේ තිබෙන ඉවුර ඔබ තමුන්නාන්සේලා දන්නවා ඇති.පාරේ ගමන් කරන කොට පේනවා දැනට විවිධ අවස්ථාවලදී

කැළැවැහෙනවා.සත්වෝද්‍යානය මගින් ඒක සුද්ද කරනවා.එක එක මල් ජාති හදලා තිබෙනවා.නමුත් ඒක ඇත්තටම අව ලස්සනක් එකතු කරනවා.ඒ වගේම මේ යෝජනාව ක්‍රියාත්මක කළොත් ප්‍රදේශයේ අඩු ආදායම්ලාභී පවුල් සඳහා ආදායම් මාර්ගයක් උත්පාදනය කරන්නට.ඒකට මූලික වියදම සභාව මැදිහත්වී වගා කටයුතු සිදු කරලා යම් ප්‍රදේශයක් ඒ කියන්නේ භූමි භාගයක් තෝරාගත් පවුල් සඳහා ලබා දෙන්න පුළුවන්.එය ලබාදීමේදී ප්‍රමුඛතාවය ගන්නට අපි විවිධ ආයතන සම්බන්ධ කර ගැනිමට පුළුවන.එසේ සිදු කර ගෙන අඩු ආදායම්ලාභීන්ගේ මාසිකව ඒ අයට ආදායමක් උත්පාදනය කිරීමට හැකිවන ආකාරයට කර ගැනීමට පුළුවන්ය. මූලික අදියරයේදී අපි මැදිහත් කර දෙනවා. දෙවැනි අදියරයේදී ඒ අයට වගා කටයුතු,නඩත්තු කටයුතු සිදු ගෙන යාමට පුළුවන්ය.මොකද සත්වෝද්‍යානය මේක අකමැති වෙන එකක් නැති වෙයි. ඒක නිතර නඩත්තු කරනවාට වඩා ප්‍රදේශයේ ජනතාව මගින් නඩත්තු කර ගැනීම හරහා ඒ අයටත් සේවාවක් ලබා දෙන්න පුළුවන්ය. ඒ නිසා මම යෝජනා කර මේ යෝජනාව හැකි ඉක්මණින් ක්‍රියාත්මක කරන්න. ඔබතුමාගේ මැදිහත් වීම බලාපොරොත්තු වෙන බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා**

මෙහි සඳහන් කරනවා. අඩු ආදායම් ලාභීන් ලෙස.එම කොටසට අයිති අය පින්නවල කොට්ඨාශයට ආසන්නව ලබා ගන්නවාද ? අඩු ලාභීන් පවුල් සඳහන් කරන්න යනුවෙන් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

ගරු සභාපතිතුමනි, අපිට ඒක ඉදිරියේදී සාකච්ඡා කර ගැනීමට පුළුවන්.අපි විශේෂයෙන් පින්වල කොට්ඨාසයේ ද ?එහෙම නැත්නම් ආසනය පුරාමද? කියන එක අපට මේ යෝජනාව ක්‍රියාත්මක කරන අවස්ථාවේදී සාකච්ඡා කර ගන්න පුළුවන්.එතකොට මෙතුමාගේ ප්‍රශ්නයට පිළිතුරු ලැබෙන බව පවසන ලදි.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

සමීර මන්ත්‍රීතුමාතේ යෝජනාව ඉතාමත් කාලෝචිත යෝජනාවක් කියලා මං හිතන්නේ. මේ යෝජනාව සම්බන්ධව ආණ්ඩුවේ වැඩපිළිවෙලක් ඉදිරියේදී කරගෙන යනවා.අපි වසම් මට්ටමෙන් ප්‍රජා සමිති වැඩපිළිවෙල එනම් මේ මන්ත්‍රීතුමා පැහැදිලි කරා වගේ කමිටු සකස් කරලා වසමේ සිටින අඩු ආදායම්ලාභීන් තෝරා ගෙන ක්‍රියාත්මක කිරිමට වැඩපිළිවෙලක් සකස් කිරීමට බලාපොරොත්තු වෙන බවත්,මෙම යෝජනාව සඳහා ආණ්ඩුවේ සහයෝගය දැනටමත් ජාතික ප්‍රතිපත්තිය ඇතුළෙ තිබෙනවා. මෙම යෝජනාව කරන්න පුළුවන් ප්‍රතිපත්තිය ඇතුලේ තිබෙන නිසා බව පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මන්ත්‍රීතුමාගේ ඒ යෝජනාව භාර ගන්නවා.බලාපොරොත්තු වෙනවා ඔබතුමාගේ සක්‍රීය දායකත්වයත් අපට ලබාදෙයි කියලා බව ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාල යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

ii. රාජ්‍ය ආයතන ඩිජිටල් කරණයට සමගාමීව රඹුක්කන ප්‍රාදේශීය සභාව මූලික කර ගනිමින් අනෙකුත් රාජ්‍ය ආයතන සම්බන්ධ වන ආකාරයට ජංගම දූරකතන යෙදවුමක් ස්ථාපිත කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

සභාපතිතුමනි,මම මේ යෝජනාවෙන් අදහස් කරන්නේ.දැනටමත් රාජන ආයතනය ඩිජිටල් කරණයට ලක් කරලා තියෙන්නේ.එහිදී මේ ළඟදීත් අපේ ප්‍රාදේශය සභාවේ web side එක නැවත නිර්මාණයක් කරලා තියෙනවා.මම දැක්කා. ඒ වගේම අපිට පුළුවන් මේක ඩිජිටල් කරණයට සමගාමීව මේ දූරකථන යෙදවුම් අපේ

Smart Phone එකට එන App එකක් නිර්මාණය කරලා. ඒකෙදි අපට පුළුවන් අපේ කුණු ට්‍රැක්ටරය මොන ස්ථානයේද දැන් තියෙන්නේ. ඒ වගේ දේවල් විශේෂයෙන් අපට අවශ්‍ය ඕනෑම දෙයක් මේ සභාව හරහා කර ගන්න පුළුවන්. ඒ වගේම අද රාජකාරියේ සිටින නිළධාරීන් කවුද? යන්න පිළිබඳවත් දැනගන්න පුළුවන් විදිහට දුරකථන යෙදවුම් ස්ථාපනය කරමින් කරන්න පුළුවන්.ඒ සඳහා අපිට විශේෂයෙන්ම අවශ්‍ය කරන තාක්ෂණික සහයෝගය ලබාදීමට මේ ප්‍රදේශයේ තරුණ මහත්මයෙක් අපිට මේ යෝජනා කරලා තියෙනවා. එතුමාගේ සහයෝගය ලබා දෙනවා කියලා.අවශ්‍ය වන මූලික පිරිවැයක් තිබෙනවා.ඒ පිරිවැය සභාව සපයන්නට පුළුවන් නම් එතුමා කාර්ය සාර්ථක කරලා දෙයි කියලා මං විශ්වාස කරනවා. ඒ සඳහා ඔබතුමාගේ අවධානය යොමු වෙයි කියලා සිතන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපේ web side එක ක්‍රියාත්මක වෙනවා.ඔබතුමාගේ කියන සමහර කාරණා website එකට ඇතුල් වෙලා තියෙන්නේ. දැන් දත්ත ටිකක් ලබාදීමට නිරීක්ෂණය කරලා තියෙන්නේ.ඒ සඳහා සම්පත් දායකයෙක් සිටින කතාවක් කීවා. එම නිසා මෙය කරමු.එය හොඳ බවත් ගරු සභාපතිතුමා පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

iii. රඹුක්කන ආසනයේ කොට්ඨාශ 21 නියෝජනය වන පරදි ක්‍රීඩා සැණකෙළියක් පැවැත්වීම සුදුසු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ඒ.ඒ.තරංග නුවන් ප්‍රසන්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මේ කොට්ඨාශ 21 කම නියෝජනය කරලා ක්‍රීඩා සැණකෙළියක් පවත්වනවා කියන එක ටිකක් නුපුරුදු අත්දැකීමක් වෙයි අපට මොකද ක්‍රීඩා තරගයක් පවත්වනවා කියන කාරණාවට එහා ගිහින් ක්‍රීඩා සැණකෙළියක් පවත්වනවා කියන එක තමා මගේ යෝජනාව වෙන්නේ.මොකද අපේ පළාතේ පළාත් පාලන සතිය නිමිති කර ගනිමින් මේ වන විට යෝජනා කරලා තිබෙනවා.ක්‍රීඩා තරඟ මේ ආයතන සම්බන්ධ කරගෙන.නමුත් මේකෙදි අපට පුළුවන් අපේ ආයතනය විදිහට කොට්ඨාශ 21 ක තුළට මේ ක්‍රීඩාව ගෙනියන්න.ඒකට ක්‍රිඩාවක් කියලා අපට වොලි බොල්, ක්‍රිකට් ඊට අමතරව නෙට් බොල් ඒ වගේ ක්‍රීඩා ඉසව් කිහිපයක් ඒකට අපි සම්බන්ධ කරන්න ඕන.විශේෂයෙන්ම මෙම ප්‍රදේශයේ සිටින තරුණ තරුණියන් මේ වන විට ක්‍රීඩාවෙන් ඈත් වෙලා විවිධ බාහිර ක්‍රියාකාරකම් වලට නැඹුරු වෙලා තිබෙනවා. ඒ අනුව මත්ද්‍රව්‍ය වලට ඇබ්බැහි වෙලා තිබෙනවා. ඒ ගැනත් විශේෂයෙන්ම අපි අවධානය යොමු කරමු. ඒකට විශේෂ හේතුවක් වෙලා තියෙන්නේ ක්‍රීඩාව වැනි බාහිර දේවල් වලින් ඈත්වීම.විශේෂයෙන්ම අපිට තිබෙන ක්‍රීඩාංගන නවීකරණය කරලා ඒ සඳහා අවස්ථා සලසා ගන්න පුළුවන්. මේ ක්‍රීඩා තරඟ කොට්ඨාශ 21 කට සමගාමීව පවත්වන අවසාන මහා තරඟය අපිට සැණකෙළියක් ආකාරයෙන් පවත්වන්න පුළුවන්.අපේ ක්‍රීඩාගාර වන රඹුක්කන නගරයට ආසන්න තිබෙන මහීපාල ක්‍රීඩාංගනය හා බෝධිය ක්‍රීඩාංගනය හරහා අපට සභාවේ ලොකු මැදිහත් වීමක් සපයන්න පුළුවන්. ඒ වගේම ප්‍රදේශයේ සිටින ක්‍රීඩා කරන තරුණ තරුණියන් සඳහා මහත් අස්වැසිලක් වෙයි මේ සඳහා සහභාගී වීමෙන් බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

මේක වැදගත් යෝජනාවක් මන්ත්‍රීතුමා ඉදිරිපත් කළේ. අද වැඩි හරියක් බැලුවාම වැඩිය ක්‍රීඩාවෙන් ඉවත් වී සිටිනවා.අනාගත දරුවන් ක්‍රීඩාව තුළින් ඉදිරියට ගෙනියන්න පුළුවන්.එයින් හික්මීම,ඉවසීම ආදිය ගෙනියන්න පුළුවන්. එතකොට එතුමා පැවසුවා වගේ කොට්ඨාස 21 තිබෙනවා. එම 21 අය ක්‍රීඩාගාර වලට ගෙනැල්ලා ඒ අයගේ තිබෙන දක්ෂතා දියුණු කර ගැනිමට පුළුවන්. මෙතුමාගේ යෝජනාව අනුව මේ කටයුත්ත කරන්න. සභාවට යම්කිසි මුදලක් යොදවන්න වෙයි. ක්‍රීඩාව මහජනතාවගේ සේවාවක් වන අතර ශරීර සුවතා වලට වියදම් කිරීමට හැකියාව තිබෙනවා.ඒ නිසා කොට්ඨාශ 21 ක සම්බන්ධ කරගෙන කටයුතු කරමු. කියලා ඒ

යෝජනාවට මම සුබ පතන බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

සමීර මන්ත්‍රීතුමා හොඳ යෝජනාවක් ගෙවිත් තියෙන්නේ.විශේෂයෙන් සමීර මන්ත්‍රීතුමා, අපි මේ වන විට කොට්ඨාස 21 තුළ ක්‍රීඩාව ආරම්භ කිරීමට පටන් අරගෙන තිබෙන්නේ.දුම්රිය ස්ථානය පිරිසිදු කරන විට කොට්ඨාශ 21 ට බෙදලා ඒක අවසන් අවස්ථාවේදී විසි එකටම වොලිබෝල් එකකුයි.නෙට් එකකුයි දුන්නා. මේ වන විට කොට්ඨාස විසි එකටම වොලි බෝලයකුයි, නෙට් එකකුයි තිබෙනවා. ඔබතුමා මේකට දායක වන්න විශේෂයෙන් වොලිබෝල් ක්‍රීඩාව නංවන්න පුළුවන්. අපි සහයෝගය ලබා දෙන ලෙසට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

මෙතුමා මේ යෝජනාව ගැන කතා කරපු එක ගැන ස්තුතියි.විශේෂයෙන්ම මම මෙතනදි අවස්ථාවක් කර ගත්තේ වොලිබෝල් ක්‍රීඩාව කියලා එක ක්‍රිඩාවක් නොවේ.ප්‍රදේශයේ අපට ක්‍රියාත්මක කරන්න පුළුවන් ක්‍රීඩා ඉසව් රාශියක් සම්බන්ධ කරගෙන යන්නට පුළුවන්. දැනට මෙතුමා අදහස් කළ ආකාරයට ඔබ තමුන්නාන්සේලා කොට්ඨාශ විසි එකම ක්‍රීඩාව නැඹුරු කරන්න විවිධ අවස්ථාවලදී කටයුතු කරලා තිබෙනවා. කියලා සඳහන් කළා.එතකොට අපිට තවත් ක්‍රිකට් ඒ වගේම එල්ලේ වැනි අලුත් ක්‍රීඩා මේ ප්‍රදේශවලට හඳුන්වා දීම හා ක්‍රීඩා ඉසව් හඳුන්වා දීලා ප්‍රදේශයේ තරුණ තරුණියන් මේ සඳහා සහභාගී කරගන්න පුළුවන්. දැනටමත් මේ වැඩේ ක්‍රියාත්මක වෙලා තිබෙනවා නම් අපිට මේ වැඩේ තවත් ලේසි බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙය වෙන්න ඕන වැඩේ වෙනවා. අපි වැඩක් කරමු. ඉදිරියට සංවිධානය වෙන්න ලේසියි. දැන් සභාවේ ප්‍රතිපාදන කමිටුව මේකට අයිති වෙන්නේ. අපි ඒ කමිටුවට මේක භාර දෙමු. මේකට අවශ්‍ය සැලැස්ම හදලා ක්‍රියාත්මක කිරීමට යනුවෙන් ගරු සභාපතිතුම පවසන ලදි.

iv. ගිරිගමුව ප්‍රජා ජල ව්‍යාපෘතිය අවසන් අදියර අවසන් කිරිම සුදුසු බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

සභාපතිතුමනි,ගිරිගමුව ප්‍රජා ජල ව්‍යාපෘතිය අවසන් අදියරයේ තමා පසුවෙන්නේ මොකද?පසුගිය ආණ්ඩු සමයේදීත් මේ සඳහා ප්‍රතිපාදන වෙන් කර වතුර ටැංකි පවා සලසා දුන්නා. දැනට මේකට ආසන්නයටම විදුලිය ඇවිත් තිබෙන්නේ. විශේෂයෙන් මේකට මූලික වශයෙන් වුවමනා කරන්නේ මෝටරයක්ය.මං හිතනවා වැඩිදුරට මේ ගැන අපේ මන්ත්‍රීතුමිය දැනුවත්ව ඇති කියලා.මම ඒ ගැන එතුමියගෙන් අසන්නේ නැත.නමුත් මේක ක්‍රියාත්මක කරොත් ඒ ප්‍රදේශයේ සිටින ජනතාවට ලොකු අස්වැසිල්ලක් වෙනවා.මොකද අපේ සභාවේ වැඩ කරන මහත්ම මහත්මීනුත් කිහිප දෙනෙක් ඉන්නවා මේ ගැටලුවට විශාල වශයෙන් මුහුණ දෙන. ඒ නිසා මේ ව්‍යාපෘතිය කඩනමින් කිරීමට පියවරක් ගන්න පුළුවන් නම් අපිට මේක ජනසතු කරන්නට ලොකු අවස්ථාවක් වෙනවා. කාලයක් තිස්සේ යන වැඩක් නිසා බව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා**

මම ස්තුතිවන්ත වෙනවා සමීර මන්ත්‍රීතුමා යෝජනා කළ එක ගැන මේක අපේ ප්‍රාදේශීය සභා ඡන්ද කැන්පේන් එකේදී ජාතික ජන බලවේගයයි, අපේ සමගි ජන බලවේගයි ප්‍රධාන ඡන්ද පොරොන්දුවක් වුණේ ඔය ගිරිගමුව ජල ව්‍යාපෘතිය.ඔයගොල්ලෝ ගිහින් ජලය ලබා දෙනවා කිව්ත් මෙතුමා තමා ඒක යෝජනා කළේ. මෙතුමාට මම ස්තුති වන්ත වෙනවා.ගරු සභාපතිතුමනි,මේ ප්‍රදේශයේ ඔබතුමා ගියා නම් අද නිරීක්ෂණය කරන්න පුළුවන්. මම නම් එතැන ගියා.පවුල් තිස් දෙකක් පමණ නානවා නානවතුර ආපසු යනවා නැවත නානවා. ඒ තරම් දුෂ්කරයි ජලය නැත.ගිරිගමුවේ ජල ටැංකි දෙක මම තමා කියලා ස්ථාපිත කර දුන්නේ.මාගේ මුදල් වලින් නම් නොවේ.මම ගිහින් ටැංකු දෙක එතන ස්ථාපිත කරලා දුන්නා පමණයි. ඊට පස්සේ බට Line එකකුත් භාගයක් පමණ සකස් කර තියෙන්නේ. මෙයට ප්‍රමුඛතාවය ලබා දී පුළුවන් සභාව මගින් හරි කොහොම හරි

ජල ටැංකි සඳහා ජල බවුසරයක් ගිහින් දෙනවා නම් හොඳ බවත්.තව ටිකක් ඉඩෝරය ආවොත් ගිරිගමුව ප්‍රදේශයට ජල නැති වෙයි.මෙය කරනවා නම් හරිම කාලෝචිතයි කියලා හිතනවා. අපේ මන්ත්‍රීතුමාත් දන්නවා මන්ත්‍රීතුමියත් දන්නවා.ඔබතුමාලා වැඩ ගැන මීට වඩා හොයලා බලන්න ඕන කියලා මම ඉල්ලා සිටිනවා. ඒ මිනිස්සු එතරම් ජලයෙන් පීඩා විඳිනවා.ඒ වගේම ප්‍රධාන පොරොන්දුවක් වෙලා තිබුනේ ජලය ලබා දෙනවා කියලා තමයි.ඒ නිසා ඒ ගැන විශේෂ අවධානයක් යොමු කරන්න කියන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී වී.ආර්.නන්දික බණ්ඩාරනායක මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

බොහොම ස්තුතියි.අපි කරමු. මේ ජල ප්‍රශ්නය විසඳුමක් ලබා ගනිමු. යනුවෙන් ගරු සභාපතිතුමා පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

**(ඊ).06.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩබ්.ජී.කේ.වත්තේගෙදර මැතිතුමිය**

i. බැකෝ යන්ත්‍රයක් යොදා සනිමේවත්ත ගමේ කාණු පද්ධතිය සකස් කිරිම සුදුසු බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩබ්.ජී.කේ.වත්තේගෙදර මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩබ්.ජී.කේ.වත්තේගෙදර මැතිතුමිය**

මගේ යෝජනාව සංශෝධන සහිතව මම ඒක නැවත ඉදිරිපත් කරනවා. බැකෝ යන්ත්‍රය යොදා සනිමේවවත්ත ගමේ සීමා ලකුණු කර කාණු පද්ධතිය සකසා දෙන ලෙසට,මොකද? කරුණු ගොඩාක් තිබෙනවා.මගේ ගම වෙන්දේසි ගමක්ය.සුළු මායිම් තිබෙන්නේ. නමුත් කොන්ක්‍රීට් දමා මාර්ගය සකසා තිබෙනවා. අඩි 10ට අඩි 12 ට නමුත් පුළුල් මාර්ගය අඩි 18ත් අඩි 20 ත් ප්‍රමාණයට තියෙනවා. ගම්වාසීන් අඩි 10ට අඩි 12 ට ගැටගහගෙන තාප්ප බැඳගෙන තිබෙනවා.ඒ නිසා ඔබතුමාගේ විශේෂ අවධානය යොමුකර ඒ මාර්ග සකසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටින බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ඩබ්.ජී.කේ.වත්තේගෙදර මැතිතුමිය විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපි ක්ෂේත්‍ර පරීක්ෂණයක් කරලා තොරතුරු සොයා බලා ක්‍රියාත්මක කරමු. යනුවෙන් ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

**(ඊ).07.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

i. මාරුක්වතුර ගෝමාහය පන්සල මාර්යේ වම්පස මාර්ගය සංවර්ධනය (මාර්ගය කපා සංවර්ධනය කිරිම) කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී එච්.ආර්.ප්‍රදීපා රංජනි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

මේ මාර්ගය ගෙවල් පහ,හයක් තිබෙනවා.ගමන් කිරිමට අපහසු මාර්ගයකි.ඒ කියන්නේ පයින්වත් ගමන් කිරිම නොහැකිය. අබලන් වී ගල් මතු වී ඇත.මේ ළඟදි මළ ගෙදරක් තිබුණා.මිනිස්සු දේහය රැගෙන යාමට අපහසු වුණා.වාහනයකින් ගෙනියන්නේ නැතුව මීටර් 200 ක් 300 ක් ඇවිදගෙන හිස මත තියාගෙන ගියේ.එම නිසා

මාර්ගය සංවර්ධන කර දෙනවා නම් හොඳ බවත්,බැකෝ එකක් දාලා පාර කපලා හරි දෙනවා නම් ඒත් ඇති ඒ අයට බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

අපේ බැකෝ එක මේ දවස්වල කැඩිලා තිබෙන නිසා අපි මොකක් හරි කරන්න බලන බව ගරු සභාපතිතුමා පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

ii. නාරම්බැද්ද සිට ගජබාපුර,මාරුක්වතුර,සූරියපුර දක්වා පානීය ජලය ලබාදීම සඳහා කාණු (ජලනල එලීමට)සකස් කර දිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ජී.ආර්.කිත්සිරි සුමනරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

මට ඉල්ලීම් කර තිබෙනවා. ජනතාව විසින් හිරිවඩුන්නේ සිට ඉඹුල්ගස්දෙණිය මාර්ගය ඇතුළත නාරම්බැන්ද කොටස එනකම් ජලනළ එලා තිබෙනවා. අනෙක් පැත්තෙන් සූරියපුරට එනකම් ජලනළ ඇවිත් තිබෙනවා.ඉඹුල්ගස්දෙණිය පැත්තේ මේ මැද කොටසේ ඒ ජනතාව ගොඩක් අපහසුතාවෙන් මේ දවස්වල වතුර නැතුව,මා ඔය ළඟ තිබුණත් ඒ මිනිස්සුන්ට වතුර නැත.ඒක තමා සිද්ධිය ඒ හින්දා ඒ ජනතාවට සහනයක් ලෙස ඒ ජල නළ එළා ගැනිමට කාණු පද්ධතිය සකස් කර දෙන්න කටයුතු කරනවා නම් ඒක ලොකු සහයෝගයක් බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

ඒක ප්‍රදේශයේ ජනතාවගේ ඉල්ලීමකට කරලා දීල තිබෙනවා. අදහස් දැක්වීමේදී සඳහන් වුණේ නැත. ඒක අපි සභාව මගින් සිදුකර දෙනවාද? එහෙමත් නැත්නම් සභාවට අයිති මාර්ගයක් පළුදු කිරීමේදී සභාවට අයිති මුදල නිදහස් කරනවද? කියන එක ගරු මන්ත්‍රීතුමිය ප්‍රකාශ කළේ නැත. කොහොමද කරන්නේ කියන එක කියන්න. පළුදු කරනවා නම් අපි සභාවෙන් මුදලක් අය කරන නිසා ඒක නිදහස් කරලා බැකෝ යන්ත්‍රය යොදා කාණු සකස් කර දෙන්න කියන ඉල්ලීම ද සභාවට තීරණයක් ගන්න ඕන. එතුමියගේ අදහස්වලින් ආවේ නැති බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

යෝජනාවට අනුව කාණුවක් කපන එක ලේසි වැඩක්. අපට තියෙන්නේ කාණු පද්ධතිය කපන එක විතරයි. බට තිබෙන නිසා අපි සභාවේ අරමුදල් යොදවා ඩෝසරයක් කුලියට දමා මේ කාණුව කපලා දෙනවා නම් හොඳ බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මොකද කියන්නේ? මේ මේක සම්මත වුණෝත් අපි ගන්නාවූ ක්‍රියාමාර්ගය තුළ මේක නොකර ඉන්න පුළුවන්. මේක කරන ක්‍රමවේදයක් තිබෙනවා. ඉල්ලීම් ටික මට දෙන්න.මොකද? සභාවට ලිඛිතව ඉල්ලීම් තිබුනොත් වටිනවා. ඒක කරලා දෙන්න බවට ගරු සභාපතිතුමා පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

iii. නාරම්බැද්ද පාසල මාර්ගයේ(බංඩාර මහතාගේ නිවස අසල)ඉතිරි කොටස සංවර්ධනය කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී එච්.ආර්.ප්‍රදීපා රංජනි මැතිතුමිය විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය**

නාරන්බැද්ද පන්සල අසල තිබෙන මාර්ගය ඒක කොන්ක්‍රීට් කරලා තිබෙනවා. ගල් පොත්ත හරියට කොන්ක්‍රීට් කරලා දෙන්න කියලා ඒ අය ඉල්ලා තිබෙනවා.එහි නිවාස දහයක් දොළහක් තිබෙනවා. ඒ ඉතිරි කොටස සංවර්ධනය කිරිම හරි ගල්පොත්ත හරිය ටික හරි කොන්ක්‍රීට් දාලා දෙන්න කියන බව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනී ජී.ඩී.නිරංජලා ජිනදාස මැතිතුමිය විසින් පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඒ යෝජනාව කාර්මික කමිටුවට ඉදිරිපත් කරලා වාර්තාවක් දෙන්නේ කියන බව ප්‍රකාශ කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය

**(ඊ).08.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා**

i. මිරිහාගොඩ අබේරත්න මහතාගේ වෙළඳසැල අසලින් වල්ආර ඔය සඳහා ඉදිකර ඇති පාලම ඉතාමත් පටු බැවින් පුළුල් කර ආරක්ෂිත ඇදිවැටක් සවි කර පාලම දෙපසින් ඔයට පැති බැම්මක් ඉදි කිරිම සුදුසු බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව එන්.ඒ.සුසාන්ත විමලරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා**

මෙම මාර්ගය විශේෂයෙන් රඹුක්කන සිට සියඹලන්ගමුව දක්වා ප්‍රවාහන සේවයක් තිබෙනවා.ඒ වගේම හේවාදිවෙල ප්‍රදේශයට මෙම මාර්ගයෙන් යනවා. මෙය අඩි 10ක පළලකින් සකස් කර තිබෙනවා. ආරක්ෂිත වැටක් ඉදිකර නැත. ගරු සමීර මන්ත්‍රීතුමාගේ කාලයේ පැති බැම්මක් ඉදිකරලා තිබෙනවා. ඒ වගේ අඩි හතරක් පමණ උසට පාලම උඩින් වතුර යනවා. ඉවුරු ඛාදනය වී ඇත. ඉදිරියේදී එන වර්ෂා කාලය නිසා අවධානම් බැවින් මෙම පැති බැම් ඉදිකර දෙන මෙන් ඉල්ලා සිටින අතර යෝජනාවේ පැති බැම්මක් ලෙස සඳහන් වී ඇත. එය පැති බැම් ලෙසට නිවැරදි විය යුතුයි. මෙම මාර්ගයේ පාලමට ආරක්ෂිත වැටවල් යොදා ඔයේ පැති බැම්ම සකස් කර දිමට යෝජනා කරනවා.මෙම මාර්ගය සමහර අවස්ථාවලදී දකිනවා බස්, ටිපර් ගමන් කරනවා පාලමේ මතු වී තිබෙන කම්බිය උඩින් යන අවස්ථා තිබෙනවා. අනිවාර්යෙන් අනතුරක් සිද්ධ වෙනවා. ඒ නිසා මේකට ප්‍රමුඛතාවය ලබා දෙන ලෙසත්, ප්‍රදේශවාසීන් සියලු දෙනා ගමන් ගන්නා මාර්ගය නිසා අනතුරු තත්ත්වයෙන් ඉවත් කර දෙන ලෙස ඉල්ලා සිටින බවට ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එම්.ගාමිණී සමරකෝන් මැතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

ගාමිණී සමරකෝන් මැතිතුමාට ස්තුතිවන්ත වෙනවා.මේ අවස්ථාවේදී පසුගිය කාල සීමාව තුළ සිදු කරපු පැති බැම්ම ඉදිකිරීම් පිළිබඳව මතක් කිරීම සම්බන්ධයෙන් මොකද මෙතුමා සඳහන් කළත් පසුගිය කාලයේ සමහර අවස්ථාවල දේශපාලන මැදි වීමක් මත පැවැති රැස්වීම් වලදී පවා මේ බව සඳහන් කරලා තිබුණා.සමීර ඒකේ කොන්ක්‍රීට් එක අරගෙන කරනවා කියලා. නමුත් ඒක නියමිත ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුකූලව කරපු වැඩක් මොකද ඒක කාගේ නමකටවත් කරන්න නොහැකි බව කියලා ඔබතුමා දන්නවා.මේ ගරු සභාවේ සියලු මන්ත්‍රීවරුත් දන්නවා.පැතිබැම්ම ඉදිකරේ මෙතුමාගේ සහෝදරයෙක්ට වැඩිහිටි සමිතිය මගින් මොකද ප්‍රජා මූල තත්ත්වයක් නිසා සමිති වලින් තමා වැඩසටහන ක්‍රියාත්මක කරන්න පුළුවන්.විශේෂයෙන්ම මම මේ අවස්ථාවේදී මෙතුමාට ස්තුති කිරීම කරනවා. එයට මගේ නම සඳහන් කිරීම ගැන.පසුගිය වර්ෂාකාලයේදී මේ පාලම උඩින් අඩි හතර පමණ වතුර ගිය අවස්ථා තිබෙනවා.මෙහිදී අපි විශේෂයෙන් ගරු කනක හේරත් මැති තුමා ස්ථාන පරීක්ෂණයක් කර ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයට කතා කළා. මේකට පාලමක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කිරිමට මැනුම් කටයුතු සිදු කළා.අවාසනාවන්ත ලෙස අපට ඒක ක්‍රියාත්මක

කිරීමට අපොහොසත් වුණා. ඒ එක්ම ක්‍රියාත්මක කිරීමට උත්සාහ කළා පදවිගම්පොළ, ගොඩගම්පොළ මාර්ගයේ පාලම මිලියන 45ක් පමණ වියදමකින් ලොකු පාලමක් ඉදිකළා. ඒ වගේම පාලමක් තමා මේ ස්ථානයේ සකස් කිරීමට උත්සාහ කළේ.නමුත් තිබුණු කාලයේ හැටියට අපිට ඒක කරගන්න නොහැකි වුණා. විශේෂයෙන් මම මේකෙදි කියන්න ඕන අපි ප්‍රාදේශීය සභා හැටියට මේ මාර්ගයේ පාලම ඒ ඉදිකිරීමට මැදි මැදිහත් විමට ඇති හැකියාව කුමක් වුවත් ඔබතුමා මේකට මැදිහත්වීම ඒ අදාළ ආයතන සමඟ සම්බන්ධ වෙලා මේක ක්‍රියාත්මක කරන්න පුළුවන් නම් වටිනවා.මේ පාලම අබලන් තත්ත්වයේ පවතින්නේ. ඒ වගේම දැනට මේකේ වතුර ගලාගෙන යාමට අවහිරතාවයක් ඇති වෙලා තිබෙනවා. පාලමේ එක පැත්තක් පස් වලින් වැහිලා තිබෙන නිසා ඔබතුමා මැදිහත් වෙලා පාලමක් ඉදිකිරීමට කටයුත් කරන ලෙසත්,පළාත් සභා හරහා පාලම ඉදිකිරීමට පසුගිය කාලය ක්‍රියාත්මක වුණා.මේ කාලයේ කොහොම වෙනවද කියලා දන්නේ නැත. ඒ සඳහා අවධානය යොමු කළ කරන ලෙස ඉල්ලා සිටින බවට පවසන ලදි.

- ❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මෙය ප්‍රාදේශීය සභා පාරක්ද යනුවෙන් පවසන ලදි.

- ❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

පළාත් මාර්ග පාරක් බව සඳහන් කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

**(ඊ).09.ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

i. ප්‍රාදේශීය සභාව ඉදිරිපිට ඇති පොකුණු දෙක වසා බැංකු දෙක සඳහා රථගාලක් ඉදිකිරිමට යෝජනා කරමි.

- ❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා**

මේ ප්‍රාදේශීය සභාව ඉදිරිපිට වාහන නතර කිරීම දිගින් දිගට වැඩිවෙලා තිබෙනවා.බැංකුවලට එන වාහන පිටතින් දමා ඇත. අපේ සභාවට එන වාහනත් දමලා තිබෙනවා. ඒ නිසා පොකුණු දෙක අපි ගියවතාවෙත් ශුද්ධ කළා මේකෙන් ප්‍රයෝජනයක් නැති නිසා පොකුණු දෙක කඩා ඉවත් කරන්නේ නැතුව,ඒකට ගල් කුඩු දමා හරි සුදුසු ද්‍රව්‍යයක් යොදා පුරවා දැම්ම සිදු කළ යුතුය. වැඩි වියදමක් යන එකක් නැත.ඉදිරියේදී හරි ඒක ගලවලා වාහන දෙපැත්තේ නතර කරන්න සකස් කර ගැනිමට හැකියාව තිබෙනවා. ඔබතුමාගේ වාහනය ද එළියට ගැනීමට නොහැකිව වාහන දැම්ම සිදු කරනවා.ඒ නිසා පොකුණු දෙකට ගල් කුඩු දමා රථගාලක් සකස් කිරිමෙන් දැනට තිබෙන වාහන තදබදය අඩු කරගැනීමටත් පුළුවන්ය. ඒ වගේම පසුව අමානෝ සීට් දාමා කැනපියක් සකස් කර ආරක්ෂිත රථ ගාලක් හැදුවොත් ඉදිරිපිටි ලස්සනකුත් තිබෙනවා. ප්‍රාදේශීය සභාවේ ඉදිරිපස වාහන තද බදයට විකල්පයක් වෙයි කියලා මම සිතනවා. ඒ වගේම දැනට සභාවේ තාප්පය තියෙන පැත්තෙන් ඇතුලට වාහන යවන්න නොහැකිය.පෞද්ගලික වාහන හා සභාවේ වාහන පිටුපස තිබෙන නිසා.අපේ සභාවේ සමහර විට වාහන ගැනිමට නොහැකිව හිර වෙන අවස්ථා තිබෙනවා.සභාවට සේවාව සපයා ගැනීමට එන මහජනතාවට සභාව ඉදිරිපිට රථවාහන නතර කිරිමට දීම සුදුසු යැයි මම යෝජනා කරනවා.

- ❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

මෙතුමා ගෙනා යෝජනාව ගැන ඒක තිබෙන අලංකාරය නැති වෙනවා.ඒක වහලා තව එකකට යනවාට වඩා හොඳයි මං හිතන විදියට ඔබතුමාගේ වාහන ගැසිමට අයිතියක් තිබෙනවා.යුතුකමක් තිබෙනවා. සේවාවක් ලබා ගැනීමට ජනතාව බැංකු දෙකට හා සභාවට එනවා.අපි ඒ අය ගේට්ටුවෙන් නොගෙන පොල භූමියට යොමු කිරිම හොඳයි කියලා මම සිතනවා. සභාවට හා බැංකු ළඟට කෙලින්ම එන එක ප්‍රායෝගික නැත. ගොඩනැගිල්ලේ තිබෙන අලංකාරයට හානියක් ද වෙනවා. සභාවේ සේවකයින්ගේ වාහන ,බැංකු දෙකට අයත් වාහන ,මහජන නියෝජිතයින් වන අපගේ වාහන එනවා තදබදයක් තිබෙනවා.ඒ නිසා අපි මීටර් 50 ක් පමණ තිබෙන නිසා පොළ භූමිය යොදා ගැනිම සුදුසු බවට පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.එම්.ටී.බී.තෙන්නකෝන් මැතිතුමා**

එම පොකුණු දෙක පැවතිමෙන් බැංකු දෙකට පොඩි ආරක්ෂාවක් තිබෙනවා. බැංකු වුණාම අපි ආරක්ෂාව සපයන්න ඕන.එතකොට පිටස්තර අයගේ වාහන ගැනීමට ඉඩ දුන්නොත් ඒක බැංකුවලට තර්ජනයක් වෙනවා. ඒ නිසා එතැන වාහන නතර කිරිම සිදු නොකරමු. පිටස්තර වාහන ඇතුලට ගැනීමට හොඳ නැත. බැංකු නිලධාරීන්ට අවස්ථාව ලබා දෙන්න වෙනවා. ගණුදෙනුකාරයින්ගේ වාහන දැමීම ආරක්ෂාවට තර්ජනයක් වන නිසා එය සිදු නොකර බැංකු දෙකේ ඉල්ලීම් තිබෙනවා නම් ඒ අයට වාහන දැමීමට ඕන කියලා ඒ ගැන අපි සලකලා බලමු යැයි පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

බැංකු දෙක අපි බදු දීලා තිබෙන්නේ. ඒ නිසා බැංකු දෙකේ කාර්ය මණ්ඩලයට වාහන දැමීමට තැනක් ලබා දීම අපේ යුතුකමකි. ප්‍රාදේශීය සභාවට රථගාලක් අවශ්‍යයි.එහෙත් එය ලබා දී නොමැත. ප්‍රජා ශාලාව බැලුවත් රථගාලක් නැත. ඒකට රථගාලක් ලබා දි තිබෙන්නේ පොළ භූමියේය. තාවකාලික හරි පුරවලා බැංකු දෙකට සුදුසු ආකාරයට වාහන දමන්න තැනක් දෙන්න ඕන. අපේ වාහනත් නතර කිරිමෙන් පසු කතා කරලා වාහන එහාට මෙහාට කරන්න ඕන. ඊට පස්සේ පාරිභෝගිකයන්ගේ වාහන ඇවිත් ගහනවා.ඒක නිසා අපිට මේක නියාමනය කරගන්න බැරි වෙනවා. ප්‍රාදේශීය සභාවේ වාහන ගහන තැන තමයි එයාලා වාහන නතර කරන්නේ.මම හිතෙනවා මෙයට තාවකාලික උත්තරයක් දිම සුදුසු බව ,ඒ නිසා මෙතුමාගේ යෝජනාව සලකා බලමු.නගර සැලැස්ම ආපුවහම වාහන නවත්වන්න පහසුකම් අපට දෙන්න වෙනවා. මගේ පොඩි කැමැත්තක් තිබෙනවා.ඒ ඊළඟට තමා ඔය දෙක නඩත්තු කරන්න නොහැකිය. හැමදාම ළමයි යොදාගෙන ජලය ඉසිම සිදු කරනවා.අවලස්සනකුත් තිබෙනවා.NSB බැංකුවෙනුත් පැවසුවා පොකුණු දෙකට මොකක් හරි කරන්න කියලා. ඔබතුමාලා කැමැත්ත ලබා දෙන ලෙස පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එස්.කුමාර රාමනායක මැතිතුමා**

උපාලි රෝහණ මහතාගේ යෝජනාවට මමත් කතා කරන්න කැමතියි. පිළිවෙළක් තිබෙන්න ඕන. මෙතන රථගාල සකස් කිරිම ආණ්ඩු පක්ෂය කියලා විරෝධය එල්ල කිරිමට නොහැකිය.යෝජනාව තීන්දු වෙන්නේ නැතුව සාධනීය පැත්ත ගැන කතා කරන්න නොහැකි බව පවසන ලදි. අපිත් අපහසුතාවයට පත් වෙනවා රථ ගාලාක් නොමැති විම නිසා මේ සඳහා ආරක්ෂාව බැලිය නොහැකිය. ඒ නිසා මම මේ යෝජනා කරන්නේ රථගාලක් සකස් කිරිම සුදුසු බව පවසන ලදි.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

තෙන්නකෝන් මන්ත්‍රීතුමා පැවසුවා වාහන නතර කිරීමේදී ආරක්ෂා පිළිබඳ ගැටලුව එන බව,ඒ නිසා ආරක්ෂාව ලබාදීම වෙනම කාරණයක් මේකේ තියෙන කාරණාව මේක නඩත්තු කරන්න නොහැකි වීම. මේක ඔබතුමා යෝජනා කරන්නේ ගල්කුඩු දමා වසා දැමීමටය.තාවකාලික වසා දැමුවොත් මෙතන තිබෙන ප්‍රශ්නවලට විසඳුම් ලැබෙනවා. අනුර මන්ත්‍රීතුමා සඳහන් කළා වගේ රථගාල පොළට ගියොත් තේරුමක් නැත.මෙතන පාරේ නතර කරයි. එතකොට ගොඩක් ගැටලු මතු වෙනවා. අපි කලින් සභාවේ යෝජනා කරා නාගරික සංවර්ධන අධිකාරය සමඟ එකතු වෙලා මේක ක්‍රමවත් කිරිමට. අපි සභාවක් විදිහට ඒකමතික තීරණයක් ගනිමු. මෙතන තිබෙන ටැංකි දෙක කවුරු හරි හිතයි ලස්සනයි කියලා. ඒ දවස්වල ලස්සනට තිබෙන්න ඇති නමුත් දැන් ලස්සන නැත.මේකේ සැලැස්මේ ගැටළුවක් තිබෙනවා. මේ ගොඩනැඟිල්ල නිර්මාණය කිරිමේදී සැලසුම් වල ගැටලු තිබෙනවා. කලින් හදපු පොකුණු දෙකක් තියාගෙන දුක් විඳින්නේ නැතිව තාවකාලික වසා දමලා ඒකට රථගාලක් සකස් කර ගනිමු යැයි පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කේ.ධර්මසේන මැතිතුමා**

අපේ උපසභාපතිතුමා කරපු ප්‍රකාශයට අදහස් ප්‍රකාශ කරන්න කැමති.විශේෂයෙන්ම මේකේ සැලැස්මේ ගැටලුවක් තිබෙනවාලු.එතුමා සැලසුම් නිර්මාණ ශිල්පියෙක්. මම හිතන විදියට එතුමාට ඒ ගැන අවබෝධයක් තිබෙන්න පුළුවන්.මම පිළිගන්නවා. අපට මේ පිළිබඳව අවබෝධයක් නැත.නමුත් මම හිතන්නේ රජයේ ආයතනයක් මේ වගේ තැනක ඉදිකරද්දී ඒකට නිසි ක්‍රමවේදයක් පාවිච්චි කරන්න ඇති.මේකේ සැලසුම් ප්‍රශ්නයක් තිබෙනවා කියන එක හිතන්න වෙනවා. රාජ්‍ය ආයතනයක ඉංජිනේරුවන් මැදිහත් වෙලා කරන්නේ. ඒ වගේම සැලසුම් දෝෂයක් කියලා පිළිගන්න පුළුවන්ද? කියන එක මට ගැටලුවක්,ඒ එක්කම මේ කාලේ ලස්සනට තියෙන්න ඇතිලු. දැන් ලස්සන නැතිලු ලස්සන නැතිනම් ලස්සන කරගන්න ඕන. මෙතුමා ගෙනා යෝජනාවට විරුද්ධව කතා කරනවා නොවේ. මම පළමු සභා වාරයේදීත් අපි වැස්සේ ඇවිත් බයිසිකලේ දැම්මා සභාව ඉවර වෙලා යනකොට බයිසිකලේ එළියට දමා තිබුණා. හෙල්මට් එක සම්පූර්ණයෙන්ම තේමිලා කවුරු

කළාද දන්නේ නැති බව පවසන ලදි. මෙතුමා සඳහන් කළා රථගාලක් යනවා නම් හොඳයි කියලා. කලින් සභාවක් යෝජනාවක් ගෙනාවා. NSB බැංකුවේ ATM එකට යන මාර්ගය අවසානයේ බයිසිකල් දැම්මට පුළුවන් ආකාරයට ආවරණයක් සකසා එතන ලැස්ති කර ගනිමු. කියන කතාව, ඒ වගේ දෙයකට යන්න පුළුවන් නම් වටිනවා.මේකට සභාවේ සේවකයන්,බැංකු සේවකයන්,විවිධ අවස්ථාවල ප්‍රාදේශීය සභාවට මන්ත්‍රීතුමන්ලා එනවා.ඒ අයගේ වාහන නතර කිරිමට අවශ්‍යයි. විශේෂයෙන්ම මම කියන්නේ ගොඩනැගිල්ලේ ගැටලු තිබෙනවා නම් ඒකට පරීක්ෂණයක් පවත්වන්න පුළුවන්.බව පවසන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

ඉතිහාසය කලේ කොහොම කළා ද ?කියන එක දන්නේ නැත.ප්‍රජා ශාලාව හැදුවා රථගාලක් නැත.නාගරික සංවර්ධන අධිකාරියෙන් පවසනවා රථගාලක් අවශ්‍ය බව,මම දැන් සිද්ධ වෙනවා. පොළෙහි කොටසක් රථගාලක් සඳහා වෙන් කිරිමට. මිනින්දෝරුවෙක් දමලා මැනුම් කටයුතු කර පොළ භූමියේ පෙන්නන්න වෙනවා.සිව් මහල් ගොඩනැගිල්ලක් නිසා මේකට රථගාලක් තියෙන්න ඕන.රඹුක්කන ආසනයට රථගාල් සඳහා අනුමත කරන්නේ ප්‍රාදේශීය සභාව හැබැයි අපට රථගාලක් නැත. ඒ නිසා මෙතුමාගේ යෝජනාවට සාධනීය කරුණු දක්වන්න. මේ යෝජනාවට ඔබතුමාලාවේ අදහස් දක්වන්න වන ලෙස පවසන ලදි.

❖ ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.කේ.එම්.අනීස් මැතිතුමා

සභාපතිතුමා, අපිට දැනේනවා රථගාලක් නැති ප්‍රශ්නය.අපේ සභාවේ එහා පැත්තෙන් ආරක්ෂාකාරී ගොඩනැගිල්ලක් වගේ සකස් කර රථගාලක් ඉදි කර ගනිමු.අපිට තිබෙන ලොකු වස්තුවක් කුඩු පට්ටම් කරලා හදනවාට වඩා හොඳයි විකල්පයන් සොයන එක යනුවෙන් පවසන ලදි.

❖ ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා

මේක කුඩු පට්ටම් කරන්නේ නැත.මේකට ඒක මතික තීරණයක් ලබා දෙනවද?බෙදීමකට යනවද?බෙදීමකට යන බවට මන්ත්‍රීමන්ලා/තුමියන්ලා පවසන නිසා අපි බෙදීමකට යමු.එහෙනම් උපාලි මන්ත්‍රීතුමාගේ යෝජනාවට පක්ෂ,විපක්ෂ ඡන්දය ලබා දෙන ලෙස පවසන ලදි. ගරු සභාපතිතුමන් විසින් ඡන්දය ප්‍රථිපලය සභාවට ඉදිරිපත් කරන ලදි.

පක්ෂ ඡන්දය ප්‍රමාණය -19

විපක්ෂ ඡන්දය ප්‍රමාණය -15

ඡන්දය දීමෙන් වැළකිම -02

ඒ අනුව වැඩි ඡන්දය 19 ක් ලබා ගෙන යෝජනාව සම්මත වුණ බව ප්‍රකාශයට පත් කරන ලදි.

අදාළ යෝජනාව වැඩි ඡන්දයෙන් සභා සම්මත විය.

තීරණය -

පොකුණු දෙක වසා බැංකු දෙක සඳහා රථගාලක් ඉදිකිරිම තීරණය විය.

**ඊ).10.ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

i. ප්‍රාදේශීය සභා මාර්ගවල අනතුරුදායක ස්ථාන ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.එන්.එම්.සුක්රි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

උදාහරණ :- 1.හුරීමළුව මාර්ගයේ කුරෙම්පල හන්දියට හැරෙන හතරමං හන්දිය

2.අඩනැල්ල -මාර්ගයේ අනතුරුදායක වංගුවේ පිරී ඇති වැලි ඉවත් කිරිම.

❖ ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා

මේ යෝජනාව මම ගෙනාවේ.ලංකාවේ විශාල වශයෙන් මාර්ග අනතුරු සිදුවෙනවා.මේ පිළිබඳව ප්‍රවාහන අමාත්‍යාංශය එකතු වෙලා වැඩසටහන් සංවිධානය කිරිමට ආරම්භ කර තිබෙනවා. ඒ වැඩසටහන පළාත් පාලන ආයතනයන් නිසා අපට ද සම්බන්ධ වීමට තිබෙනවා. ඒ සඳහා අපේ ආයතනයේ කමිටුවක් ආරම්භ කර ඇත. මම මේ යෝජනාව ගෙනාවේ ප්‍රාදේශීය සභා පාරවල් ටික අබලන් වී තිබෙන නිසා, අබලන් මාර්ගය වලට වඩා හොඳ මාර්ග අනතුරුදායක වහලවල් තිබෙනවා.ඒක නිසා අනතුරු ඇති වීමට පුළුවන.පොලිසිය

සමඟ සාකච්ඡා කර විට ඒ අය පැවසුවෙත් අනතුරු ඇති වෙන්නේ වලවල් නිසා කියලා. මම දැනට සඳහන් කර තිබෙන උදාහරණ දෙක වන්නේ

1.හුරීමළුව මාර්ගයේ කුරෙම්පල හන්දියට හැරෙන හතරමං හන්දිය

2.අඩනැල්ල -මාර්ගයේ අනතුරුදායක වංගුවේ පීරී ඇති වැලි ඉවත් කිරිම.

මෙතන තිබෙනවා අපට අයිති නොවන පළාත් සභාවට අයිති මාර්ගක් ඒ මාර්ගය මේ මාසය ඇතුළත පිළිසකර කරනවා.හැබැයි එතැනින් දකුණු අත පැත්තට පරදෙණිය කියන මාර්ග කොටස අපේ සභාවට අයත්ය. එතකොට ඒගොල්ලෝ මේක හදලා අපි නොහැද සිටියොත් නැවත කැඩෙන්නට පුළුවන්ය.මගේ දෙවැනි උදාහරණය ඒ වගේම අඩනැල්ල මාර්ගය හදන්න ඕන. එතන පාරත් තිබෙනවා වංගු සහිතව එහි ද වලවල් ඇති බැවින් අනතුරුදායක විය හැකිය. ඒ සඳහා තමා මේ යෝජනාව සභාවට ඉදිරිපත් කලේ ප්‍රතිසංස්කරණය කර අනතුරු වළක්වා ගැනීමට බව පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

අබලන් මාර්ගවල අනතුරුදායක වලවල් ප්‍රතිසංස්කරණය කිරිම හොඳයි.මගේ ප්‍රදේශයෙත් තිබෙනවා. දිගට අනතුරුදායක සිදුවීම් සිදු තිබෙනවා.ඒ වගේම ඇන්තනි මාර්ගයට හැරෙන්න තැන තිබෙනවා. ඒ වගේම මීදුම පැත්තෙන් තිබෙනවා. පළාත් ඉන්ජිනේරු කාර්යාලයෙන් පැවසුවා එම තැන් හැදුව බවට, ඒ වගේම අනතුරුදායක තැන් ප්‍රතිසංස්කරණය කිරිම වඩා සුදුසු බවට පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ප්‍රාදේශීය සභාවක් විදිහට මේ කාරණය ගැන අවධානය යොමු කළ යුතුය. විශේෂයෙන් අධිවේගී මාර්ගවල ප්‍රතිසංස්කරණය කිරීම් දක්නට ලැබෙනවා. ප්‍රාදේශීය සභා මාර්ග ප්‍රතිසංස්කරණය කිරිමක් සිදු නොවන බව සඳහන් කරන ලදි.ඒ වගේම මෙවැනි තැන් අපේ මන්ත්‍රීතුමන්ලාගේ/තුමියන්ලාගේ ප්‍රදේශවල තිබෙනවා නම් සභාවට වාර්තා කරන්න. ඒවට පිළිතුරු ලබාදී අපි ක්‍රියා කරමු. ඒක තමා ජනාධිපතිතුමාගේ නියෝගය බව ගරු සභාපතිතමා පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

අදාළ යෝජනාව ක්‍රියාත්මක කිරිමට තීරණය විය.

**(ඊ)11.ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

1 සිට 5 දක්වා යෝජනා සභා අරමුදලින් ගෙවීම් කිරිමට සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

i. 2025.08.19 දින පවත්වන ලද සැලසුම් කමිටුව සඳහා සහභාගි වු සභාපතිතුමා,නිලධාරින් 6 දෙනෙක් හා කා.කා.ස සඳහා එක් නිලධාරියෙකුට රු2500.00 බැගින් ද කා.කා.ස. සඳහා රු500.00 ක මුදල් වශයෙන් මුළු මුදල වන රු18,000.00 ක දීමනාව ගෙවීම් කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

රු18,000.00 ක දීමනාව ගෙවීම් කිරිම අනුමත කිරිමට තීරණය විය.

ii. කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ගොඩගැසී ඇති කසල හල්පිටිය ගෝනාමඩිත්ත වත්තට බැහැර කිරීමේ පළමු අදියරය සඳහා එස්කැවේටර් යන්ත්‍රයක් යොදා ගැනීමේ ඉතිරි කුලී මුදල වන රු.52800.00 මුදල ගෙවීම් කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රු.52800.00 ක මුදල එස්කැවේටර් යන්ත්‍රයක් සඳහා ගෙවීම් කිරිමට අනුමත කිරිම තීරණය විය.

iii. කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ගොඩගැසී ඇති කසල හල්පිටිය ගෝනාමඩිත්ත වත්තට බැහැර කිරීමේ පළමු අදියරය සඳහා ටිපර් රථය යොදා ගැනීමේ ඉතිරි කුලී මුදල වන රු.69600.00 මුදල ගෙවීම් කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
රු.69600.00 ක මුදල ටිපර් රථය සඳහා ගෙවීම් කිරිමට අනුමත කිරිම තීරණය විය.

iv. යැපීම් දීමනාව හා ගමන් වියදම් වන රු.4074.00 ක මුදල ගෙවීම් කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1. එස්.එම්.ගාමිණී සමරකෝන් - රු.679.00
2. එච්.එස්.කේ.කුමාර - රු.679.00
3. පී.ජී.එස්.සමන් කුමාරි - රු.679.00
4. ජී.ජී.උපාලි රෝහණ - රු.679.00
5. එම්.ආර්.අයි.සමන් කුමාර - රු.679.00
6. වී.ආර්.ඊ.එන්.වීරබණ්ඩාර - රු.679.00

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -
අදාළ යැපීම් දීමනාව හා ගමන් වියදම් වන රු.4074.00 ක මුදල ගෙවීම් කිරිමට අනුමත කිරිම තීරණය විය.

v. පළාත් පාලන මාර්ග 2024 යටතේ ඉටු කළ වත්තේගම වෙලමැද මාර්ගය සංවර්ධනය කිරීමේ(LGR 2413704) 10% රඳවුම් මුදල වන රු.94820.94 ක මුදල සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම් කිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු.94820.94 ක මුදල සී/ස රඹුක්කන විවිධ සේවා සමුපකාර සමිතියට ගෙවීම් කිරිමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.යථාපරිදි කල් දී නොමැති යෝජනා**

**(ඊ).II.01**

රඹුක්කන ප්‍රාදේශීය සභා පරිශ්‍රයේ පිටුපස ඇති විදුලි මනු කුටියේ දොර පියන හා වැසි ආවරණය සකස් කර සවි කිරිම වෙනුවෙන්රු.62,717.06 ක මුදලක් මේඩේරිහේන,දොඹේමඩ පදිංචි කේ.ඒ.නිමන්ත මහතාට ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු62,717.06 ක මුදල මේඩේරිහේන,දොඹේමඩ පදිංචි කේ.ඒ.නිමන්ත මහතාට ගෙවීම කිරිමට තීරණය විය.

**(ඊ).II.02**

අත්‍යවශ්‍ය මහජන ඉල්ලීම් ඉටු කිරිම -2025 අදාළව ලද කාඩවට්ටිය ,වල්පොල වත්තේ ලක්ෂ්මන් ජයරත්න මහතාගේ නිවස අසල ආනන්ද මහතාගේ නිවස ඉදිරිපිට ඇති මාර්ගය සංවර්ධනය කිරිම සඳහා වන රු390,000.00 ක සංශෝධිත ඇස්තමේන්තුව අනුමත කිරිමට යෝජනා කරන අතර භාණ්ඩ,වැඩ,හා උපදේශන නොවන සේවා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2024 යටතේ යොමු අංක 3.1.9. අදාළ වැඩ කොන්ත්‍රාත්තු සඳහා ප්‍රජා සහභාගිත්වය ලබා ගෙන ඉටුකිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

මම මුලදී යෝජනා කළ ඇස්තමේන්තුව සංශෝධන කර යෝජනා කරන ඇස්තමේන්තුව තමා මේක බවත් සභාවේ විරුද්ධත්වයක් නොමැති බවද පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු390,000.00 ක සංශෝධිත ඇස්තමේන්තුව අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.03**

කොම්පෝස්ට් අංගනයේ පැරණි ගොඩනැගිල්ල යථාවත් කිරිම -රු1,600,000.00 ක සංශෝධිත ඇස්තමේන්තුව අනුමැතියට ඉදිරිපත් කරන අතර (ගස කඩා වැටිමෙන් සිදු වු හානිය සඳහා වන ඇස්තමේන්තුව) භාණ්ඩ,වැඩ,හා උපදේශන නොවන සේවා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2024 අදාළව යොමු අංක 3.1.9. අදාළ වැඩ කොන්ත්‍රාත්තු සඳහා ප්‍රජා සහභාගිත්වය ලබා ගෙන ඉටුකිරිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු1,600,000.00 ක සංශෝධිත ඇස්තමේන්තුව අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.04**
කොම්පෝස්ට් ව්‍යාපෘති භූමිය තුළ ගොඩගැසී ඇති කසල හල්පිටිය,ගෝනමඩිත්ත වත්තට බැහැර කිරීමේ දෙවන අදියර සඳහා අවශ්‍යව ඇති රු1,000,000.00 ප්‍රතිපාදන වෙන්කර ගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

කොම්පෝස්ට් ව්‍යාපෘතියේ ඇති කසල හල්පිටිය ප්‍රදේශයට බැහැර කිරීමට ලක්ෂ 5 ක් වියදම් කළා.තව ලක්ෂ 10 ක් වියදම් කිරීම අවශ්‍ය බැවින් එක අනුමත කිරීමට තමා යෝජනා කරන්නේ.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

කොම්පෝස්ට් ව්‍යාපෘති සඳහා රු1,000,000.00 ප්‍රතිපාදන වෙන් කිරීම තීරණය විය.

**(ඊ).II.05**
සභාවේ සේවාවන් පවත්වා ගෙන යාමට පහත තනතුරු සඳහා සේවා ගිවිසුම් මත බඳවා ගැනීමට යෝජනාවක් සකස් කිරීමට අනුමැතිය ලබා ගැනීමට ආණ්ඩුකාරතුමියට යැවිය යුතුය. ඒ බව යෝජනාවට ඇතුළත් කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

- රියදුරු - 01
- සෞඛ්‍ය කම්කරු - 02

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රියදුරෙකු සහ සෞඛ්‍ය කම්කරුවන් දෙදෙනෙකු ලබා ගැනීමට යෝජනාවට ඇතුළත් කිරීමට තීරණය විය.

**(ඊ).II.06**
පළාත් පාලන සතිය -2025 වෙනුවෙන් සකස් කරන ලද වැඩසටහන් විස්තරය හා දළ වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු143,500.00 ක දළ වියදම් ඇස්තමේන්තුව අනුමත කිරීම තීරණය විය.

**(ඊ).II.07**
ප්‍රා/සභාව වෙත අවශ්‍ය බිල් පොත් 500 ක් මුද්‍රණය කර සැපයීම වෙනුවෙන් Bhashitha Graphics රු149,500.00 ක මුදල ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු149,500.00 ක මුදල Bhashitha Graphics වෙත ගෙවීමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.08**

ප්‍රා/සභාවේ මන්ත්‍රී මණ්ඩලය සඳහා අවශ්‍ය නිල මුද්‍රා සකස් කර සැපයිම වෙනුවෙන් රු46,800.00 ක මුදල Bhashitha Graphics වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු46,800.00 ක මුදල Bhashitha Graphics වෙත ගෙවීමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.09**

2025.08.02 දින පැවැත්වීමට නියමිත මහ සභා රැස්වීම සඳහා අවශ්‍ය 2025.08.05 දින පැවැති මහ සභා වාර්තාව මුද්‍රණය කර සැපයිම වෙනුවෙන් Bhashitha Graphics වෙත රු5381.00 ක මුදල ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු5381.00 ක මුදල Bhashitha Graphics වෙත ගෙවීමට අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.10**

2025 වර්ෂයට මෙම සභාව සතු පහත සඳහන් කඩ කාමර අවස්ථා 3 දී ටෙන්ඩර් කළ ද කිසිවෙකුත් එම දේපල බදු ගැනිමට ඉදිරිපත් වුයේ නැත.ඒ සඳහා සුදුසු තීරණයක් ගැනිම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

1.පොදු වෙළඳපළ තුළ පිහිටි අං 33 ගව මස් කඩ කාමරය
2.පොදු වෙළඳපළ තුළ පිහිටි අං 38 කුකුළු මස් කඩ කාමරය
3.පොදු වෙළඳපළ තුළ පිහිටි අං 36 මාළු කඩ කාමරය
4.පොදු වෙළඳපළ තුළ පිහිටි අං 31 කුකුළු කඩ කාමරය
5.පොදු වෙළඳපළ තුළ පිහිටි අං 32 එළු කඩ කාමරය
6.පොදු වෙළඳපළ තුළ පිහිටි අං 34 එළු කඩ කාමරය

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

පොදු වෙළඳපළ තුළ පිහිටි මස්කඩ ටික යන්නේ නැත.දැන් තුන්වතාවක් ටෙන්ඩර් කළත් කිසිම කෙනෙකු අරගෙන නැත.මේ අවුරුද්දේ කවුරුවත් අර ගෙන ද නැත. මේකට මොකද ගන්න තීරණය මේ මේක ටෙන්ඩර් දීලා පවත්වාගෙන යනවද නැත්නම් වෙන කාට හරි දෙනවද?මොකද කලින් මතු කරපු කාරණාවට හා අපි අතුරු ව්‍යවස්ථාවක් මස් කඩ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් තිබෙනවා. ටෙන්ඩර් මුදලක් දීලා මස්කඩ කවුරුත් ගන්නේ නෑ. වෙළඳ බලත්‍රය අරගෙන තමයි කඩයක් පවත්වා ගන්නට පුළුවන්.මේක අපිට කරන්න පුළුවන් වෙයි කියලා හිතනවා. මොකද අතුරු ව්‍යවස්ථාවේ තිබෙන නිසා.අපිට අතුරු ව්‍යවස්ථාව භාර අරගෙන තිබෙන්නේ.ඒ අනුව තමා යන්නේ. අපි තිබෙන අමාරුම ප්‍රශ්නය හින්දා කඩ කාමර හය ජනවාරි සිට ටෙන්ඩර් කර මේක තීන්දුවක් ගන්න එක හොඳ බව ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

තක්සේරු මුදලට වඩා පහළ යන්න නොහැකිය.එතකොට ඊළඟ පහළට යන්නේ ටෙන්ඩර්ය.අපි අතුරු ව්‍යවස්ථාව අනුව ටෙන්ඩර් කරන්නේ නැත්නම් ඔය විදිහට යන්න වෙනවා. තක්සේරු මුදල ගන්නේ අවම ලංසුවටය.මේක කරගෙන යන්න නොහැකි නිසාත්,සභාවක් විදිහට මේකට නීති ප්‍රතිපාද නැති බැවින් පළමු පාර ටෙන්ඩර් කරලා නැත්නම් ඔය ආකාරයට යන්න වෙන බව පවසන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

තවම මාස තුනයි තියෙන්නේ.ඒ මාස තුනත් ගියාට පසුව කඩ කාමර ගැන සාච්ඡා කරමු. අතුරු ව්‍යවස්ථාව අනුව ගව මස් කඩ යන්නේ නැත. ඒක පොඩ්ඩක් වෙනම සාකච්ඡා කරලා තීන්දුවක් ගනිමු.ගවඝාතකාගාර ප්‍රශ්නය ගැන කතා කරන නිසා ඒ එක්කම මේක සම්බන්ධ කර ගනිමු. මන්ත්‍රීවරු කියන්න ගවඝාතකාගාරයේ ප්‍රශ්නය සමඟ මේක සාකච්ඡා කරනවද? කියලා. එහෙම නම් විරුද්ධත්වයක් නැති නිසා ගව ඝාතකාගාර ප්‍රශ්නය සමඟ යෝජනා කරන බවට ගරු සභාපතිතුමා විසින් පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

මෙම කඩ කාමර හය ගව ඝාතකාගාරයේ ප්‍රශ්නය සමඟ සාකච්ඡා කිරීමට තීරණය විය.

**(ඊ).II.11**

2025.09.15 වන දින බතඹුරය ක්‍රීඩාංගනය රඹුක්කන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි සංගමය (සුහද ක්‍රිකට් තරඟයක් සඳහා) නොමිලේ ඉල්ලුම් කර ඇත.එය ලබාදීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

බතඹුරය ක්‍රීඩාංගනය මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන්ගේ සුහද ක්‍රිකට් තරඟයක් සඳහා නොමිලේ ඉල්ලුම් කර තිබෙනවා.ඉල්ලීම් ලිපියක් ලබාදී ඇත.මෙම ක්‍රීඩාංගනය නොමිලේ ලබා දීම පිළිබඳ කාගේවත් විරුද්ධත්වයක් නොමැති නිසා එය ලබා දීමට තීරණය කරන බව සභාවට පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

2025.09.15 වන දින බතඹුරය ක්‍රීඩාංගනය නොමිලේ ලබා දීමට තීරණය විය.

**(ඊ).II.12**

කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙද වූ විශ්‍රාමික කාර්මික නිලධාරි K.A.S.D.කළුආරච්චි මයාගේ 2025 අගෝස්තු මස දීමනාව වන රු63,325.00 ක මුදල ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු63,325.00 ක මුදල ගෙවීමට තීරණය විය.

**(ඊ).II.13**

2025 අගෝස්තු මස සභික දීමනාව වන රු 570,000.00 ක මුදල ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

සභික දීමනා -රු566,000.00
අඩු කිරිම් එකතුව -රු4000.00

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු 570,000.00 ක මුදල ගෙවීමට තීරණය විය.

**(ඊ).II.14**

H.A.C.L.පියසේන මයාගේ රු208,340.00 ක ආපදා ණය මුදල ගෙවීම.
මෙම රියදුරු මහතා සම්බන්ධයෙන් මුලික විමර්ශන අවසන් කර ඇති බැවින් ආපදා ණය ගෙවීම් කටයුතු සඳහා බාධාවක් නොමැති බව පළාත් පාලන සහකාර කොමසාරිස්ගේ අංක ACK/S/16-4/2025.08.25 ලිපිය මගින් දන්වා ඇත.එය ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

- 40% සීමාව ඉක්මවා නැත.
- සේවක ණය ගිණුමේ ප්‍රමාණවත් මුදලක් පවති.
- ණය ගොනුව සම්පූර්ණ කර ඇත.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු208,340.00 ක ආපදා ණය මුදල H.A.C.L.පියසේන මයාට ගෙවීමට තීරණය විය.

**(ඊ).II.15**

ආදාහනාගාරය වෙත 37.5 kg ලිට්රෝ ගෑස් සිලින්ඩර් 06 ක් kegalle Distributors (pvt)Ltd.වෙතින් හා 37.5 kg ලාෆ් ගෑස් සිලින්ඩර් 06 ක් A.K.W.පුෂ්ප කුමාර,ලීලා ස්ටෝර්ස්,රඹුක්කන වෙතින් වෙළඳපල පවත්නා මිල ගණන් යටතේ මිල දී ගැනිමට හා ඒ සඳහා ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

❖ **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ.එස්.පී.කුමාර ධර්මසේන මැතිතුමා**

15 යෝජනාවේ පොඩි පැහැදිලි කිරිමක් කරන්න.පසුගිය මාසයේ ගෙවීමක් ද

❖ **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ආදාහනාගාරය සඳහා ගෑස් ලබා ගැනිම සඳහා ගෙවීමක් බව පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

A.K.W.පුෂ්ප කුමාර,ලීලා ස්ටෝර්ස්,රඹුක්කන වෙත රු105,420.00 ක මුදල ගෙවීමටත්, kegalle Distributors (pvt)Ltd වෙත රු105,420.00 ක මුදල ගෙවීමට තීරණය විය.

**(ඊ).II.16**

නාබිරිත්ත ,මුකලාන මාර්ගය සංවර්ධනය කිරිම (රු850,000.00) සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු850,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.17**

මොට්ටප්පුලිය බෝධිරාජාරාම මාවත දෙවන පටුමඟ සංවර්ධනය කිරිම (රු500,000.00) සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු500,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.18**

ඊ දැල්ලවත්ත සිට හරංගහතැන්න හරහා වල්ගම දක්වා මාර්ගය සංවර්ධනය කිරිම (රු370,000.00) සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු370,000.00 ක ඇස්තමේන්තුව අනුමත කිරිම තීරණය විය.

**(ඊ).II.19**

2024 වර්ෂයේ සභා අරමුදල් යටතේ ඉටුකළ රඹුක්කන අශෝක ක්‍රීඩාපිටි මණ්ඩපයේ අනාරක්ෂිත විවෘතය සඳහා ආරක්ෂිත දැලක් සවි කිරිම කර්මාන්තය සඳහා ගෙවිය යුතු 10% රඳවුම් මුදල් වන රු6464.11 ක මුදලක් සී/ස රඹුක්කන වි.සේ.ස.සමිතිය වෙත ගෙවීම සුදුසු බවට ගරු සභාපතිතුමා විසින් යෝජනා කළ අතර එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී.උපාලි රෝහණ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

තීරණය -

රු6464.11 ක රඳවුම් මුදල සී/ස රඹුක්කන වි.සේ.ස.සමිතිය වෙත ගෙවීමට අනුමත කිරිම තීරණය විය.

(උ).කාරක සභාවල වාර්තා සහ එම වාර්තා එවේලේම සලකා බැලීමට ප්‍රාදේශීය සභාව තීරණය කරන්නේ නම් මිස,ඒවා සලකා බැලීම සඳහා දිනයක් නියම කිරිම.

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

2025.07.18/2025.07.28/2025.08.19 යන දින වල පවත්වන ලද පරිසර හා පහසුකම් සැපයිමේ කාරක සභා වාර්තා පිළිගැනීම සුදුසු බවට ගරු සභාපතිතුමන් යෝජනා කළ අතර එම යෝජනාව ගරු උපසභාපතිතුමා විසින් ස්ථිර කරන ලදී

❖ **ගරු උපසභාපති ඊ.ඩී.ඒ.එස්.කරුණාරත්න මැතිතුමා**

පරිසර කමිටු වාර්තාවේ හතරවන පිටුවේ ඇමුණුම එක සහ දෙක කියලා යෝජනා දෙකක් ඇත. ඒකෙ පළමු යෝජනාව වන්නේ කසල කළමනාකරණය සඳහා පුහුණුව ලබාදීම හා ධනාත්මක චින්තනය පිළිබඳ විශේෂ පුහුණු වැඩසටහනක් ඒකට අදාළ ඇස්තමේන්තුව සකස් කරලා තිබෙනවා. දෙවැනි යෝජනාව මේ ආයතනයේ සිටින නිලධාරින්ට හා සෞඛ්‍ය සේවකයන් සඳහා සායනයක් කිරීම. ඒක අනුමත කර ගැනිම ඇමුණුම හතරේ දිනය සංශෝධනය කරගනිමු.යනුවෙන් පවසන ලදි.

අදාළ යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

තීරණය -

2025.07.18/2025.07.28/2025.08.19 යන දින වල පැවැත්වූ පරිසර හා පහසුකම් සැපයිමේ කාරක සභා වාර්තා පිළිගැනීම සුදුසු බවට තීරණය විය.

(ඌ).ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කළ යුතු වෙනත් ලේඛන ඉදිරිපත් කිරිම. හා සලකා බැලිම

| | ව්‍යාපෘති 1 | ව්‍යාපෘති 2 | ව්‍යාපෘති 3 | ව්‍යාපෘති 5 | ව්‍යාපෘති 6 | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 01. පුද්ගල පඩිනඩි | 4,311,668.65 | 1,855,747.87 | 1,695,703.55 | 59,633.00 | 424,790.00 | 8,347,543.07 |
| 02. ගමන් වියදම් | 22,210.32 | 5,738.18 | 6,900.59 | - | 1,440.00 | 36,289.09 |
| 03. සැපයුම් හා උපකරණ | 91,915.00 | 291,239.00 | 93,889.50 | 35,620.00 | 36,680.00 | 549,343.50 |
| 04. ප්‍රාග්ධන වත්කම් අළුත්වැඩියා හා නඩත්තු | 562,019.27 | 106,195.73 | 5,750.00 | 19,450.00 | 4,700.00 | 698,115.00 |
| 05. ප්‍රවාහන සම්බන්ධතා අවශ්‍යක සේවා හා වෙනත් සේවා | 495,014.99 | 874,419.61 | - | 112638.08 | 71,177.04 | 1,553,249.72 |
| 06. පොළී ගෙවීම් ලාබාංශ සහ ප්‍රසාද මුදල් | | | - | 0 | - | - |
| 07. ආධාර මුදල්, දායක මුදල් හා සහනාධාර | 7,600.00 | 20739.14 | - | 0 | - | 28,339.14 |
| 08. විශ්‍රාම වැටුප්, විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂික | 19,004.05 | | - | | | 19,004.05 |
| 09. නව උපකරණ වැය ඉඩම් සංවර්ධන හා ගොඩනැගිලි | | | | | | - |
| 10. පුනරුත්තාපන කටයුතු හා උපකරණ | | | | | | - |
| 11. ණය වාරික හා ආපසු ගෙවීම් | | | | | | - |
| එකතුව | **5,509,432.28** | **3,154,079.53** | **1,802,243.64** | **227,341.08** | **538,787.04** | **11,231,883.57** |

| | පොදු පරිපාලනය | සෞඛ්‍ය සේවා | භෞතික සැලසුම් හා මං මාවත් ඉඩම් ගොඩනැගිලි | වෙනත් උපයෝගී සේවා | සුභ සාධන සේවා | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| | 1 | 2 | 3 | 5 | 6 | |
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| 01 වැටුප් දීමනා | 4,311,668.65 | 1,855,747.87 | 1,695,703.55 | 59,633.00 | 424,790.00 | 8,347,543.07 |
| 02 ගමන් වියදම් | 22,210.32 | 5,738.18 | 6,900.59 | - | 1,440.00 | 36,289.09 |
| 03 සැපයුම් හා උපකරණ | 91,915.00 | 291,239.00 | 93,889.50 | 35,620.00 | 36,680.00 | 549,343.50 |
| 04 ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා හා නඩත්තුව | 562,019.27 | 106,195.73 | 5,750.00 | 19,450.00 | 4,700.00 | 698,115.00 |
| 05 ප්‍රවාහන සම්බන්ධතා හා අවශ්‍යතා හා වෙනත් සේවා | 495,014.99 | 874,419.61 | - | 112,638.08 | 71,177.04 | 1,553,249.72 |
| 06 පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් | | | - | - | - | - |
| 07 ආධාර මුදල් දායක මුදල් සහනාධාර | 7,600.00 | 20,739.14 | - | - | - | 28,339.14 |
| 08 විශ්‍රාම වැටුප් විශ්‍රාම ප්‍රතිලාභ හා පාරිතෝෂිත | 19,004.05 | | - | | | 19,004.05 |
| **පුනරාවර්තන වියදම් එකතුව** | | | | | | - |
| 09 ප්‍රාග්ධන වැය | | | | | | - |
| 10 ණය ආපසු ගෙවීම් | | | | | | - |
| **ප්‍රාග්ධන වැය එකතුව** | **5,509,432.28** | **3,154,079.53** | **1,802,243.64** | **227,341.08** | **538,787.04** | **11,231,883.57** |
| **පුනරාවර්තන වැය හා ප්‍රාග්ධන වියදම් වල මුළු එකතුව** | | | | | | |
| **සේවක ණය** | | | | | | |
| මහජන බැංකුව | 7,500.00 | | | | | 7,500.00 |
| ලංකා බැංකුව | 2,133,680.00 | | | | | 2,133,680.00 |
| ලංකා බැංකුව 8502324 | | | | | | - |
| තැන්පත් | 134,557.61 | | | | | 134,557.61 |
| විවිධ ණය හිමියෝ | 479,977.38 | | | | | 479,977.38 |
| ගබඩා ණය හිමියෝ | 661,101.80 | | | | | 661,101.80 |
| අත්තිකාරම් | 21,905.80 | | | | | 21,905.80 |
| සමුච්චිත අරමුදල | - | | | | | - |
| ආයෝජන | 26,800,000.00 | | | | | 26,800,000.00 |
| වෙනත් ගෙවීම් | - | | | | | - |
| **මුළු එකතුව** | **30,238,722.59** | **0.00** | **0.00** | **0.00** | **0.00** | **41,470,606.16** |

**වෙනත්**

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ජී.එල්.සරත් කුමාර මැතිතුමා**

රඹුක්කන ඩිපෝවෙන් 4.15 මාවනැල්ල දක්වා ධාවන වන බසය රථය විධිමත්ව ක්‍රියාත්මක වෙන්නෙ නැත.බස් එක සවසට 7.30 ට රඹුක්කනින් පිටත් වෙනවා 8.30 මාවනැල්ලෙන් එන්න ඕන. කොළඹ සිට වැඩ ඇරිලා එන අය 7.10 රඹුක්කන දුම්රිය පළට ළඟා වෙනවා. ඒ බස් එක තිබුනේ 7.30 මාවනැල්ල පාරේ. නමුත් මේ වන විට ක්‍රියාත්මක වෙන්නේ නැත.ඒ බස් එක තමා7.30 ගිහින්8.30 ට මාවනැල්ලෙන් එන අන්තිම බස් එක මඟියන් තමා කීවේ මේ ගැන කතා කරන්න කියලා. එක කථා කිරිමට ඉල්ලිමක් කරනවා. ඒ එක්ම කඩිගමුව දුම්රිය ස්ථානයේ මාර්ගය සංවර්ධනය කිරිම. ගරු ලේකම්තුමා හරහා මම ලියුමක් ඉදිරිපත් කරා ප්‍රාදේශීය සභාව පාරක් නිසා දුම්රිය මාර්ගය සංවර්ධනය කිරිම එම ලිපිය ලබා දුන්නේ 2024.12.08 ගරු ලේකම්තුමා ඒකේ ප්‍රතිඵලයක් හැටියට ලිපියක් ඉදිරිපත් කළා ප්‍රතිසංස්කරණය කරනවා. විධිමත් පරීක්ෂණයක් කරලා සිදු කිරිමටත් පවසන ලදි. දුම්රිය ස්ථානයේ මාර්ගය බොහොම අබලන්වෙලා තියෙන්නේ. අඩි 12 ක පාරක් දුම්රිය ස්ථානයේ පාර ඔබතුමා අවධානය යොමු කරලා සංවර්ධන කමිටුවට දාලා කරනවා නම් හොඳ බව පවසන ලදි.

- **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.පී.ආර්.අනුර පියරත්න මැතිතුමා**

සභාපතිතුමා,අඩි 12 ක් කොන්ක්‍රීට් කරලා,කාණු පද්ධතිය අංග සම්පූර්ණය හා ජල ටැංකිය තිබෙනවා. නමුත් මාර්ගය අබලන් වුණේ පාරට ඔරොත්තු නොදෙන වාහන වන බැකෝ වැනි ඒවා ගමන් කරපු නිසා. ඔබතුමා මතු කරපු එක හොඳයි. ඒක ඇත්තටම අබලන් තත්ත්වයේ තිබෙන බව පවසන ලදි.

- **ගරු සභාපති ආර්.එම්.එස්.එස්.බී.රත්නායක මැතිතුමා**

ඒ ව්‍යාපෘතියේ කළමනාකරණය මුණගැහුණා. ව්‍යාපෘතිය දෙක ලැබුණට පසුව හදලා දෙන බව සඳහන් කළා. ඇස්තමේන්තු පරක්කු වුණු නිසා. කිරිම නොහැකි විය.ඒක හදලා දෙන බවට පවසන ලදි.

අවසානය

අද දින සභාවේ වැඩ කටයුතු සාර්ථක කර ගැනිමට සහය ලබා දුන් ආණ්ඩුපක්ෂයේ ගරු උපසභාපතිතුමා ප්‍රමුඛ පක්ෂ විපක්ෂ ගරු මන්ත්‍රීවරුන් ,ගරු මන්ත්‍රීවරියන්ටත් සභාවේ ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්,මාධ්‍ය වේදීන්ටත් ස්තූතිය පුද කරමින් සභාවේ වැඩ කටයුතු ප.ව 3.28 ට පමණ අවසන් කරන ලදි.

ආර්.එම්.එස්.එස්.බී.රත්නායක
සභාපති,
රඹුක්කන ප්‍රාදේශීය සභාව,